# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2127/15 - 2019 ජූනි මස 12 වැනි බදාදා - 2019.06.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමත කරන ලද යාවත්කාලීන කළ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම - 2050 ප්‍රකාශයට පත් කිරීම**

මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 5(අ) හා (ආ) වගන්ති යටතේ යාවත්කාලීන කළ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම - 2050, එකී පනතේ 4(අ) වගන්තිය යටතේ ජාතික භෞතික නිර්මාණ සභාව විසින් 2019.02.26 දින අනුමත කරන ලද බැවින් එම සැලැස්ම මහජනතාවගේ දැන ගැනීම පිණිස මෙසේ ප්‍රකාශයට පත්කරමි.

පාඨලී චම්පික රණවක,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 01 වැනි දින,
සුහුරුපාය,ච
බත්තරමුල්ල,
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

යාවත්කාලීන කළ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම - 2050

**2017.07.03 හා 2011.11.09 දිනයන්හි ජාතික භෞතික නිර්මාණ සභාව විසින් අනුමත කරන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලැස්ම - 2030 ඇසුරිණි**

2000 අංක 49 දරන නගර හා ග්‍රාම නිර්මාණ (සංශෝධන) පනතේ 5 හේ (බී) වගන්තියට අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලතල යටතේ මෙම වාර්තාව සකස් කරන ලදී. එකී පනතේ 4 බී (සී) වගන්තිය අනුව 2017.09.07 දින අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව විසින් නිර්දේශ කරන ලදුව, පනතෙහි 3 (4ඒ) වගන්තිය අනුව, අතිගරු ජනාධිපතිතුමාගේ සභාපතිත්වයෙන් යුත් ජාතික භෞතික නිර්මාණ සභාව විසින් 2019 පෙබරවාරි 26 දින අනුමත කරන ලදී.

ආචාර්ය ජගත් මුණසිංහ,
අධ්‍යක්ෂ ජනරාල්.

ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,
පස්වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

*ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලසුම - 2050*

**1.0 දැක්ම හා අභිමතාර්ථ**

**1.1 පසුබිම**

ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය යාවත්කාලීන කිරීම 1946 අංක 13 හා 2000 අංක 49 මගින් සංශෝධිත නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ දක්වන ක්‍රියාවලිය අනුව සිදුකරන ලදී. ඒ සඳහා මූලික අධ්‍යනයන් මාලාවක් සමගම විශේෂඥයන්, සංවර්ධන ආයතනයන්, පාර්ශවකරුවන් හා අභිරුචික කණ්ඩායම් වල උපදේශකත්වයන් ද ලබා ගනු ලැබිණ.

**1.2 කාලසීමාව**

කාලසීමාව

සැලසුම සඳහා යෝජනා කරනු ලබන කාල සීමාවන් පහත පරිදි වේ.

1. කෙටි කාලීන කාලසීමාව : සැලසුම් කණ්ඩායම නුදුරු අනාගතයේ දී දකින පස් අවුරුදු කාල සීමාව (2020 - 2025) මෙයට අයත් වේ. වර්තමාන සංවර්ධන උපනතීන්, වත්මන් රජය විසින් අනුගමනය කරන ලද ප්‍රතිපත්ති හා ඒවායේ ප්‍රතිඵල, දැනටමත් ක්‍රියාත්මක කර ඇති සංවර්ධන ව්‍යාපෘතීන් මගින් භෞතික හා සමාජ පරිසරයට ඇති කරනු ලබන ප්‍රධාන බලපෑම් මෙම කාලසීමාව තුළ යෝජනාවලිය සඳහා සලකා බලනු ලබන මූලික සාධකයන් වේ.

2. මධ්‍ය කාලීන කාලසීමාව :සැලසුම් කණ්ඩායම යම් නිශ්චිතතාවයකින් යුතුව දකින ඉදිරි අවුරුදු 10ත් 15ත් (2030) අතර කාලය මෙයට අයත් වේ. ජීවන තත්වයේ වර්ධනය වන ගුණාත්මක බව හා සමාජ තත්වයන්හි වෙනස්වීම, දේශීය හා විදේශීය වශයෙන් දේශපාලනිකව සිදුවිය හැකි වෙනස්කම්, රටේ සම්පූර්ණ සංවර්ධන දැක්ම වෙනස්, වන තාක්ෂණික විකාශනය හා එම විකාශනයන්ගේ ප්‍රතිඵල මෙම කාලසීමාව තුළ යෝජනාවලිය සඳහා සලකා බලනු ලබන මූලික සාධකයන් වේ.

3. දීර්ඝ කාලීන කාලසීමාව : වත්මන් සැලසුම් සංකල්පනාවන්ගේ දැක්මෙන් ඔබ්බට වන අවුරුදු 25 - 30 (2050) අතර කාල සීමාව මෙයට අයත් වේ. සංරක්ෂණය කිරීමට අවශ්‍ය හරවත් වටිනාකම්, නොවෙනස්ව පවතින අපේක්ෂාවන් හා ඕනෑම පිරිවැයක් දැරීමෙන් ඉටුකරගැනීමට අත්‍යවශ්‍යවන්නා වූ අරමුණු මෙම කාල සීමාවේ දී සලකා බලන යෝජනාවලිය සඳහා ඉවහල් කර ගන්නා ලදී.

දැක්ම

**1.3 දැක්ම**

**සුනිත සුබල සුහුරු දැයක්**
**සුසැදි සුරැකි සොඳුරු බිමක්**

*நேர்த்தியான வளம் பொருந்திய திறன்மிகு நாட்டிற்கான*
*நிலையான தன்னிகரற்ற திட்டமிடப்பட்ட தேசம்*

**Mannered, Geared and Smart Nation**
**in a Planned, Sustained and Adored Land**

1. සුසැදි (Planned) (ස්ථිරසාර වූ ආර්ථික වර්ධනයකට, සමාජ සුභසාධනයේ අවිච්ඡින්නතාවයට හා භෞතික, සමාජීය, ආර්ථික හා පාරිසරික සම්පත්වල ප්‍රශස්ත උපයෝගීතාවය සඳහා පහසුකම් සපයන සැලසුම් සහගත නිර්මිත පරිසරය)

2. සුරැකි (Sustained) (භූමිය, සාගරය, ජලය, මානව, වනජීවී හා දිවයිනේ ඇති අනෙකුත් සම්පත්වලතිරසර භාවිතය හා අනාගත සුරක්ෂිත භාවය සහතික කරන ආකාරයේ සංවර්ධන ක්‍රමෝපායන්)

3. සොඳුරු (Adored) (අනන්‍ය භෞතික ලක්ෂණ හා සාමාජීය සංස්කෘතික විද්‍යාමානයන් නව සංවර්ධනය තුළ රඳවා තබාගැනීම මගින් සිත් ආකර්ෂණය කරන භූමිය)

4. සුනීත (Mannered) (විනයානුකූල සාමය හා සහජීවනයෙන් යුත් ජනතාවක් සඳහා සුදුසු වාතාවරණයක් සලසන වටපිටාව)

5. සුබල (Geared) (සෞඛ්‍ය, ධනය (රැකීරක්ෂාවන්), දැනුම (අධ්‍යාපනය), කුසලතා (පුහුණුවීම්) හා බලය (සාධාරණත්වය) වැඩිදියුණු කරගැනීම සඳහා අවස්ථාවන් සලසන පරිසරය)

6. සුහුරු (Smart) (තාක්ෂණික නිපුණතාවයට සහ හුරුබුහුටි භාවිතයන්ට මග සකසන පරිසරය)

### 1.4 මූලික අරමුණ

යෝජිත සැලසුමේ සමස්ථ අරමුණ ලෙස ඉදිරි දශකය තුළ හා ඉන් පසුව ද ශ්‍රී ලංකාවට සුහුරු දැයක් හා ලෝකයේ තරඟකාරී ආර්ථිකයක් බවට පත්වීමට භෞතික පරිසර පහසුකම් සලසන පරිදි ද භූමියේ, රටවැසියන්ගේ හා සාගරයේ පවතින හා ගවේශනය නොකරන ලද සම්පත්වල ප්‍රශස්ත හා තිරසර භාවිතය තහවුරුකිරීම ද භූගෝලීය වශයෙන් ලෝකයේ උපායමාර්ගික ස්ථානයක පිහිටීමේ විභවතාවය උකහාගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය සැපයීම ද දැක්විය හැක. ප්‍රතිපත්තියේ මූලික අරමුණ

### 1.5 අභිමතාර්ථ

#### 1.5.1 කෙටි කාලීන අභිමතාර්ථ (2020-25)

මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන අභිමතාර්ථ කරා ළඟාවීමට පහසුකම් සැපයීම උදෙසා මෙම අභිමතාර්ථ ඉදිරි වසර 5-10ත් අතර ලඟා කරගත යුතු වේ.

(අ) ශ්‍රී ලාංකිකයන් සඳහා වැඩි රැකියා අවස්ථාවන් හා ව්‍යාපාරික අවස්ථා ලබාදෙන හා සංවර්ධනය සඳහා දේශීය මෙන්ම විදේශ ආයෝජන ආකර්ශනය කරගත හැකි **අවහිරයන්ගෙන් තොර ආර්ථික වර්ධනයකට** පහසුකම් සපයන අවකාශීය ව්‍යුහයක්

(ආ) දිවයිනේ භූ දර්ශනයන්ගේ අනන්‍යතාව අනුව පවතින භූමියේ හා **පවතින යටිතල පහසුකම් වල ඉහළ උපයෝගීතාවය හා කාර්යක්ෂම භාවිතය ප්‍රවර්ධනයට** හා සංවර්ධනයට මග පෙන්වීමක්

(ඇ) භූමිය, ජලය හා අනෙකුත් සම්පත්, ස්වභාවික පරිසර පද්ධති, සංස්කෘතික පරිසරය හා රටවැසියන්ගේ සම්ප්‍රදායන්වල තිරසර බව ආරක්ෂාකරන නියාමන රාමුවක්

#### 1.5.2 මධ්‍ය කාලීන අභිමතාර්ථ (2025-30)

දීර්ඝකාලීන පරාසයක් ඇති මෙම අභිමතාර්ථ, ඉදිරි වසර 10-15 අතර කාලය තුළදී පූර්ණ වශයෙන් ලඟා කරගැනීමට බලාපොරොත්තු වේ.

(අ) ජාතික ආර්ථිකය සාම්ප්‍රදායික කර්මාන්තයන්ගේ සිට **පූර්ණ තාක්ෂණික හා නවෝත්පාදන පදනමකින්** යුත් කර්මාන්ත බවට පරිවර්තනය කිරීම සඳහා හා ජාත්‍යන්තර වෙළඳාම වැඩිකිරීම සඳහා අවකාශ සැලසීමක්

(ආ) භූමිය, සාගරය, පිහිටීම හා රටවැසියන් තුළ ඇති හැකියාවන් මෙන්ම **නව අවස්ථාවන්** හා **භාවිත නොකරන ලද සම්පත් ගවේශන ප්‍රවර්ධනය** සිදුකරන සංවර්ධනයක්.

(ඇ) ආයෝජන හා වෙළඳාම් සඳහා ආකර්ශනය වැඩිකිරීමට උපකාරීවන භෞතික පරිසරයක්

#### 1.5.3 දිගු කාලීන අභිමතාර්ථ (2050)

දිගු කාලීන අභිමතාර්ථ මෙම සැලසුමේ කාලසීමාවෙන් ඔබ්බට පවා ගමන්කරන කරන අතර එහි වලංගු භාවය සර්ව කාලීන ලෙස සැලකිය හැකි වේ.

(අ) කෘෂිකර්මාන්තය, සාම්ප්‍රදායික කර්මාන්ත, සංස්කෘතික භූ දර්ශනයන් හා ක්‍රියාකාරීත්වයන් ආරක්ෂා කරගනිමින් භූමිය, ජලය, සාගරය හා දිවයිනේ ඇති අනෙකුත් සම්පත්වල තිරසර භාවිතයක්.

(ආ) දේශගුණික විපර්යාසයන්ට හා ස්වභාවික උවදුරු වල බලපෑම සඳහා ඵලදායි ප්‍රතිචාරාත්මක සංවර්ධනයක්

(ඇ) දිවයින පුරා වෙසෙන සියලු දෙනාට සියලු සම්පත් සඳහා සාධාරණ හා සමාන අවස්ථා මෙන්ම ප්‍රවේශකත්වයක් ලබාදෙන සමබර සංවර්ධනයක්

සාමාන්‍ය ප්‍රතිපත්ති

**1.6 මඟපෙන්වීම් ප්‍රතිපත්ති**

අභිමත සංවර්ධන දැක්ම තුළ උක්ත සඳහන් අභිමතාර්ථ ඉටුකරගැනීම සඳහා පවතින හා දැකිය හැකි අනාගත තත්වයන් පාදක කොටගනිමින් සිදු කරන ලද මූලික අධ්‍යනයන්ගේ සොයා ගැනීම් මත ගොඩනගන ලද පහත සඳහන් මාර්ගෝපදේශ ප්‍රතිපත්ති අනුගමනය කරමින් 2050 භෞතික සැලසුම සකස්කරන ලදි.

සංරක්ෂණ ප්‍රදේශ

**1.6.1 සංවේදී, සුවිශේෂී හා අනන්‍ය භූමි ලක්‍ෂණ සංරක්‍ෂණය කිරීම**

දිවයින පුරා අනාගත භෞතික සංවර්ධනයට අවශ්‍ය වන්නාවූ සහාය ශ්‍රී ලංකාවේ ස්වභාවික පරිසර පද්ධති, ජල සම්පත හා මෙරටට අනන්‍ය භූ දර්ශන යනාදියෙන් වැඩි වශයෙන් ලබාගත හැකිය. එවැනි සංවර්ධන කටයුතු සඳහා විකල්ප ඉංජිනේරුමය විසඳුම් ලබාදීම වඩාත් වියදම්කාරී වනු ඇත. එනිසාවෙන් පවතින පරිසර පද්ධති හා ඒවායේ භෞතික පිහිටීම උපාය මාර්ගික වශයෙන් සංරක්‍ෂණය කිරීම හා වැඩිදියුණු කිරීම භෞතික මෙන්ම තිරසර ආර්ථික සංවර්ධනයකට ඉතා වැදගත් වේ.

එසේම මානව ක්‍රියාකාරීත්වයන් හේතුකොටගෙන ඉදිරියට එමින් පවතින හා පුරෝකථනය කර ඇති දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම් මෙන්ම නුදුටු ව්‍යවසන තත්වයන් සඳහා අවශ්‍ය වන්නාවූ පූර්ව ආරක්‍ෂක ක්‍රියාමාර්ගයන් නොගතහොත් ශ්‍රී ලංකාවේ ආර්ථික හා භෞතික සංවර්ධනයට දැඩි බලපෑමක් එල්ල වනු ඇත. වෙරළබඩ කලාපය හා මධ්‍යම අධිසංවේදී ප්‍රදේශය වැනි අවදානම් පරිසර තත්වයන් මේ සඳහා වැඩි සංවේදීතාවයක් දක්වයි.

තවද දිවයිනේ තිබෙන ආර්ථික වටිනාකමකින් යුත් බොහෝ අනන්‍ය හා ආකර්ශනීය ස්ථාන මෙරට සංස්කෘතියේ හා සම්ප්‍රදායන් හි සළකුණු ලෙස ක්‍රියා කරනු ලබයි. නොසැලකිලිමත් බව, අධික උපයෝජනයන් හා විනාශකිරීම් හේතුකොටගෙන මෙවැනි ස්ථාන හායනයට පත්වීම වැඩිවී ඇත. මෙවැනි පිහිටීම් ආරක්‍ෂාකර ගැනීම තිරසර ආර්ථික හා සමාජ සංස්කෘතික සංවර්ධනයක් සඳහා අත්‍යවශ්‍ය වේ. එබැවින් ශ්‍රී ලංකාවේ අනාගත සංවර්ධන සැලසුම් කිරීමේදී වැදගත් පරිසර පද්ධතීන්, සංවේදී ප්‍රදේශ හා භූමියේ අනන්‍යතාවයන් සංරක්‍ෂණය අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ප්‍රතිපත්තියක් වශයෙන් යෝජනා කරනු ලැබේ.

මෙම අවධානය අවශ්‍ය ප්‍රදේශ රූපසටහන් 1.1 මඟින් දක්වා ඇත.

මානව ජනාවාස සඳහා යෝග්‍ය ප්‍රදේශ

**1.6.2 ජීවනෝචිත ප්‍රදේශයන්හි මානව ජනාවාස ප්‍රවර්ධනය කිරීම**

සංවර්ධනය දිගු කාලීන වශයෙන් තිරසාරව පවත්වාගෙන යාම අපේක්‍ෂා කළ හැක්කේ, එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සකස් කරන ලද බොහෝ දර්ශක මඟින් පෙන්වන ඉහළ ජීවන තත්වයක් බුක්ති විඳින නිරෝගී ජාතියක් සමඟින් පමණකි. ජීවනෝචිත බව ඉහළ නංවන භෞතික පරිසරයේ ඇති ගුණාත්මක භාවය මෙහි ලා වැදගත් සාධකයක් වේ.


ජීවත් වීමට සුදුසු භෞතික පරිසරයක් නොයෙකුත් ආකාරයන්ගෙන් සපුරාගත හැකි නමුත් භූගෝලීය හා කාලගුණික තත්වයන් මේ සඳහා වැඩි දායකත්වයක් සපයනු ලැබේ. මානව ජනාවාස සඳහා උපකාරීවන බොහෝ සාධක අතරින් වායුගෝලීය උෂ්ණත්වය, ආර්ද්‍රතා මට්ටම, වර්ෂාපතනය, ස්වභාවික විපත් වලින් හා වන සතුන්ගේ ආක්‍රමණ වලින් තොර භූමිය, ඉතා වැදගත් සාධක ලෙස සැලකේ. පහසුවෙන් ප්‍රවේශ විය හැකි මාර්ග, ජල සම්පාදනය හා විදුලිය වැනි භෞතික යටිතල පහසුකම් මෙන්ම පාසල් හා රෝහල් වැනි සමාජ යටිතල පහසුකම් ද ජීවත්වීමට සුදුසු පරිසරයකට ඇති අවශ්‍යතා ලෙස සලකනු ලැබේ.

මිනිසුන්ගේ විශේෂ සංස්කෘතික ලක්‍ෂණයක් ලෙස සැලකෙන ස්වභාව දහම (තුරුලතා හා සතුන්) සමඟ සහජීවනයෙන් ජීවත්වීම ද ජීවනෝචිත භෞතික පරිසරය යනුවෙන් අදහස් කෙරේ.


ශ්‍රී ලංකාවේ අනාගත භෞතික සැලසුම්කරණ ප්‍රතිපත්තියක් ලෙස අනාගත ජනාවාස සංවර්ධනය සඳහා උක්ත සඳහන් ජීවත් වීමට වඩා සුදුසු තත්වයන්ගෙන් යුත් ප්‍රදේශ තෝරා ගැනීමට යෝජනා කරනු ලැබේ.

මානව ජනාවාස වඩාත් යෝග්‍ය ප්‍රදේශ රූපසටහන් 1.2 මඟින් දක්වා තිබේ.

රූපසටහන් 1.1 : සංරක්ෂණ ප්‍රදේශ (සංවේදීතාවය හේතුවෙන් සංරක්ෂණය කළ යුතු ප්‍රදේශ)



රූපසටහන් 1.2: ජීවත්වීමට සුදුසු ප්‍රදේශ (ජීවත්වීම සඳහා පාරිසරික වශයෙන් සුදුසු ප්‍රදේශ )




### 1.6.3 සම්පත් 'විභවතාවයන් ' ගවේශනය හා භාවිතය 'නඟාසිටුවීම'

සම්පත් විභවතාවයන්

ශ්‍රී ලංකාව සතු සම්පත් විභවතාවයන්ගෙන් තවමත් උපරිම ප්‍රයෝජන ගෙන නොමැති බව පැහැදිලි කරුණකි. ඉන්දියන් සාගරයේ ඇති වර්ග කිලෝමීටර් 250,000ට වඩා ප්‍රමාණයකින් යුත් ශ්‍රී ලංකාවේ අනන්‍ය ආර්ථික කලාපය එවැනි එක් සම්පතක් වෙයි. මත්ස්‍ය සම්පත හා ඛණිජ සම්පත් කිහිපයක් හැරුණු කොට මෙහි ඇති අනෙතුත් සියලු සම්පත් තවමත් භුක්ති නොවිඳ පවතී. සුළං, මුහුදු රළ, ඛණිජ තෙල් හා ගෑස් නිධි ආදී සාගරය ආශ්‍රිතව ඇති අනෙකුත් බොහෝ සම්පත් පිළිබඳව ද මෙතෙක් ප්‍රමාණවත් පරිදි ගවේශනය කර නොමැත.

**රූපසටහන් 1.3: ගවේශණාත්මක ප්‍රදේශ (අවකාශයන් සපයන ගවේශණාත්මක සහ උසස් තත්ත්වයෙන් යුත් ප්‍රදේශ)**



එමෙන්ම රට අභ්‍යන්තරයේ ඇති සංචාරක ආකර්ශන ස්ථාන ද සැලසුම් සහගතව ප්‍රවර්ධනය කිරීමට අවශ්‍යය. ජනප්‍රිය නැරඹුම් ස්ථාන හැරුණුකොට දිවයිනේ අනෙකුත් බොහෝ ආකර්ශනීය ස්ථාන පිළිබඳව ඇති දැනුවත් භාවය ද ඉතා අඩු මට්ටමක පවතී.

මානව සම්පත (විශේෂයෙන්ම විවිධ හැකියාවන්ගෙන් හා අධ්‍යාපන මට්ටමින් ඉහළ තරුණ ශ්‍රම බලකාය) තිරසර සංවර්ධනයක් සඳහා සලකා බැලිය හැකි තවත් එක් සම්පතක් වේ. ජනගහන විද්‍යාඥයින්ට අනුව ජනගහනයේ ඇති ප්‍රතිලාභ සුදුසු කාලයේදී ලබාගැනීමට යොමු නොවුන හොත් එය ශ්‍රී ලංකාවට කලාපීය වශයෙන් ඇති තවත් එක් තරඟකාරී වාසි සහගත අවස්ථාවක් මඟහැරගැනීමක් වනු ඇත. මෙවැනි සම්පත් දැනට රැඳී ඇති ප්‍රදේශ ගවේශනයත් එම සම්පත වඩා යෝග්‍ය ස්ථාන කරා ආකර්ශනය කරගැනීමත් අනාගත සංවර්ධනය සඳහා වැදගත් වේ.

අන්තර් ජාතික තරඟකරුවන් හා සමව සැමදා දියුණුවට පත්වන තාක්‍ෂණික නවෝත්පාදනයන් ද ඇතුලත්කරගැනීමට ද අවශ්‍යව ඇත.

මේ අනුව අනාගත භෞතික සංවර්ධනයේදී භාවිත නොකරන ලද සම්පත් හා පවතින සම්පත් විභවතාවයන් උකහාගැනීමට හා නඟාසිටුවීමට උපරිම අවස්ථාවන් සැපයීම ප්‍රතිපත්තියක් වශයෙන් යෝජනා කරනු ලැබේ. මෙම විභව ප්‍රදේශ රූපසටහන් 1.3 මඟින් දක්වා තිබේ.

**1.6.4 පවතින සම්පත්වල ප්‍රශස්ත උපයෝගීතාවය**

පවතින සම්පත්වල ප්‍රශස්ත උපයෝගීතාවය පවතින ප්‍රදේශ

ණය ගෙවීම් අවශ්‍යතා හා ඉදිරි අවුරුදු 10 කාලය තුළදී ප්‍රමුඛතා අංශ වල සිදුවිය යුතු ආසන්නතම වැඩිදියුණු කිරීම් පිළිබඳව පවතින තොරතුරු වලට අනුව ශ්‍රී ලංකාව අනාගත සංවර්ධනය මෙහෙයවිය යුත්තේ බොහෝ බාධක සමඟ ය. තවද අත්‍යවශ්‍යතාවයක් නොමැති නම් තවදුරටත් මහා පරිමාණ යටිතල පහසුකම් මත අධික වශයෙන් ආයෝජනය කිරීම ජාතික ආර්ථිකයට හිතකර නොවනු ඇත. උක්ත තත්වයන්ට අමතරව එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අභිමතාර්ථ වල දක්වා ඇති පරිදි යටිතල පහසුකම් හා ස්වභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීමට ද අවශ්‍ය වේ.

මේ අනුව ආර්ථිකයට තවත් අමතර බරක් රදවමින් නව යටිතල පහසුකම් මත ආයෝජනය කරනු වෙනුවට පවතින සම්පත් හා භෞතික හා සමාජීය යටිතල පහසුකම්හි ප්‍රශස්ත භාවිතාව හා සංවර්ධන අවශ්‍යතාවන් ප්‍රමුඛත්වය අනුව පෙළගස්වා ගැනීම ද අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. මේ සඳහා දේශීය වශයෙන් නවෝත්පාදනයන් මත ප්‍රමාණවත් ආයෝජන සිදුකිරීම මඟින් ලොව වටා මතුවෙන තාක්‍ෂණය පහසුවෙන් වැළඳගැනීමට ශ්‍රී ලංකාවට හැකිවනු ඇත.

මෙම තත්වයන් මත අනාගත භෞතික සංවර්ධනයේ මාර්ගෝපදේශ ප්‍රතිපත්තික් ලෙස පවතින සම්පත්වල හා යටිතල පහසුකම් වල උපරිම උපයෝජනය අත්‍යවශයෙන් කළයුතුවීම යෝජනා කරනු ලැබේ. උපයෝගිතාවයෙන් ඉහළ වර්ගකළ ප්‍රදේශ රූපසටහන් 1.4 මඟින් දක්වා තිබේ.

**2. 2050 ජාතික භෞතික සැලසුම**

සැලසුම


**2.1 භෞතික වින්‍යාසය**

**2.1.1 අරමුණු**


ඉහත 1.6 කොටස මඟින් දක්වන ලද මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හතර (4) අනුව, ශ්‍රී ලංකාවට (රජයට) භූගෝලීය වශයෙන් හා අංශික සමබරතාවයකින් යුත් සංවර්ධනයක් සමඟ මෙරට වැසියන්ට මෙන්ම අන් අයට ද මනකල් හා සොඳුරු බවකින් යුක්ත වූ මනා ලෙස සැලසුම් වූ, තිරසර භෞතික පරිසරයක් ලඟා කරගැනීමට හැකි උපාය මාර්ගික සංවර්ධන මාර්ගයක් සැපයීම යෝජිත භෞතික වින්‍යාසයේ (proposed spatial structure) අභිමත අරමුණ වේ.

තවද මෙම සැලසුම හා එමගින් යෝජනා කරනු ලබන භෞතික වින්‍යාසය ස්ථාවර හා සම්ප්‍රදායික ස්ථිතික සැලසුමකට වඩා උක්ත 1.6 කොටස මඟින් දක්වන මාර්ගෝපදේශ ප්‍රතිපත්ති අනුව අනාගත ආර්ථික හා සමාජීය සංවර්ධන අවශ්‍යතාවයන්ට හා ඉස්මතුවන තත්වයන්ට ප්‍රතිචාර දක්වන්නාවූ ගතිකව විකාශනය වන භෞතික සංසිද්ධි මාලාවක් ලෙස දැකිය යුතුය.

**රූපසටහන් 1.4: උසස් මෙන්ම ඉහළ උපයෝගීතාවයෙන් යුත් ප්‍රදේශ (සංවර්ධන විභවතාවයන් සහිත ප්‍රදේශ)**



**රූපසටහන් 2 : යෝජිත භෞතික වින්‍යාසය**




සැකසුම- ජාතික භෞතික සැළසුම් දෙපාර්තමේන්තුව

**2.1.2 යෝජිත භෞතික ව්‍යූහය**

යෝජිත භෞතික ව්‍යූහය **02 රූපසටහන** මඟින් නිරූපනය කරන අතර එම භෞතික ව්‍යූහය 1.2 කොටස මඟින් දක්වා ඇති කාලසීමා තුනෙහිදී විවිධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධානයන් හා පුද්ගලයන් විසින් විවිධ භූමියන්හි අනාගත භෞතික සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය, නියාමනය හා සම්බන්ධීකරණය කරන පුළුල් වූ මාර්ගෝපදේශයක් ලෙසින් වටහා ගත යුතු වේ. එසේම මෙම වාර්තාවෙහි ඉදිරියට දැක්වෙන උප පරිච්ඡේද මඟින් ඉදිරිපත් කරනු ලබන ආංශික උපාය මාර්ගවලින් අනාගත භෞතික සංවර්ධන රටාව සඳහා සහයතාව දැක්වීම, පවතින සම්පත් වලින් උචිතම ප්‍රයෝජන ලබාගැනීම සේම සංවේදීතාවය හා සංරක්ෂණ අවශ්‍යතාවය මත අවම භෞතික සංවර්ධන මැදිහත්කමක් අවශ්‍ය වන ස්ථාන පිළිබඳව ඉස්මතු කර දක්වනු ලැබේ.

ඒ අනුව මෙම ක්‍රමෝපාය මඟින් ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ඉලක්ක සපුරාගැනීම සඳහා නේවාසික, කාර්මික, වාණිජ හා අනෙකුත් ඉඩම් භාවිතයන් සඳහා වඩාත් සුදුසු හා වාසිසහගත ස්ථාන හඳුනාගනු ලැබේ.

උක්ත අරමුණ ඉටුකරගැනීම සඳහා දිවයිනේ සමස්ත ඉඩම් භාවිතයන් 2050 දී රූපසටහන මඟින් නිරූපනය කරන ලෙසට පරිවර්තනය වෙතැයි අපේක්ෂා කෙරේ. මෙම ආකෘතිය සකස්කිරීම සඳහා මේ පිළිබඳව සිදුකර ඇති සවිස්තරාත්මක අධ්‍යනයන්ගේ සොයාගැනීම් හා 1.6 කොටසේ දක්වා ඇති උපාය මාර්ගික ප්‍රතිපත්ති පාදක කොට ගෙන තිබේ.

මේ අනුව භෞතික සංවර්ධනයේ ප්‍රමුඛ කොටසක් උපාය මාර්ගික වශයෙන් වාසි අත්කර ගැනීමට මූලික ආයෝජන සිදුකිරීමට සුදුසු යැයි හඳුනාගෙන ඇති නාගරික ජාල 04කට, විසල් නාගරිකයන් 02කට හා ප්‍රධාන නගර 09කට සංකේන්ද්‍ර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ආසන්න වශයෙන් දිවයිනේ තුනෙන් එකක භූමි ප්‍රමාණයක පැතිර ඇති මධ්‍ය අධිසංවේදී ප්‍රදේශය, වෙරළ සංරක්ෂණ කලාපය, කෘෂිකාර්මික, වනාන්තර හා පරිසර පද්ධති ප්‍රදේශ සඳහා ද සමාන සංරක්ෂණ අවධානයක් යොමුවිය යුතු අතර එම ප්‍රදේශ මහා පරිමාණ භෞතික සංවර්ධන කටයුතු වලින් තොර විය යුතු වේ.

**2.1.3 මධ්‍ය අධිසංවේදී ප්‍රදේශය**

මධ්‍ය අධිසංවේදී ප්‍රදේශය


මධ්‍ය අධිසංවේදී ප්‍රදේශය සංවේදී ප්‍රදේශය **රූපසටහන් අංක 03 න්** නිරූපනය කෙරේ. එම ප්‍රදේශය ස්වභාවික පරිසර පද්ධතීන් ගෙන් යුත් භූමියකින් සමන්විත වන අතර නාය යාම් වලට බහුලව ලක්වීමට ඉඩ කඩ ඇත. එමෙන්ම ජල සම්පත නිසාවෙන් ද දිවයිනේ සියලු ප්‍රධාන ගංගා වල ඉහළ ජලාධාර ප්‍රදේශයන් මෙම ප්‍රදේශයට ආවරණය කොට පැතිර පවතින නිසාවෙන් ද මෙම ප්‍රදේශය වැදගත්වේ. මහනුවර, නුවරඑළිය, කෑගල්ල යන පරිපාලන දිස්ත්‍රික්ක වල සියලුම ප්‍රදේශ ද මාතලේ, රත්නපුර, මොණරාගල, ගාල්ල, මාතර, කළුතර හා කොළඹ යන පරිපාලන දිස්ත්‍රික්ක වල හඳුනාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ද මධ්‍ය අධිසංවේදී ප්‍රදේශය ලෙස දක්වා ඇත. ***උපලේඛන අංක 1*** මඟින් අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලැයිස්තුව දක්වා ඇත.

මෙම ප්‍රදේශයන්හි භෞතික සංවර්ධනය දැඩි රෙගුලාසි හා සවිස්තරාත්මක මාර්ගෝපදේශයන් අනුව මෙහෙයවීමටත්, ක්‍රියාත්මක කිරීම් අදාළ ආයතන මඟින් පාලනය කිරීමටත් පවතින නීතීමය රාමුව තුළ සැලසුම් සකස්කිරීමටත් යෝජනා කරනු ලැබේ. ජාතික ගොඩනැගිලි හා පර්යේෂණ සංවිධානය (NBRO) මඟින් දැනටමත් මෙම ප්‍රදේශ 'නායයෑම් අවධානම්' දිස්ත්‍රික්ක යන ලේබලය යටතේ ප්‍රකාශ කර ඇති අතර මෙම ප්‍රදේශවල ඉදිකිරීම් කටයුතු ඉදිරියට පවත්වාගෙන යාම සඳහා මාර්ගසූචක සකස් කොට සංවර්ධනය කර තිබේ. මෙය එක්පසෙකින් භූගෝලීය පැතිකඩ, ජල පද්ධතියේ සහ සංවර්ධන සනාත්වය සංරක්ෂණය කිරීම සඳහා දායක වේ.

නාගරීකරණයේ වර්ධනයත් සමඟ පැතිරී යන භෞතික සංවර්ධනය වඩා ඵලදායී කරගනු පිණිස සැලසුම් සහගත නාගරික සංවර්ධනය ඒ සඳහා විකල්පයක් නොව, අත්‍යාවශ්‍ය කටයුත්තක් වෙයි. 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන පනත යටතේ ප්‍රකාශ කර ඇති ආකාරයට දැනට පවතින සහ මතුවෙමින් පවතින නාගරික ප්‍රදේශ සඳහා සමෝධානික නාගරික සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කළ හැකිය.

ජන භායන ක්‍රමෝපායන් මඟින් මෙම ප්‍රදේශයේ ඇති අවදානම් සහිත භූමි සම්පත සංරක්ෂණය කළයුතු වේ. මෙම ප්‍රදේශයන්ගේ ඉදිරි පරම්පරාවන්ගෙන් (2020-2050) විශාල ජන කොටසක් යෝජිත ආර්ථික සංවර්ධන කලාපයන්ට ආකර්ශනීය රැකියා අවස්ථාවන්, දැරිය හැකි මිලකට නිවාස හා ඒ හා බැඳුනු අනෙකුත් පහසුකම් හා උද්දීපිත ජීවන පරිසරය මඟින් ආකර්ශනය කරගැනීමට ද යෝජනා කෙරේ.

**රූපසටහන් 3 : මධ්‍යම අධිසංවේදී ප්‍රදේශය**



ඊට අමතරව මනා ලෙස සකස්කරන ලද ඉඩම් සංරක්ෂණය සහ ගස් සිටුවීම/වනවගා වැඩසටහන් දිගු කාලීන ජල සම්පත් සංරක්ෂණයේ දී අත්‍යාවශ්‍ය වේ. මෙම අරමුණ සඳහා ප්‍රමාණවත් සහායක් දැනට ක්‍රියාත්මක REDD+Sri Lanka National REDD+ Investment Framework and Action Plan (2017) යන වැඩසටහන් සහ සැලසුම් මගින් සපයනු ලබයි.

### 2.1.4 වෙරළ සංරක්ෂණ කලාපය

1981 අංක 57 වෙරළ සංරක්ෂණ පනතින් සලසා ඇති ප්‍රතිපාදනයන් මඟින් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතු බලතලයන්ට යටත් වන වෙරළ සංරක්ෂණ කලාපය **රූපසටහන් අංක** 4 මඟින් දැක්වේ. ශ්‍රී ලංකාවේ භෞතික සංවර්ධනයේ විශාල කොටසක් මෙම ප්‍රදේශය තුළ සිදුවෙමින් පැවතිය ද මෙහි ඇති කලපු, ගංමෝදය, වගුරු, ගංගාධාර පරිසර ද ඇතුළුව අනෙකුත් සංවේදී පරිසර පද්ධතීන් මඟින් සපයනු ලබන පාරිසරික සේවාව, ඒ හා සබැඳි ආර්ථික කටයුතු හා ඒවායේ ඇති ආකර්ශනීය බව නිසාවෙන් සංරක්ෂණය කළයුතු වේ. මෙම ප්‍රදේශ ඇතුළත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලැයිස්තුව ඇමුණුම් අංක 02 මගින් දක්වා තිබේ.

වෙරළ සංරක්ෂණ කලාපය

මෙම ප්‍රදේශවල සංරක්ෂණ ක්‍රියාවලීන් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව අවශ්‍ය බලතල වලින් ප්‍රමාණවත්ව සමන්විත වන අතර, ජාතික වෙරළ සංරක්ෂණ සැලසුම දැනටමත් සැළසුම් කොට අවසන් ය. ඊට අමතරව භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් කැණීම් කටයුතු පාලනය කිරීම සහ සංචාරක, ධීවර, විනෝදාත්මක කටයුතු සහ වරාය ආශ්‍රිත කටයුතු හේතුවෙන් සිදුවන භෞතික සංවර්ධනය, නාගරික සංවර්ධන සැලසුම් මගින් විධිමත් කරන අතර මුහුදුබඩ පාරිසරික කටයුතු විධිමත් කිරීමට බලතල මධ්‍යම පරිසර අධිකාරිය සතුව ඇත. වෙරළ සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාවට නංවනු ලබන පවත්නා අණපනත් හා සංවර්ධන රෙගුලාසි මෙම ප්‍රදේශය තුල දැඩිව බලාත්මක කලයුතුව ඇත.

### 2.1.5 කෘෂි සංරක්‍ෂණ කලාපය

මෙම සංරක්‍ෂණ කලාපය රූපසටහන් අංක 05 මඟින් නිරූපනය කරන අතර 1979 අංක 58 දරණ ගොවිජන සේවා පනතින් හා මෙම සැලැස්ම මඟින් ප්‍රධාන නාගරික සංකේන්ද්‍රයන්ට අයත් නොවේ යැයි යෝජනා කරන රබර්, පොල් හා අනෙකුත් වර්ගයේ කෘෂිකාර්මික වගාවන් සඳහා බහුලව භාවිතාකරන ප්‍රදේශ ''කෘෂි සංරක්‍ෂණ කලාපයට" අයත් වේ.

කෘෂි සංරක්‍ෂණ කලාපය

ඇමුණුම් අංක 03 මගින් විවිධ කෘෂිකාර්මික වගාවන් සහිත භූමි ප්‍රදේශයන් බහුලව පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දක්වා තිබේ. ඊට අමතරව අත්‍යවශ්‍යයෙන් සංවර්ධනය කළ යුතු කෘෂි සංරක්ෂණ ප්‍රදේශ ඇමුණුම් අංක 04 මගින් පෙන්වා තිබේ.

### 2.1.6 ජල සංරක්‍ෂණ කලාපය

මෙම සංරක්‍ෂණ කලාපය රූපසටහන් අංක 06 මඟින් නිරූපනය කරන අතර මෙරට වියළි කලාපයේ ප්‍රධාන වශයෙන් පිහිටා ඇති විශාල වැව්, සුළු වැව්, අවසාදනයට ලක්ව ඇති වැව්, කුඩා පරිමාණයේ ග්‍රාමීය වැව්, ඒවායේ ජලාධාර ප්‍රදේශ හා එම වැව් පෝෂණය කරන ඇළ මාර්ග පද්ධතියද ඇතුළුව පවතින එල්ලංගා ජල පද්ධතියේ දීර්ඝ කාලීන පැවැත්මට බලපෑමක් ඇති කරනු ලබන ප්‍රදේශය 'ජල සංරක්‍ෂණ කලාපයට' අයත් වේ. මෙම ජල මාර්ගවල හා එහි ජලාධාර ප්‍රදේශ ආශ්‍රිතව සිදුකරනු ලබන භෞතික සංවර්ධන කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දැඩි අවධානයට ලක්විය යුතුය. මෙම ජල පද්ධති ඇතුළත් පරිපාලන දිස්ත්‍රික්ක ඇමුණුම් අංක 03 මගින් දක්වා තිබේ.

ජල සංරක්‍ෂණ කලාපය

මෙම ජල පද්ධති සහ ජල පෝෂක ප්‍රදේශ ආශ්‍රිත සංවර්ධනය, අදාළ පළාත් පාලන ආයතනවල සම්බන්ධීකරණය සමඟ ප්‍රාදේශීය ලේකම් මගින් පාලනය කළ යුතු වේ.

ජල සංරක්ෂණ කලාපයට අයත් වන ප්‍රදේශ ඇමුණුම් අංක 06 මගින් දක්වා තිබේ.

### 2.1.7 පාරිසරික සංරක්‍ෂණ කලාපය


මෙම සංරක්‍ෂණ කලාපය රූපසටහන් අංක 07 මඟින් නිරූපනය කරන අතර 1937 අංක 02 දරණ තුරුලතා ආරක්‍ෂණ පනත හා එහි සංශෝධන වල ප්‍රතිපාදනයන් යටතේ වනජීවී සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත්කර ඇති තෙත්බිම්, වාරි කටයුතු සඳහා යොදාගැනෙන වැව්වල ජලාධාර ප්‍රදේශ, ගංගා, ජලාශ හා අභය භූමි හා 1907 අංක 16 දරණ වන සංරක්‍ෂණ පනත හා එහි සංශෝධනවල ප්‍රතිපාදන යටතේ වන සංරක්‍ෂණ දෙපාර්තමේන්තුව විසින් "වන සංරක්‍ෂණ " ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශ "පරිසර සංරක්‍ෂණ කලාපයට" අයත් වේ. පාරිසරික සංරක්ෂණ කලාපයට අදාළ වන නීති සහ ප්‍රතිපත්ති ඇමුණුම් අංක 07 මගින් දක්වා තිබේ.

පාරිසරික සංරක්‍ෂණ කලාපය


රූපසටහන් 4 : වෙරළ සංරක්ෂණ කළාපය




**රූපසටහන් 5 : කෘෂි සංරක්ෂණ කළාපය**



රූපසටහන් 6 : **ජල සංරක්ෂණ කළාපය**



**රූපසටහන් 7 : පාරිසරික සංරක්ෂණ කලාපය /වන සංරක්ෂණ කලාප**




සංවර්ධන ජාල

**2.1.8 සංවර්ධන ජාල**

සංවර්ධන ජාලයක් යනුවෙන් දක්වා ඇත්තේ (A Development Corridor) විශාල හා සුළු ප්‍රමාණයේ ආර්ථික කටයුතු පෙලක් එකිනෙකට සම්බන්ධ කරන, පෙර හා පසු සබඳතා මඟින් එකිනෙකාට අන්‍යෝන්‍ය වශයෙන් සහයෝගය ලබාදෙන, විවිධත්වයෙන් යුතු ද්විතීය හා තෘතීය අංශයේ කාර්මික සංවර්ධනයක් ඇති, නේවාසික හා රැකියාවල නියුතු විශාල ජන ප්‍රමාණයකට ප්‍රයෝජනවත් වන නාගරික පහසුකම් ඇති නාගරික සමූහිතයක් හා එකිනෙකට සම්බන්ධ භෞතික, ආර්ථික හා සමාජීය යටිතලපහසුකම් වලින් පෝෂණය වන භූගෝලීය ඒකකයකි.

රූපසටහන් අංක 08 මඟින් පෙන්වා ඇති පරිදි කොළඹ, ත්‍රිකුණාමලය හා හම්බන්තොට යන ප්‍රධාන ජාත්‍යන්තර වරායන්, හා ඔලුවිල්, යාපනය යන කුඩා වරායන් ද, කටුනායක, මත්තල හා හිගුරක්ගොඩ (ඉදිකිරීමට යෝජිත) වැනි ජාත්‍යන්තර ගුවන්තොටුපල ද, අධිවේගී මාර්ග හා වැඩිදියුණු කරන ලද වේගවත් දුම්රිය මාර්ග පද්ධතියේ ද




**රූපසටහන් 8 : යෝජිත නාගරික සාමූහිත රටාව -2050**

සාපේක්ෂ වාසිය ලබාගනිමින් ද, දේශීය පාරිභෝගික භාණ්ඩවලට හා ආනයන - අපනයන මත පදනම් වූ ලෝක ව්‍යාප්ත සැපයුම් ජාලයන්ට අගය එකතුකිරීම් ප්‍රධාන වශයෙන් සිදුකරමින් ජාතික ආර්ථිකයට විශාලම දායකත්වය ආර්ථික ජාල (Development Corridors) මඟින් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ. එබැවින් මෙම ජාලයන් දේශීය, විදේශීය ආයෝජන ආකර්ෂණය කරගැනීමේ හා ක්‍රියා අවස්ථා සැපයීමේ ප්‍රධාන ප්‍රභවයන් බවට පත්විය යුතුය.

තවද 2050දී සමස්ත ජන ගහනයෙන් අඩු තරමින් සියයට හැටක් (60%) පමණ යෝජිත සංවර්ධන ජාල තුළට සංකේන්ද්‍ර වනු ඇතැයි භෞතික වින්‍යාසය මඟින් අපේක්ෂා කෙරේ. එවැනි සංකේන්ද්‍රනයන් විශේෂ යටිතල පහසුකම් හා උසස් තත්වයේ නාගරික පහසුකම් සඳහා සිදුකරනු ලබන ආයෝජනයන්ගේ ශක්‍යතාවයටත්, තිරසාරත්වයටත් අත්‍යාවශ්‍ය වේ.

**2.1.9 නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය**

කොළඹ හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්ක අතර යෝජනා කරනු ලබන මෙම සංවර්ධන ජාලය රූපසටහන් අංක 07 මඟින් නිරූපනය කෙරේ. කොළඹ හා ත්‍රිකුණාමලය යන ප්‍රධාන වරාය දෙකින් සැළසෙන වාසිදායක තත්වයන් සාක්ෂාත් කර ගැනීම සඳහාත්, ප්‍රවාහන යටිතල පහසුකම් හා සුදුසු ජීවන තත්වයන් මත ශ්‍රී ලංකාවේ අනාගත ජනගහනයෙන් සැලකිය යුතු ප්‍රමාණයක් (ආසන්න වශයෙන් 35%- 40%) යෝජිත "නැගෙනහිර- බටහිර සංවර්ධන ජාලයට" (East-West Development Corridor) අයත් භූමි ප්‍රදේශවලට ආකර්ශනය කරගැනීමට යෝජනා කෙරේ. මෙම ජාලයට අයත් භූමි ප්‍රමාණය යෝජිත අධිවේගී මාර්ග හා මහාමාර්ගවල සිට ආසන්න වශයෙන් කිලෝමීටර් 05-10 (ඉහලම සංකේන්ද්‍රයක් සඳහා), කිලෝමීටර් 10-20 (සාමාන්‍ය ප්‍රමාණයේ සංකේන්ද්‍රයක් සඳහා) හා කිලෝමීටර් 20-30ක් (අඩු ප්‍රමාණයේ සංකේන්ද්‍රයක් සඳහා) ලෙස නිශ්චය කර ඇත.

නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය

කොළඹ අවට ඇති නාගරික ප්‍රදේශ කිහිපයක් සඳහා දායකත්වය ලබාදෙන මෙම සංවර්ධන ජාලය තුළ ඇති කොළඹ විසල් නාගරික කලාපය, විශාලතම ජන සංකේන්ද්‍රයක් යුතු ජනාවාසය වන අතර එය 2050 වන විට මිලියන තුනහමාරක (3,500,000) පමණ නේවාසික ජනතාවකට පහසුකම් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සමූහිතය තුළ යෝජිත අනෙකුත් විසල් ජන සංකේන්ද්‍රණයන් වනුයේ මීගමුව (500,000), ගම්පහ (700,000), කුරුණෑගල (1,000,000), දඹුල්ල (500,000) හා ත්‍රිකුණාමලය (1,000,000) ය. ඒ සම්ගම ජනගහනය 100,000 - 200,000 ත් අතර වෙනස්වීමට යෝජිත බේරුවල, කළුතර - මතුගම, පානදුර-හොරණ, මීරිගම-වරකාපොළ, පොල්ගහවෙල, අලව්ව, ඉබ්බාගමුව, ගලේවෙල හා කන්තලේ යන නාගරිකයන් පෙළ ද මෙම සමූහිතය තුළ පිහිටා ඇත. එමෙන්ම තවත් කුඩා නගර කිහිපයක සාපේක්ෂ වශයෙන් අඩු ජන සංකේන්ද්‍රණයක් දැකගැනීමට බලාපොරොත්තු වෙයි.

මෙම නාගරික සමූහිතයට වර්තමාන පරිපාලන රාමුව අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 67ක් (වගුව 01) හා දිවයිනේ සමස්ථ භූමි ප්‍රමාණයෙන් 15.2% භූමි ප්‍රමාණයක් (9950$Km^2$) ක් අයත් වනු ඇත.

**2.1.10 උතුරු සංවර්ධන ජාලය**

රූපසටහන් අංක 08 මඟින් නිරූපනය කරනු ලබන උතුරු සංවර්ධන ජාලය (Northern Development Corridor) මඟින් 2050 වන විට මිලියන එක හමාරකට (1,200,000) වඩා නේවාසික ජනතාවකට ඉඩසැලසෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම කලාපයේ දැනට අඩු ජනගහන වර්ධන වේගයක් දැකිය හැකි නමුත් 2050 වන විට මෙම වේගය 1.2%ක සාමාන්‍ය වර්ධන වේගයක් දක්වා වැඩි කර ගත හැක.
(වගුව අංක 02)

උතුරු සංවර්ධන ජාලය

යාපනය අධිනාගරිකය හා කිලිනොච්චිය මෙම සංවර්ධන සාමූහිතජාලයේ අභිකේන්ද්‍රයන් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. පවතින්නා වූ බාධා සහිත වූ පාරිසරික තත්වයන් හා යටිතල පහසුකම් සැපයීමේ ඇති හැකියාව මත මෙම ජාලයේ පිහිටි අනෙකුත් ප්‍රදේශ වලට වඩා වැඩි වර්ධනයක් කිලිනොච්චිය ප්‍රදේශයේ සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන ජාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 15කින් සමන්විත වන අතර (වගුව 01) මුළු දිවයිනෙහි භූමි ප්‍රමාණයෙන් 2.9% (වර්ග කි.මී.1925) ක් වේ.

**2.1.11 දකුණු සංවර්ධන ජාලය**

රූපසටහන් අංක 08 මඟින් දකුණු සංවර්ධන ජාලය (Southern Development Corridor) නිරූපනය කරනු ලබන අතර 1.0%ක් වන පවතින්නා වූ වාර්ෂික ජන වර්ධන වේගය මඟින් එහි මිලියන එකහමාරකට වඩා (1,700,000) නේවාසික ජනගහනයක් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. (වගුව අංක 02)

දකුණු සංවර්ධන ජාලය

නැගෙනහිර සංවර්ධන ජාලය

මෙම සංවර්ධන ජාලය ගාල්ල, මාතර හා හම්බන්තොට යන විසල් නාගරිකයන් ද තංගල්ල, ඇඹිලිපිටිය හා තිස්සමහාරාමය යන ප්‍රධාන නගර ද සාපේක්ෂ වශයෙන් කුඩා ජන ප්‍රමාණයක් සිටින " කුඩා නගර" රාශියක් ද කේන්ද්‍ර කොටගෙන සංවර්ධනය වනු ඇත. මෙම කලාපයේ වර්තමානයේ පවතින සාමාන්‍ය ජන වර්ධන වේගය 2050 වන විට අපේක්ෂිත උක්ත ජන සංඛ්‍යාව ළඟා කර ගැනීම වෙනුවෙන් අඛණ්ඩව පවත්වාගෙන යා යුතු වේ.

දකුණු සංවර්ධන ජාලය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 32 කින් (වගුව 01) සමන්විත වන අතර දිවයිනෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 4.6% (වර්ග කි.මී.3021) ක් වේ.

**2.1.12 නැගෙනහිර සංවර්ධන ජාලය**

රූපසටහන් අංක 08 මඟින් නිරූපනය කරන නැගෙනහිර සංවර්ධන ජාලයේ (Eastern Development Corridor) අපේක්ෂිත නේවාසික ජනගහනය මිලියන එකකට වඩා වැඩි (1,200,000) වන අතර එය 1.0% ක් වන පවතින ජනගහන වර්ධන වේගයේ සුළු වර්ධනයන් ඇතිකරලීම මඟින් මෙය ලඟාකරගත හැකිය. (වගුව අංක 02)

මඩකලපුව හා ඒ ආශ්‍රිත ප්‍රදේශය ජනගහනය 300,000 කින් යුතු මධ්‍යම ප්‍රමාණයේ විසල් නාගරිකයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරන අතර වාලච්චේන, කල්මුණේ, අම්පාර, අක්කරෙයිපත්තුව කුඩා ජන සංකේන්ද්‍රණයන් ඇති කුඩා නගර රාශියක් සමඟ ජනගහනය 250,000 සිට 100,000 දක්වා වෙනස්වන නගර ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 29 කින් මෙම ප්‍රදේශය සමන්විත වන අතර (වගුව අංක 02) දිවයිනෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 4.6% (වර්ග කි.මි. 3021) ක් වේ.

**2.1.13 අධි නාගරික ප්‍රදේශ**

අධි නාගරික ප්‍රදේශ

අධි නාගරිකයක් යනුවෙන් දක්වා ඇත්තේ සාපේක්ෂ වශයෙන් විශාල ලෙස අර්ථික කටයුතු සම්පිණ්ඩනය වූ, නාගරික ප්‍රදේශ වටා ද්විතීය හා තෘතීය අංශයේ රැකියා පවතින හා සැලකිය යුතු නේවාසික ජනගහනයක් ඇති, නාගරික පහසුකම් වල තනි හෝ බහුවිධ ලක්ෂණ ඇති භූ ගෝලීය ඒකකයකි. මෙම ප්‍රතිපත්තිය මඟින් අවම ජනගහනය 500,000ක් හා දළ නේවාසික ජන ඝනත්වය වර්ග කිලෝමීටරයකට 5,000 ඉක්මවන ප්‍රදේශ 'අධි නාගරික ප්‍රදේශයක්' ලෙස අර්ථ දක්වනු ලැබේ.

මහනුවර විසල් නාගරිකය

**මහනුවර විසල් නාගරිකය** දසලක්ෂයක (1,000,000) පමණ ජනතාවකට සේවා සපයනු ඇතැයි යෝජනා කෙරේ. මහනුවර විසල් නාගරික ප්‍රදේශය ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශයේ වර්තමානයේ ජනගහනය 680,000 කට පමණ ඉඩපහසුකම් සැලසී ඇති නමුත් අනාගත ජනගහනය වෙනත් සුදුසු ප්‍රදේශවලට ආකර්ශනය කරගැනීමට ක්‍රියාමාර්ග නොගන්නේ නම් සිදුවන ජනගහන වර්ධනය අපේක්ෂිත ජන සංඛ්‍යාව ඉක්මවා යනු ඇත.

මහනුවර විසල් නාගරිකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 කින් සමන්විත වන අතර (වගුව අංක 01) දිවයිනෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 0.7% (වර්ග කි.මී. 430) ක් වේ.

අනුරාධපුර විසල් නාගරිකය

**අනුරාධපුර විසල් නාගරිකයේ** හා එහි සෘජු බලපෑමට ලක්වන ප්‍රදේශය මඟින් ලක්ෂ පහක (500,000) ජනගහනයකට පහසුකම් සපයනු ඇත. අනුරාධපුර විසල් නාගරිකය ලෙස හඳුනාගෙන ඇති ප්‍රදේශයේ වත්මන් ජනගහනය 311,000ක් පමණ වන අතර 1.6% සාමාන්‍ය වාර්ෂික වර්ධන වේගයකින් ජනගහනය වර්ධනය වී 2050 වන විට අපේක්ෂිත ජන සංඛ්‍යාව ලඟාකර ගත හැකිවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(වගුව අංක 02)
අනුරාධපුර විසල් නාගරිකය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 8 කින් සමන්විත වන අතර (වගුව අංක 01) දිවයිනෙහි මුළු භූමි ප්‍රමාණයෙන් 2.5% (වර්ග කි.මී. 1670) ක් වේ.

**2.1.14 ප්‍රධාන නගර**

ප්‍රධාන නගර

ප්‍රධාන නගරයක් යනුවෙන් දක්වා ඇත්තේ සාපේක්ෂ වශයෙන් විශාල ආර්ථික කටයුතු, නාගරික පහසුකම් හා නේවාසික ජනගහනයන් සංකේන්ද්‍රවී ඇති, සැලකිය යුතු භූමි ප්‍රදේශයක් සඳහා ඉහළ මට්ටමේ සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කරන භූගෝලීය ඒකකයකි. මෙම ප්‍රතිපත්තිය මඟින් ප්‍රධාන නගරයක් ලෙස අර්ථ දක්වනු ලබනුයේ අවම ජන ගහනය 100,000ක් හා දළ නේවාසික ජන ඝනත්වය වර්ග කිලෝමීටරයකට 5,000 ඉක්මවන ප්‍රදේශ ය.

මන්නාරම, මුලතිව්, වවුනියාව, පුත්තලම, පොළොන්නරුව, නුවරඑළිය, රත්නපුරය, මහියංගනය හා වැල්ලවාය යන ස්ථාන ජනගහනය ලක්ෂයත් ලක්ෂ දෙකත් (100,000-200,000) (වගුව අංක 02) අතර වෙනස්වන ස්වාධීන නාගරික ප්‍රදේශ නවයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. රූපසටහන් අංක 8 මගින් නිරූපනය කෙරෙන මෙම ප්‍රධාන නගර විසින් අනාගත නාගරික වර්ධනය අත්පත් කරගනු ඇතැයි අපේක්ෂා කරන අතර එසේ නොමැති වුවහොත් ඉදිරි වසර 20දී විසිරුණු නාගරික ප්‍රදේශ ලෙස සංවර්ධනය වීම නොවැළැක්විය හැකි වනු ඇත. මෙම නාගරික ප්‍රදේශ හා ඒවායේ බලපෑමට හසුවන ප්‍රදේශ මගින් මිලියන 2.6-2.7ත් දක්වා වන නේවාසික ජනගහනයකට ඉඩසලසනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. එසේම නුවරඑළිය හා රත්නපුර වැනි ප්‍රදේශ පවත්නා පාරිසරික සංවේදී තත්වයන් නිසාවෙන් එම ප්‍රදේශ වලින් අනාගත ජනගහනය වෙනත් ප්‍රදේශයන්ට යොමුකිරීමට ද අවශ්‍යතාවයක් පවතී.

**2.1.15 තෘතීය සාමූහිත**

කුඩා නගර

නාගරික ප්‍රදේශ ලෙස නම් කර ඇති හා නම් කර නොමැති දෙසීයක් පමණ වන මධ්‍යම හා කුඩා පරිමාණයේ නගරවල 50,000ට අඩු ජනගහනයක් අපේක්ෂා කරන අතර ඒවායින් දිවයිනේ විසිර පවත්නා අනෙකුත් ජනාවාස වල මූලික අවශ්‍යතා සඳහා පහසුකම් ලබාදෙනු ඇතැයි ද අපේක්ෂිතය.

**2.1.16 ක්‍රියාත්මක කිරීම**

භෞතික ව්‍යුහයේ ක්‍රියාත්මකවීම අදාල ආයතන මගින් ගනු ලබන පහත ක්‍රියාමාර්ග මගින් තහවුරු කරනු ඇත.

1. ශ්‍රම බලකායට ඇතුලත්වන අනාගත පරපුර සඳහා මෙම සැලසුම මගින් යෝජනා කරන ස්ථාන වල ආකර්ශනීය රැකියා අවස්ථාවන් හා ව්‍යාපාරික අවස්ථාවන් උත්පාදනය කරනු ලබන (ප්‍රධාන වශයෙන් නිෂ්පාදන හා සේවා අංශයේ) උපාය මාර්ගික ව්‍යාපෘති වල ආයෝජනය කිරීම.

2. යෝජිත නාගරික සංකේන්ද්‍රණයන් වල නේවාසික ජනාවාස සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇති ස්ථාන වල ඉඩම්/නිවාස හා නාගරික පහසුකම් ( විශේෂයෙන්ම ජල සැපයුම හා පොදු ප්‍රවාහනය) සඳහා ඇති අවස්ථාවන් වැඩි කිරීම

3. මෙම සැලසුම මගින් යෝජනා කරනු ලබන ප්‍රධාන නාගරික ප්‍රදේශ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් (විශේෂයෙන්ම ප්‍රාථමික හා ද්විතීය අංශයේ පාසල්, ඉහළ ගුණාත්මක තත්වයකින් යුත් සෞඛ්‍ය සේවාවන්, ක්‍රීඩා හා විනෝදාස්වාද පහසුකම්) සැපයීම

**2.2 නාගරික සංවර්ධන ක්‍රමෝපාය**

2.2.1 අරමුණ

නාගරික සංවර්ධන ක්‍රමෝපාය

නාගරික සංවර්ධන ක්‍රමෝපායේ අරමුණ වනුයේ පුළුල් වූ සංවර්ධන මාර්ගෝපදේශයන් සමඟ නාගරික ප්‍රදේශ නියාමනය කිරීම හා ප්‍රවර්ධනය කිරීමයි. නාගරික සංවර්ධන සැලසුම් සකස්කරනු ලබන සංවර්ධන අධිකාරිය හා අදාළ අනෙකුත් සංවර්ධන ආයතනයන් විසින් පහත සඳහන් අංශ දැඩි ලෙස සැලකිල්ලට ගතයුතු වේ.

**(අ) ආකර්ශනීය හා ජීවනෝචිත තත්වයන්**

නාගරික ප්‍රදේශ ඇතුළත පරිසර තත්ත්වය ජීවත්වීමට මෙන්ම රැකියා හා විනෝදාස්වාද කටයුතු සඳහා ද හිතකර විය යුතුවේ. බොහෝ නාගරික ප්‍රදේශ තුල පවතින නිවර්තනික දේශගුණික තත්වය පිළිබඳව ප්‍රමාණවත් සංවේදීතාවක් දක්වමින් නාගරික පරිසරයන් නිර්මාණය කොට ගැනීම මෙහි ලා වැදගත් වෙයි. කමනීය හා ජීවනෝචිත වටපිටාවක් සඳහා දීප්තිමත් දිවා ආලෝකය, සුවපහසු උෂ්ණත්ව හා ආද්‍රතා තත්වයන්, වැනි ධනාත්මක ලක්ෂණයන් සේම කටුක හිරු රශ්මිය මෙන්ම දැඩි වර්ෂාව වැනි කාලගුණික තත්වයන් මැඩ පවත්වන සැලසුම් හා නාගරික නිර්මාණ (urban design) ක්‍රියාමාර්ග මගින් ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය වේ.

**(ආ) සුරක්ෂාව හා ආරක්ෂිත වටපිටාව**

ගංවතුර, නායයෑම්, මුහුදු ඛාදනය, වැනි බාහිර බලපෑම්වලින් ද නිරන්තර මාර්ග අනතුරු, මහජන පීඩාවන්, පුළුල්ව පැතිරෙන වසංගත තත්වයන් වැනි අභ්‍යන්තර ගැටළුවලින් ද සුරක්ෂාවීම පිළිබඳව නාගරික ප්‍රදේශ සැලසුම් කිරීමේදී අවධානය යොමුකල යුතුවේ. තවද කුඩා දරුවන්ට, ආබාධිත පුද්ගලයින්ට හා වැඩිහිටි ජනතාවට විශේෂ අවධානයක් සුරක්ෂිත පරිසරයක තිබිය යුතුවේ. සුරක්ෂාවට අමතරව, සොරුන්, ගෙවල්බිඳුම්, අපරාධ හා ත්‍රස්තවාදී ආක්‍රමණ වලින් භෞතික හා භෞතික නොවන ක්‍රියාමාර්ග තුළින් ආරක්ෂාව සැපයීමට ද අවශ්‍යතාවයක් වේ.

**(ඇ) සුහුරු හා උචිත පහසුකම්**

එදිනෙදා කාර්යයන් සඳහා අවශ්‍යවන විවිධ තොරතුරු සඳහා වන පහසු ප්‍රවේශකත්වය, විවිධ ආයතන මඟින් ලබාදෙන මහජන සේවාවන්හි කාර්යක්ෂමතාවය හා විශ්වසනීයත්වය හා නාගරික පහසුකම් භාවිතයේ ඇති පහසුව නාගරික ප්‍රදේශයක් සුහුරු නාගරිකයක් බවට පත්කරයි. තොරතුරු තාක්ෂණයේ වැඩි දියුණුවීම සුහුරු මෙවලම් මඟින් තොරතුරු වේගවත්ව හා විශ්වාසනීය ලෙස සැපයීම සඳහා උපකාර කරනු ලබන නමුත් තොරතුරු බෙදාහැරීමේ කාර්යක්ෂමතාව ඒවා හසුරවන පුද්ගලයන් හා පද්ධති මත රඳාපවතී. කෙසේ නමුත් එවැනි පද්ධති සඳහා අවශ්‍ය වන ප්‍රධාන දායකත්වය භෞතික නොවූවත් ඊට අවශ්‍ය වන්නාවූ භෞතික පරිසරය අවශ්‍ය නිපුණත්වයන් සමඟ ප්‍රශංසනීය භාවිතයක් සඳහා සැලසුම්ගතව නිර්මාණ විය යුතුය

**(ඇ) හරිත හා තිරසර පරිසරය**

වඩාත් සුදුසු ඉඩම්, ආරක්ෂිත හා යථාර්ථවත් ඉදිකිරීම් ක්‍රමවේද තෝරාගැනීම, ඉදිකිරීම් හා ක්‍රියාත්මක කිරීම යන කාර්යන් දෙකෙහිදීම ජලය පිරිමැසුම් ලෙස භාවිතය, පුනර්ජණනීය බලශක්තිය සඵලදායී ලෙස යොදා ගැනීම, ප්‍රශස්ථ ප්‍රමාණයන්ට සුදුසු අමුද්‍රව්‍ය භාවිත කිරීම, තාප තත්ත්වයන්ට අනුකූලතාව දැක්වීම, කාර්යක්ෂම උපාංග භාවිතා කිරීම ආදිය පාරිසරික තිරසාර බව හා "හරිත" සංවර්ධනය තහවුරු කිරීම සඳහා සියලු ඉදිකිරීම් කටයුතුවලදී අනිවාර්ය කළ යුතු වේ.

**2.2.2 පොදු ප්‍රවාහන මාධ්‍ය දියුණු කිරීම**

නාගරික පහසුකම්

කාර්යක්ෂම, මිල දැරියහැකි හා විශ්වාසනීය පොදු ප්‍රවාහනය නාගරික ප්‍රදේශයක ජීවනෝචිත බව වැඩිදියුණු කිරීම සඳහා වන මූලික සාධකයකි. එබැවින් ප්‍රශස්ථ මගී සේවාවක් ලබාදීම සඳහා දිවයින පුරා පොදු ප්‍රවාහනය දියුණු කිරීමට 2.1 කොටස මඟින් යෝජනා කරනු ලබන නාගරික සාමූහිතයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමුකරමින් 2025 වසර වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ ප්‍රතිසංවිධානය, ප්‍රවාහන මාධ්‍ය සංකලනය හා එම ක්ෂේත්‍රය ක්‍රමානුකූලව සකස්කිරීම සඳහා උපාය මාර්ගික අයෝජනයන් සිදුකිරීම අත්‍යාවශ්‍ය වේ.

කොළඹ අධි නාගරික ප්‍රදේශය හැරුණු විට අනෙකුත් බොහෝ අධිනාගරික ප්‍රදේශයන්ගේ හා නාගරික ප්‍රදේශයන්ගේ නේවාසික ජනගහනය මිලියනය නොයික්මවයි. එබැවින් ප්‍රාදේශීය මගී ප්‍රවාහනය සඳහා අධි තාක්ෂණික ප්‍රවාහන විසඳුම්වල විශාල වශයෙන් ආයෝජනය කිරීම ආර්ථික ශක්‍යතාවයෙන් තොර වනු ඇත. බොහෝ නාගරික ප්‍රදේශ වල ප්‍රාදේශීය මගී ප්‍රවාහන අවශ්‍යතාවය 2030 දක්වා දැනට පවතින බස් සේවය වැඩිදියුණු කිරීම මඟින් ප්‍රශස්ථ ලෙස සපයාගත හැකිය. කෙසේනමුත් ප්‍රවාහන ක්ෂේත්‍රයේ මෙහෙයුම්කරණ කටයුතු විශාල වශයෙන් නියාමනය කිරීමට අවශ්‍ය වන අතර බස්වල හා පොරොත්තු ස්ථානවල ඇති පහසුකම් අවශ්‍ය සුවපහසු බවින් යුක්තව සැපයීමත්, විද්‍යුත් ගමන් බලපත් හා තොරතුරු ප්‍රදර්ශනය වැනි සුහුරු සේවාවන් වඩා කාර්යක්ෂමව, පිරිවැය-ඵලදායීතාවයකින් හා මගීන් සඳහා ආකර්ශනීය බවකින් යුක්තව සැපයීමෙන් මෙම අරමුණු ළඟා කොට ගත හැක.

ආර්ථික ශක්‍යතාවයෙන් හා පාරිසරික තිරසර බවකින් යුත් දුම්රිය සේවය යෝජිත සංවර්ධන ජාලයන්හි නගරාන්තර මගී හා භාණ්ඩ ප්‍රවාහනයට වඩාත්ම යෝග්‍යය මාධ්‍ය වේ.

**2.2.3 උසස් තත්වයේ සේවාවන්**

නාගරික සංවර්ධනයේ පිබිදීම උදෙසා 2020-2030 කාලසීමාව තුලදී සංවර්ධන ජාලයන්හි හඳුනාගන්නා ලද අධි නාගරික ප්‍රදේශයන්හි හා නාගරික ප්‍රදේශයන්ගේ ද ස්වාධීනව පවතින අධිනාගරිකයන්හි හා ප්‍රධාන නගර නවයෙහි ද ප්‍රමුඛතා පිළිවෙල අනුව පවතින ජල සම්පාදන ව්‍යාපෘති වල වර්ධනය සඳහා උපාය මාර්ගික ආයෝජන සිදුකිරීම, ජලාපවහන පද්ධතිය දියුණු කිරීම, භූගත පල්දෝරු පද්ධතියක් හඳුන්වාදීම, විදුලිබල ජාලය වැඩිදියුණු කිරීම හා ගිණිනිවීමේ සේවාවක් හඳුන්වාදීමට යෝජනා කරනු ලැබේ.

නොබිඳුණු, ස්ථායී හා විධිමත් සැපයුමක් සඳහා යෝජිත සංවර්ධන ජාලයන් පුරා විවිධ ස්ථානයන්හි බහුවිධ ප්‍රභවයන්ගෙන් පෝෂණය වන එකිනෙකට සම්බන්ධ වූ ජල සැපයුමක්, ගෑස් හා විදුලිය බෙදාහැරීම් පද්ධතියක් යෝජනා කෙරේ.

**2.2.4 සමාජීය යටිතල පහසුකම් වර්ධනය කිරීම**

අනාගත ජනගහනය තෝරාගන්නා ලද නාගරික ප්‍රදේශයනට නේවාසික හා රැකියා කටයුතු සඳහා ආකර්ශනය කර ගැනීම උදෙසා එම ප්‍රදේශයන්හි ඉහල ගුණාත්මක බවකින් යුතු අධ්‍යාපන, සෞඛ්‍ය, සන්නිවේදන හා විනෝදාස්වාදන පහසුකම් ඇති කිරීමට යෝජනා කරනු ලැබේ.

අධි නාගරික ප්‍රදේශ හා ප්‍රධාන නාගරිකයන් ලෙස යෝජනා කර ඇති බොහෝ ප්‍රදේශවල දැනටමත් ප්‍රමාණවත් පරිදි අධ්‍යාපන හා සෞඛ්‍ය පහසුකම් ඇති බවට නිරීක්ෂණය කළ හැක. නව පහසුකම් ස්ථාපනය කිරීමට වඩා පවතින පහසුකම් වල ගුණාත්මක බව හා ඒවායේ ධාරිතාවය වැඩිකිරීම සඳහා ආයෝජනයන් සිදු කිරීම මෙහිලා ආසන්නතම අවශ්‍යතාවයකි. එසේම ඇතැම් නාගරික ප්‍රදේශ මධ්‍යයේ පිහිටා ඇති පාසල්, රෝහල් අධික ජන ඒකරාශිවීම, රථවාහන තදබදය හා භාවිතාකරන්නන්ගේ ආරක්ෂාව යනාදී කරුණු මත එම ස්ථානයන්ගේ සිට යාබදව පවතින සුදුසු විකල්ප ස්ථාන කරා පුනස්ථාපනය කළයුතු වේ.

**2.2.5 පොදු ප්‍රදේශ වැඩිදියුණු කිරීම**

නාගරික ප්‍රදේශ වඩාත් ආකර්ශනීය කරගැනීම සඳහා පොදු ප්‍රදේශ වැඩිදියුණු කිරීමට ප්‍රමුඛතාවයක් සියලුම නාගරික සංවර්ධන වැඩසටහන් වලදී ලබාදිය යුතුවේ. පදික පරිසරය වැඩිදියුණු කිරීම හා විධිමත් කිරීම වැනි උපාය මාර්ගික මැදිහත්වීම් මඟින් පවතින නාගරික ප්‍රදේශ බොහෝ ආකර්ශනීය කර ගත හැකි බවට නිරීක්ෂණය වී ඇත. වර්තමාන ශ්‍රී ලංකාවේ බහුලව දක්නට ඇති රථවාහන තදබදය, අනවසර රථ වාහන ගාල්කිරීම්, රිය අනතුරු වැනි ගැටළු සඳහා පදික පරිසරය දියුණු කිරීම වඩා හොඳ විසඳුමකි. මෙම තත්ත්ව ඇති කිරීම සඳහා සැලසුම්කරුවන් හා ප්‍රතිපත්ති සම්පාදකයින් යන දෙකොට්ඨාශයේ ආකල්පමය වෙනස්වීමක් අත්‍යවශ්‍ය වේ. මෙහි පූර්ව මිණුමක් ලෙස වර්තමානයේදී රථවාහන සංචලතාවට ලබාදෙන ප්‍රමුඛතාව වෙනුවට පදික හිතකරතාවය අනාගත නගර සැලසුම්වල ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය යුතු වේ. පවතින නිවර්තන දේශගුණික තත්වයන් සැලකිල්ලට ගනිමින් මෙම සැලසුම් ද ඊට යෝග්‍ය පරිදි සකස් කිරීම වැදගත්ය.

**2.2.6 විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම**

වෙනස් වන නාගරික ජීවන රටාවට පහසුකම් සැපයීම සඳහා ප්‍රාදේශීය මට්ටමින් විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කල යුතුය. එමඟින් නිරෝගී ජාතියක් සඳහා සෞඛ්‍ය පහසුකම් සැපයීම සඳහා වැයවන අධික පිරිවැය අවම කරගැනීමට ද හැකිවේ.

පිළිගත් ප්‍රමිතියට අනුව පුද්ගලයින් 1000ක් සඳහා හෙක්ටයාර් එකක පොදු පහසුකම් ප්‍රදේශයක් වෙන්කිරීමට අවශ්‍ය වුවත් පවතින සංවර්ධන යෝජනා ක්‍රම අනුව එය ඉතා අසීරු ඉලක්කයකි. එපමණක් නොව භූමියේ ආරක්ෂාව හා නාගරික ප්‍රදේශයන්හි ඇතිවන සංවර්ධන බලපෑම මත එවැනි විශාල ප්‍රමාණයේ භූමි ප්‍රමාණයක් පොදු පහසුකම් සඳහා වෙන්කිරීම එක්තරා අභියෝගයකි. ඇළ මාර්ග රක්ෂිතයන්, ගං ඉවුරු ප්‍රදේශයන්, තෙත්බිම් හා මුහුදු වෙරළ තීරයන් පොදු ප්‍රදේශ ලෙස ප්‍රවේශවීමට (ප්‍රමාණවත් පහසුකම් හා නඩත්තුකිරීම් මත) හැකියාව ඇති කිරීම වැනි උපාය මාර්ගික ක්‍රමවේද මඟින් මහජනතාවට විවෘත භූමි තුල පොදු පහසුකම් සැපයීම සඳහා ඇති දුෂ්කරතාවයන් මගහරවා ගත හැකිය. අසල්වැසි කුඩා ප්‍රදේශ (neighbourhood) මට්ටමින් පුළුල් ප්‍රවේශ මාර්ග ඇති කිරීම මඟින් උපාය මාර්ගිකව දරුවන් සඳහා ඒකරාශීවීමට හා ක්‍රීඩා කිරීමට ඉඩකඩ සකස්කර ගත හැකිවන අතරම එම ප්‍රදේශ මහජනතාව සඳහා විවෘත ප්‍රදේශ ඇතිකරලන විකල්පයක් ලෙසින් හා අසල්වාසීන් අතර සුහදත්වය අන්‍යෝන්‍ය සහෝදරත්වය ශක්තිමත් කරන සාධකයන් ලෙසින් භාවිත කළ හැකිය.

**2.2.7 භෞතික සංවර්ධනය සඳහා වැඩි ඉඩකඩක් ඇතිකිරීම**

දැනට ක්‍රියාත්මක කරන ක්‍රියාකාරකම් පදනම් වූ කළාපකරණයකට වෙනුවට, වඩා හිතකර ගෙබිම් අනුපාතයක්, යෝග්‍ය සංවර්ධන ඝනත්වයක් හා මිශ්‍ර සංවර්ධනය ආදී උපාය මාර්ග මඟින් තෝරාගන්නා ලද නාගරික ප්‍රදේශවල සිදුවන වේගවත් සංවර්ධනයට පහසුකම් සැලසීමට මෙන්ම සංවර්ධන කටයුතු පවතින පරිසර පද්ධතීන්ට සුසංයෝග වන ආකාරයෙන් හා යටිතල පහසුකම් සැලසෙන අයුරින් සංවර්ධන මාර්ගෝපදේශ සැලසුමක් තුළ නියමනය කිරීමට ද ඉඩකඩක් ඇතිකල යුතුවේ.

නාගරික සංවර්ධන අධිකාරිය මඟින් උක්ත සඳහන් කරන ලද සංවර්ධන ජාලයන්හි, අධිනාගරිකයන්හි හා ප්‍රධාන නගර වල හා හඳුනාගන්නා ලද නාගරික ප්‍රදේශ සඳහා සකස්කරන සැලසුම්වල සංවර්ධන ඝනත්වය හා ගෙබිම් අනුපාතය පිළිබඳව සළකා බැලිය යුතු වන්නේ එම ස්ථානයන්හි නගර නිර්මාණය, පරිසර තත්ත්වය, යටිතල පහසුකම් පැවතීම, අනාගත ජනගහනය හා ආර්ථික කටයුතු මඟින් ඇතිකරන ඉල්ලුම යන කරුණු මනාව සැළකිල්ලට ගෙනය.

**2.2.8 රැකියා අවස්ථාවල පුළුල් තෝරාගැනීමක්**

ඍජු හා වක්‍ර රැකියා අවස්ථාවන් සංඛ්‍යාව වැඩි කිරීමේ ක්‍රියාමාර්ගයක් ලෙස කර්මාන්ත සඳහා අවශ්‍යවන ඉඩම් හා අනෙකුත් යටිතල පහසුකම් සැපයීමට හැකි ස්ථාන යොදාගැනීමට යෝජනා කෙරේ.

**2.2.9 සුහුරු පහසුකම්**

සුහුරු පහසුකම් දේශීය හා විදේශීය වශයෙන් පුද්ගලයින් හා ස්ථාන අතර සම්බන්ධතාවය වැඩිකිරීම සඳහා අවශ්‍ය වේ. මේ සඳහා උසස් ගුණාත්මක බවකින් යුත් සන්නිවේදන යටිතල පහසුකම් අවශ්‍ය වේ. දැනට ඉදිරියට යමින් පවතින "සුහුරු නගර" සංකල්පය මේ සම්බන්ධයෙන් ඇති ප්‍රගතිශීලී ආරම්භයකි. තොරතුරු තාක්ෂණයේ හා ඩිජිටල් යටිතල පහසුකම්වල සිදුවන සීඝ්‍ර දියුණුවට අනුව නුදුරු අනාගතයේදී සුහුරු පහසුකම් සඳහා දැරීමට සිදුවන සාපේක්ෂව ඉහළ පිරිවැය එතුළින් ලබාගන්නා තොරතුරු සඳහා වන පහසු ප්‍රවේශය, ස්වයංක්‍රීය මහජන සේවාවන්, පාලනයේ ඇති පාරදෘශ්‍ය භාවය ආදී කරුණු මත සාධාරණීකරණය කළ හැකිවනු ඇත.

මේ අනුව 2020-2025 කාලසීමාව තුල සම්පූර්ණ සුහුරු පරිසරයන් සියළුම නාගරික ජාලයන් (නාගරික ජාල 4), විසල් නාගරිකයන් හා ප්‍රධාන නගරයන්හි ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. ඉන් පසුව මේවා අනෙකුත් ප්‍රදේශ දක්වා ද පුළුල් කල හැකි වනු ඇත.

**2.2.10 හරිත ගොඩනැගිලි පරිසරය**

හරිත ගොඩනැගිලි පරිසරය සියලු භෞතික සංවර්ධන කටයුතු වල තේමාව බවට පත්කල යුතුය. එසේම නාගරික ප්‍රදේශ තුළ සිදුවන සංවර්ධන කටයුතු වල පාරිසරික තිරසාරත්වය තහවුරු කිරීම සඳහා 2020 වන විට "හරිත ගොඩනැගිලි ක්‍රමවේද" ගොඩනැගිලි, මහාමාර්ග, විනෝදාස්වාද පහසුකම් ආදී සියලු භෞතික සංවර්ධන කටයුතු සඳහා අත්‍යවශ්‍ය කිරීමට යෝජනා කෙරේ.

සියලුම නාගරික ප්‍රදේශයන්හි කරනු ලබන උපාය මාර්ගික ව්‍යාපෘති සැලසුම්කිරීම් හා ක්‍රියාත්මක කිරීම් සඳහා පහත සඳහන් පොදු ප්‍රතිපත්ති යොදාගැනීමට යෝජනා කෙරේ.

1. නාගරික මට්ටමින් තෝරාගන්නා ලද උපාය මාර්ගික ස්ථානයන්හි විවෘත පොකුණු හා භූගත ජල ටැංකි ආදී වැසි ජල එකතුකිරීමේ ස්ථාන ප්‍රතිස්ථාපනය කිරීම.
2. තෝරාගන්නා ලද ප්‍රදේශයන්හි සුදුසු තලක්කටු (roof tops) මත සූර්ය බලශක්ති නිෂ්පාදන ඒකක ස්ථාපනය කිරීම.
3. සහාධිපත්‍ය හා අනෙකුත් ජනාවාස සංවර්ධනයේදී, කළමනාකරණය, තේරීම, එකතුකිරීම හා ප්‍රතිචක්‍රීකරණය කරන ආකාර සහිතව ප්‍රජා මූලික කසල කළමනාකරණ ව්‍යාපෘති ඇති කිරීම.
4. නාගරික ප්‍රදේශ තුළ අදාල සංවර්ධන සැලසුම් වලින් නිරූපිත වන පරිදි අවශ්‍ය අවම ගොඩනැගීම් රහිත ප්‍රදේශ හා හරිත ඉඩ ප්‍රමාණය දැඩිව පවත්වාගෙන යාම.
5. නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් ක්‍රියාත්මක කර ඇති හරිත ගොඩනැගිලි සහතික කිරීමේ ක්‍රියාවලිය සියලු ආකාරයේ සංවර්ධන කටයුතු සඳහා පුළුල් කිරීම.

**2.3 ප්‍රවාහන සංවර්ධනය**

**2.3.1 අරමුණ**

ප්‍රවාහන සංවර්ධන උපක්‍රම

2009 දී කැබිනට් අමාත්‍යවරුන් විසින් අනුමත කර ඇති, ප්‍රවාහන හා ගුවන්සේවා අමාත්‍යාංශය විසින් යාවත්කාලීන කර ඇති ජාතික ප්‍රවාහන ප්‍රතිපත්තියේ අනුපූරක අංගයක් ලෙස පහත සඳහන් අරමුණු මෙම සැලසුම මගින් යෝජනා කරනු ලැබේ.

**2.3.1.1 ක්‍රියාකාරී ප්‍රවේශය**

සම්බන්ධතාවය, ප්‍රවේශකත්වය හා සංචලතාවය යෝජිත ඉඩම් භාවිතාවන් හා ජනාවාස ව්‍යාප්ති රටාව සඳහා බලපානු ලබන මූලික සාධක වේ. එබැවින් වඩා යහපත් ඉඩම් භාවිතාවක් සඳහා සේම තිරසර ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය සඳහා ප්‍රවාහන සැලසුම්කරණය හා ඉඩම් භාවිතයන් සැලසුම්කරණය එකිනෙකට අත්වැල් බැඳගෙන ක්‍රියාකල යුතුවේ. තිරසර ප්‍රවාහන සැලසුම්කරණය මගහැරීම, විතැන්කිරීම හා වැඩිදියුණු කිරීම යන මූලිකාංග 3 මත පදනම් ව ඇත. මේ සඳහා වන ක්‍රියාකාරී ප්‍රතිපත්තිමය ප්‍රවේශය අනාගත ඉඩම් භාවිතයන් හා ජනාවාස ව්‍යාප්තිය අභිමත දිශානතියට යොමුකිරීමට අවශ්‍ය සහය දැක්වීම පමණක් නොව වර්තමානයේ ඉල්ලුම පදනම් කොට ගෙන කරනු ලබන ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා ආයෝජනයන් වලට වඩා පෞද්ගලික මාධ්‍යයේ සිට පොදු ප්‍රවාහනය දක්වා ප්‍රවාහන මාධ්‍ය විතැන් කිරීම ධෛර්යයමත් කිරීමට සහය දැක්වීමත්, කාර්යක්ෂමතාව හා විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමත් කල යුතු වේ.

**2.3.1.2 පවතින යටිතල පහසුකම්වල ප්‍රශස්ථ භාවිතය**

මගී හා භාණ්ඩ යන ප්‍රවාහන මධ්‍යයන් දෙකෙහි හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සඳහා සිදුකරන විශාල ආයෝජනයන් මගින් පවතින ආර්ථික තත්වය යටතේ ඉදිරි අවුරුදු 20ත් 30ත් අතර කාලය තුලදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත අමතර ණය බරක් ඇති කරනු ඇත. එබැවින් ප්‍රවාහන පහසුකම් සැපයීම සඳහා බොහෝ ප්‍රායෝගික වන විකල්පය වනුයේ අවම ආකලනයන් මත පවතින ප්‍රවාහන පහසුකම් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරගැනීමයි.

**2.3.1.3 ආර්ථික සාධ්‍යතාවයක් ඇති ව්‍යාපෘති වල ආයෝජනය කිරීම**

වේගයෙන් පරිණාමය වන තාක්‍ෂණය හා මිනිස් ජීවන රටාව සමඟ ගමන් බිමන් යාමේ රටාව මෙන්ම මගින් හා භාණ්ඩ ප්‍රවාහන මාධ්‍යන් ද මෙම සැලසුමින් අභිමත කාලසීමාව තුල දී වෙනස්විය හැකි අතර ඒ නිසා මෙම පරිණාමික තත්වයේදී සියලුම ආයෝජනයන්ට සුදුසුම උපයෝජනයන් ලබා නොදීම හා අපේක්ෂිත ප්‍රථිලාභ අත්කර නොදීමේ අවධානමට මුහුණදීමට සිදුවේ. එබැවින් ප්‍රවාහන සංවර්ධනය සඳහා සිදුකරන ආයෝජන ව්‍යාපෘතියක් බවට පත්කිරීමට පෙර පුළුල් වූ ශක්‍යතා අධ්‍යනයන්ට ලක්කිරීම අතයාවශ්‍යය.

**2.3.1.4 පාරිසරික තිරසාරතාවයෙන් යුත් මාධ්‍යන් තෝරා ගැනීම**

ශ්‍රී ලංකාවේ හරිතාගාර වායු විමෝචනය සිදුකරන ප්‍රධාන අංශයක් ලෙස ප්‍රවාහන ක්‍ෂේත්‍රය හඳුනාගෙන ඇත. අවසරලත් හරිතාගාර වායු විමෝචන මට්ටමට අනුකූල වීමට හා පරිසරයේ තිරසර සංරක්‍ෂණය සඳහා පෞද්ගලික වාහන භාවිතය අවමකිරීම හා පොදු ප්‍රවාහනය ප්‍රචලිත කිරීම අනාගත සංවර්ධන කටයුතු වල ප්‍රතිපත්තියක් විය යුතුය. මේ අනුව පවතින ප්‍රවාහන මාධ්‍යන් අතරින් දුම්රිය ප්‍රවාහනයට ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව පළමු තැන ලැබිය යුතු වේ.

**2.3.1.5 කාර්යක්‍ෂමතාවය හා සුවපහසුව සඳහා නවීන තාක්‍ෂණය හඳුන්වාදීම**

ආර්ථික ශක්‍යතාව පිළිබඳව සලකා බලනු ලැබුවත් ආරක්‍ෂාව හා විශ්වසනීයත්වය සියලු ප්‍රවාහන මාධ්‍යන් සඳහා වැදගත් වේ. එබැවින් ස්වයංක්‍රිය වාහන, විද්‍යුත් ප්‍රවේශපත්‍ර, අන්තර් ප්‍රවාහන මාධ්‍ය සම්බන්ධීකරණ වැනි කාර්යන්හි කාර්යක්‍ෂමතාවය වැඩිකිරීම සඳහා පවතින තාක්‍ෂණය හඳුන්වාදිය යුතු අතර එම තාක්ෂණික හඳුන්වා දීම් භාවිතාකරන්නන්ගේ සුවපහසුවට හා මගී හා ප්‍රවාහනය සංවර්ධන කටයුතු වලට බාධාවක් නොවිය යුතුය.

**2.3.1.6 සමානාත්මක හා සාධාරණ ආයෝජනය**

අන්තර් කලාපීය සම්බන්ධතාවයන් හි සේම සම්බන්ධතාවයන්හි ආරම්භයේ සිට අවසානය දක්වා සමාන සැලකිල්ලක් තිබිය යුතුය. ප්‍රාදේශීය හා නාගරික මට්ටම් පිළිබඳව නොසලකා අන්තර් කලාපීය ප්‍රවාහන යටිතල පහසුකම් සඳහා මහා පරිමාණ ආයෝජනයන් සිදුකරනු ලැබුවත් එමගින් අපේක්ෂිත ප්‍රතිලාභ රටට අත්කර දෙනු නොලැබේ. එසේම පදිකයින්, පාපැදිකරුවන් හා රථවාහන සඳහා ප්‍රමුඛතාවය අනුව සැලකිල්ලක් දැක්විය යුතුවේ. ප්‍රවාහන ප්‍රතිපත්තියේදී පදිකයින් හා පාපැදිකරුවන් සඳහා අවධානයන් ලබාදී තිබියදීත් වර්තමාන මාර්ග සංවර්ධන ව්‍යාපෘති වලදී අඩු අවධානයක් ඔවුන් සඳහා ලබාදී තිබෙන බව කණගාටුවෙන් වුවද සඳහන් කළ යුතුය.

**2.3.2 දුම්රිය ප්‍රවාහනය**

සියලු ප්‍රවාහන මාධ්‍යන් අතරින් අන්තර් පළාත් භාණ්ඩ හා මගී ප්‍රවාහනය සඳහා මෙන්ම නාගරික ප්‍රවාහනය සඳහා ද දුම්රිය ලාභදායී ප්‍රවාහන මාධ්‍යක් වන බවට අධ්‍යනය කර ඇත. අනාගත නාගරික සාමූහිතයන් ලෙස හඳුනාගෙන ඇති බොහෝ ප්‍රදේශ දැනටමත් දුම්රිය මාර්ග සම්බන්ධතාවයන්ගෙන් හා ආශ්‍රිත පහසුකම් වලින් සමන්විතව ඇත. එබැවින් නාගරික ජාල හතර (4) තුළ දුම්රිය මාර්ගයන්ට අනෙකුත් ප්‍රවාහන මාධ්‍යන්ට වඩා ආකාර්ශනීය බවක් අපේක්‍ෂා කෙරේ. මෙම අභිමතාර්ථය සම්පූර්ණ කිරීම පිණිස පවතින දුම්රිය මාර්ග පද්ධතිය විශිෂ්ඨ ලෙස වැඩිදියුණු කිරීමට අවශ්‍ය වේ. දුම්රිය ප්‍රවාහනය

අලුත්ගම හා වේයන්ගොඩ අතර දුම්රිය මාර්ගය විද්‍යුත්කරණය කිරීමට ජාතික දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ සැලසුම මඟින් මේ වන විටත් යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතිය නැගෙනහිර - බටහිර සංවර්ධන ජාලය සඳහා අනුපූරකයක් වේ. තවද මෙහි ඉදිරි ක්‍රියාමාර්ගයක් ලෙස 2025ට පෙර මෙම විදුලි දුම්රිය මාර්ගය කුරුණෑගල දක්වා දීර්ඝ කිරීමට යෝජනා කරනු ලැබේ. දුම්රිය මාර්ග වැඩිදියුණු කිරීමේ ප්‍රධාන සැලසුමට මඟින් කුරුණෑගල හා හබරණ, දඹුල්ල හරහා සම්බන්ධකිරීමට යෝජනා කර ඇත. මෙම යෝජනාව මඟින් යෝජිත ජාල (Corridor) සංවර්ධනයට මනා පිටුබලයක් ලබාදේ. 2030 වන විට නැගෙනහිර - බටහිර සංවර්ධන ජාලය මඟින් සම්බන්ධිත

ස්ථාන අතර සම්බන්ධතාවය නගාසිටුවීමට උක්ත සඳහන් දුම්රිය මාර්ගය මෙන්ම හබරණ සිට ත්‍රිකුණාමලය දක්වා වන පවතින දුම්රිය මාර්ගයද විදුලි දුම්රිය මාර්ගයක් ලෙස වැඩිදියුණු කිරීමට යෝජනා කෙරේ.

දකුණු සංවර්ධන ජාලයේ ඇතිවන නාගරික සංවර්ධනයට පහසුකම් සැපයීම පිණිස අලුත්ගම හා මාතර අතර පවතින දුම්රිය සේවාව වැඩි දියුණු කළ යුතු වේ. තවද මෙම දුම්රිය මාර්ගය මාතර සිට හම්බන්තොට දක්වා 2030 වන විට දීර්ඝ කිරීමට දැනටමත් යෝජනා කර ඇත. 2025 වන විට උතුරු නාගරික ජාලයේ කිලිනොච්චිය හා කන්කසන්තුරේ අතර දුම්රිය සේවාව වේගවත් කළ යුතු වේ. උක්ත සඳහන් කරන ලද කුරුණෑගල හා හබරණ අතර නව දුම්රිය මාර්ග සම්බන්ධතාවයට හබරණ හා අනුරාධපුරය අතර අමතර සම්බන්ධතාවයක් අතිරේකව එක්කල හැකිය. තවද මහව හරහා පොල්ගහවෙල සමග තිබෙන සම්බන්ධතාවය 2030 දක්වා හා ඉන් පසුව ද ඇතිවන ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් වනු ඇත.

නැගෙනහිර ජාලයේ වාලච්චේන හා මඩකලපුව අතර දුම්රිය සේවාව වැඩි දියුණු කිරීමට අවශ්‍ය වන අතර හබරණ සමග ඇති වත්මන් දුම්රිය මාර්ග සම්බන්ධතාවය 2030 දක්වා ඇතිවන ගමන් අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් වනු ඇත. මෙම සංවර්ධන ජාලයේ දුම්රිය මාර්ග සම්බන්ධතාවය වැඩි දියුණු කිරීම පිණිස පවතින දුම්රිය මාර්ගයම 2025 වන විට කල්මුනේ හරහා අම්පාර දක්වා දීර්ඝ කර ප්‍රතිස්ථාපනය කිරීමට යෝජනා කෙරේ.

මීට අමතරව පවතින දුම්රිය මාර්ග ජාලයේ අනෙකුත් කොටස් ද අන්තර් කලාපීය ප්‍රවාහන අවශ්‍යතාවය සැපිරීමට වැඩි දියුණු කළයුතු වේ. එසේම පවතින දුම්රිය මාර්ග පද්ධතියට අමතරව, 2025 වන විට කුරුණෑගල හා මහනුවර අතර ද, 2030 වන විට වැල්ලවාය හා මහියංගනය හරහා හම්බන්තොට හා පොළොන්නරුව අතර ද, 2030 වන විට රත්නපුර හා ඇඹිලිපිටිය හරහා කොළඹ හා හම්බන්තොට අතර ද, 2030න් පසු අම්පාර හා වැල්ලවාය අතර ද නව දුම්රිය මාර්ග පද්ධතියක් යෝජනා කෙරේ. කෙසේ වෙතත් ඒ මත දැරිය යුතු අධික ආයෝජනයන් නිසාවෙන් හා එමගින් අපේක්ෂිත සේවා මට්ටම අනුව මෙම දුම්රිය මාර්ග පද්ධතිය විද්‍යුත්කරණය වහා සිදු විය යුතු අවශ්‍යතාවයක් නොවේ.

උක්ත සඳහන් සංවර්ධන කටයුතුවලට අතිරේකව පවතින දුම්රිය මාර්ගවලට අමතර මාර්ග එකතුකිරීම වැනි පවතින දුම්රිය යටිතල පහසුකම් සඳහා එකතුකිරීම් සිදුකිරීම දුම්රිය ප්‍රවාහනයේ කාර්යක්ෂමතාවය වැඩිකිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. කොළඹ - රාගම, කොළඹ - හෝමාගම, හා කොළඹ - මොරටුව ආදී එවැනි ව්‍යාපෘති කිහිපයක් පිළිබඳව දුම්රිය දෙපාර්තමේන්තුව දැනටමත් කරුණු සලකාබලමින් සිටී.

බලධාරීන්ගේ ඉක්මන් අවධානය යොමුවීම අවශ්‍ය තවත් එක් පැතිකඩක් ලෙස මගී සේවාවන් දැක්විය හැකිය. ඉලෙක්ට්‍රොනික ප්‍රවේශපත්‍ර, අන්තර්ජාලය හරහා වෙන්කිරීම්, පෞද්ගලික සේවාවන් ආදී මගීන් සඳහා නවීකරණය වූ සේවාවන් සමග සුවදායී පහසුකම්, විධිමත් රැඳීසිටීමේ ප්‍රදේශ, සුහුරු පරිසර වලින් යුතු වන පරිදි දුම්රිය ස්ථානවල පහසුකම් නවීකරණය මීට ඇතුලත් වේ. දුම්රිය සේවාවෙහි කාර්යක්ෂමතාවය ඉහල නංවන මෙවැනි වැඩිදියුණු කිරීම් මගීන් ගෙන් සැළකිය යුතු කොටසක් මහා මාර්ග පදනම් ප්‍රවාහන මාධ්‍යන්ගේ සිට දුම්රිය වෙතට ආකර්ශණය කරනු ඇත.

### 2.3.3 මහා මාර්ග යටිතල පහසුකම්

මාර්ග සංවර්ධනය

ශ්‍රී ලංකාවේ මධ්‍ය හා පළාත් රජය මගින් නඩත්තුකර පවත්වාගෙන යනු ලබන පොදු මහා මාර්ග වල දිග කිලෝමීටර් 30,000 ඉක්මවන බව නිරීක්ෂණය වී ඇත. කලාපයේ ඇති අනෙකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ මාර්ග ඝනත්වය ඉහල මට්ටමක ඇත. නමුත් මෙම මාර්ග වල වැඩිදියුණු කිරීම් හා කාලෝචිත පරිදි නඩත්තුකර පවත්වාගැනීම (විශේෂයෙන්ම පළාත් මාර්ගවල) සතුටුදායක මට්ටමක නොපවතී. මෙම තත්වය මධ්‍යයේ උවද මහාමාර්ග ප්‍රවාහන ඉල්ලුමින් 90%කට වඩා සපුරනු ලබන අතර එය සබඳතාවයන්හි ආරම්භයේ සිට අවසානය දක්වා ඇති වඩාත් පහසුම හා නම්‍යශීලීම ප්‍රවාහන මාධ්‍ය විකල්පය වේ. එහෙත් වැඩිවන මහා මාර්ග පද්ධතියේ භූමි ප්‍රමාණය නඩත්තු කිරීම අර්ථිකයට වැඩි පිරිවැයක් එක්කරනු ලැබේ. මෙවැනි තත්වයන් යටතේ පිරිමැසුම් දායක හා තිරසර මාර්ග ප්‍රවාහන උපාය මාර්ගයක් සඳහා මාර්ග යටිතල පහසුකම් ප්‍රමුඛතාගත කිරීම හා පවතින යටිතල පහසුකම් වලින් ප්‍රශස්ත ලෙස ප්‍රයෝජන ලබාගැනීම අත්‍යවශ්‍යව ඇත.

අධිවේගී මාර්ග යටිතල පහසුකම් සංවර්ධනය සාපේක්ෂ වශයෙන් වඩාත් වියදම්කාරී වුවත් එමගින් වේගවත් ගමනාන්තර සම්බන්ධතාවයක් ලබාගැනීමට හැකිය. දකුණු අධිවේගී මාර්ගය, කොළඹ- කටුනායක අධිවේගී මාර්ගය, පිටත වටරවුම් මාර්ගය හා වර්තමානයේ ක්‍රියාත්මක වෙමින් පවතින මාතර- හම්බන්තොට, කොළඹ-කුරුණෑගල හරහා දඹුල්ල සම්බන්ධ කරන මාර්ග ව්‍යාපෘති මගින් යෝජිත සංවර්ධන ජාලයේ ස්ථාන අතර සම්බන්ධතාවයට හා වේගවත් සංචලතාවකට පහසුකම් සලසනු ලැබේ.

මෙම සැලසුමේ දැක්ම මගින් යෝජනා කරන පවතින සංචලන රටාව හා අනාගත නාගරිකරණ සංවර්ධන දැක්ම පිළිබඳව සිදුකර ඇති පුරෝකථනයන් මගින් අපේක්ෂිත පරිදි අනාගත නාගරික සංවර්ධනය, ජනාවාස ව්‍යාප්තිය, කාර්මික ස්ථාන, සංචාරක කටයුතු ප්‍රවර්ධනය හා අනෙකුත් ආශ්‍රිත සංවර්ධන කටයුතු නිරූපනය කරන පරිදි දැනට පවතින අධිවේගී මාර්ගයන් හා ඉදිකරමින් පවතින අධිවේගී මාර්ග ව්‍යාපෘති (නම් වශයෙන් ගතහොත් කොළඹ-හම්බන්තොට, කොළඹ - දඹුල්ල හා පිටත වටරවුම් මාර්ගයේ අවසන් අදියර) 2030 වන තෙක් මහා මාර්ග යටිතල පහසුකම් අවශ්‍යතාවය සැපිරීම සඳහා ප්‍රමාණවත් වනු ඇත.

කෙසේවෙතත් අන්තර් පළාත් සම්බන්ධතාවය වැඩිදියුණු කිරීමට හා වේගවත් ප්‍රවේශකත්වයකට පහසුකම් සැපයීම සඳහා යෝජිත අධිනාගරික ප්‍රදේශ හා ප්‍රධාන නාගරිකයන් සම්බන්ධකරන පවතින මහාමාර්ග පද්ධතිය ප්‍රමුඛතාවය අනුව වැඩිදියුණු කර නඩත්තු කළ යුතු වේ. හම්බන්තොට-වැල්ලවාය- මඩකලපුව (A2) මාර්ගය, මීගමුව- පුත්තලම (A3) මාර්ගය, දඹුල්ල- ත්‍රිකුණාමලය (A6) මාර්ගය, දඹුල්ල- යාපනය (A9) මාර්ගය, මහනුවර- පුත්තලම (10) මාර්ගය, හබරණ-පොළොන්නරුව-මඩකලපුව (A11) මාර්ගය, ත්‍රිකුණාමලය-පුත්තලම (A12) මාර්ගය, මැදවච්චිය-මන්නාරම (A14) මාර්ගය හා මාන්කුලම්- මුලතිව් (A34) මාර්ගය හඳුනාගන්නා ලද ප්‍රමුඛතා මහා මාර්ග වේ. මෙම මාර්ග සම්බන්ධතාවයන් (අනෙකුත් මහා මාර්ග වල ද) නාගරික ප්‍රදේශ හරහා ගමන් කිරීමේදී නිරන්තරයෙන් දැකිය හැකි ගැටළුවක් වනුයේ හිර කපොලු (bottle-necks) ඇතිවීමයි. පීත්තපටියක් ආකාරයෙන් (ribbon developments) මහාමාර්ග දිගේ ඇතිවන සංවර්ධනය මගින් ඇතිවන ප්‍රධාන වීථි නාගරික ප්‍රදේශවල තදබදය හා එහි ප්‍රධාන ගලායාම් වේගය අඩුකරනු ලැබේ. මෙම ගැටළුව පිළිබඳව මාර්ග සංවර්ධනයෙන් හෝ ප්‍රවාහන ඉංජිනේරු විද්‍යාව මගින් පමණක් කතාකළ නොහැකි නමුත් පුළුල් හා සම්බන්ධිත නාගරික සංවර්ධන සැලසුම් මගින් හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරී නාගරික සංවර්ධන උපාය මාර්ග මගින් කතාකළ හැකිය.

අත්‍යාවශ්‍යම වූ හේතුවක් රහිතව නව මාර්ග ඉදිකිරීම වෙනුවට පළාත් හා ප්‍රාදේශීය මට්ටමින් පවතින මාර්ග කාලානුරූපීව නඩත්තු කිරීම හා පවතින මහා මාර්ග ප්‍රශස්ත ලෙස භාවිතා කිරීම මර්ග සංවර්ධනයේ ප්‍රතිපත්තියක් විය යුතුය.

**2.3.4 ගුවන් සේවාව**

ශ්‍රී ලංකාවේ ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය (2016) මගින් එම සේවාවේ අනාගත දිශානතිය හා තත්වයන් පිළිබඳව කරනු ලැබ ඇති දැක්වීම් අනුව ශ්‍රී ලංකාව දකුණු ආසියානු කළාපය තුළ ලොව පුරා පැතිරුණු සුපිරි ගුවන් සේවාවක් සපයනු ලබන ප්‍රමුඛ ගුවන් සේවාවක් හා ගුවන් ප්‍රවාහන මධ්‍යස්ථානයක් බවට පරිවර්තනය වනු ඇත. එසේම හඳුනාගෙන ඇති පරිදි කාලීනව සිදුකරන ගුවන් ගමන් කළමනාකරණ නවීකරණය කිරීම් හා ගුවන්තොටුපල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා පුළුල් කිරීම මගින් වැඩිවන ගුවන්ගමන් අවශ්‍යතාවයන්ට අනුව අදාළ සැපයුම් ලබාදීම හා ගුවන් පථ හා ගුවන් තොටුපල කාර්යක්‍ෂම ලෙස භාවිතා කිරීම ගැටළුකාරී වේ. ගුවන් සේවාව

ශ්‍රී ලංකා සමාජයේ වැඩිවන සමෘද්ධිමත් බව, දියුණුවන ව්‍යාපාරික පරිසරය හා සංචාරක කර්මාන්තයේ ඇති වන දියුණුව මගින් ගුවන්තොටුපල හා ගුවන් සේවා පහසුකම් සඳහා ඉහළ ඉල්ලුමක් ඇති වනු ඇත. සිදුකර ඇති පුරෝකථනයන්ට අනුව බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පවතින සේවා සැපයීමේ ශක්‍යතාව වැඩි වන ගුවන් ගමන් හා ගුවන් මගී ධාරිතාවය අනුව ඉතා කෙටිකාලයක් තුළදී උපරිම මට්ටමට පැමිණෙනු ඇත. ඒ අනුව ගොඩබැස්සවීම්, මගී පර්යන්ත හා තොගබඩු හැසිරවීම් පහසුකම් පුළුල් කිරීමේ සැලසුම් දැනටමත් ආරම්භ කර ඇත. එමෙන්ම කටුනායක ගුවන්තොටුපල අවට ප්‍රදේශය නවීන ගුවන් නගරයකට අවශ්‍ය සියලු පහසුකම් සමග සංවර්ධනය කිරීමට යෝජනා කර ඇත. මෙය යෝජිත නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය තුළ පිහිටි මීගමුව - කටුනායක විසල් නාගරිකය සඳහා උත්ප්‍රේරකයක් වනු ඇත.

මීට අමතරව සිදුකර ඇති අති විශාල ආයෝජනයන් මත හා අන්තර් ජාතික ගුවන් සේවා මාර්ගයක ස්ථානගතව ශ්‍රී ලංකාවේ උපාය මාර්ගික ස්ථානයක පිහිටි මත්තල, මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලේ ඇති පහසුකම් පිළිබඳව නොසලකාහැරීම ද සිදු කල නොහැක. මෙමගින් කිසියම් ප්‍රයෝජනයක් ලබා ගැනීම සඳහා හා සිදුවන දිරාපත්වීම් වැළැක්වීම පිණිස මෙහි මෙහෙයුම් කටයුතු ඉක්මනින් ආරම්භ කළ යුතුය.

මෙම ජාත්‍යන්තර ගුවන්තොටුපල දෙක මගින් නුදුරු අනාගතයේදී ඇතිවන ජාත්‍යන්තර ගුවන්ගමන් අවශ්‍යතාවය සපුරාගැනීමට සහයතාවය ලබාගත හැකි වනු ඇත. තවද පවතින ව්‍යාපාරික සංවර්ධන උපනතිය තවදුරටත් පුළුල් වුවහොත් ඉදිරි වසර 10 ඇතුළත ගුවන් ගමන් සඳහා ඇති වන ඉල්ලුමෙහි වැඩිවීමක් අපේක්‍ෂා කළ හැකි වන අතර තෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපලක අවශ්‍යතාවය ද මතුවනු ඇත. එවැනි තත්වයකදී පුරෝකථනය කර ඇති භෞතික සංවර්ධනය සමඟ අනුකූල වන, පවතින සම්පත් ප්‍රශස්ථ ලෙස උපයෝජනය කරන, පවතින සියලු විකල්පයන් අතරින් ජාත්‍යන්තර ගුවන්තොටුපලක් දක්වා වැඩිදියුණු කිරීමට සුදුසුතම අපේක්ෂිත ගුවන්පථය හිගුරක්ගොඩ වනු ඇත. මෙම ගුවන්තොටුපල ප්‍රදේශය යෝජිත නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය තුළ ප්‍රධාන යටිතල පහසුකම්

වලට සමීපව පිහිටන බැවින් හිගුරක්ගොඩ ගුවන්තොටුපල මගින් සුදුසු සම්බන්ධතා සහිතව අවශ්‍ය ප්‍රදේශ වලට සේවා සැපයිය හැකිය.

ජාතික සිවිල් ගුවන් සේවා ප්‍රතිපත්තිය මගින් හඳුනාගෙන ඇති පරිදි අඩු පහසුකම් සහිත හෝ දුරස්ථ ප්‍රදේශවල ගුවන්තොටුපල සංවර්ධනය කිරීම රැකියා හා ආර්ථික කටයුතු ඇතිකිරීම, ජාතික ආර්ථිකයට සමාජ සංයෝජනයක් සහිත මනා සම්බන්ධතාවයක් ඇතිකරයි. බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපල හා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපල යන ගුවන්තොටුපලවල සංවර්ධනයට සමගාමීව අභ්‍යන්තර ගුවන් ගමන් සඳහා ඇතිවන ඉල්ලුම ද වැඩි වනු ඇතැයි අපේක්ෂා කළ හැකිය. එම අවශ්‍යතාවයන් සපුරලනු වස් රත්මලාන, අම්පාර, ත්‍රිකුණාමළය, පුත්තලම, පලාලි හා අනුරාධපුරයේ පිහිටි පවතින අභ්‍යන්තර ගුවන්තොටුපල අවශ්‍ය මගී හා භාණ්ඩ හැසිරවීමේ පහසුකම් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කෙරේ. කෙසේ නමුත් මෙම සංවර්ධන කටයුතු පුළුල් වූ ගමන් ඉල්ලුම් විශ්ලේෂණයන් හා ශක්‍යතා අධ්‍යනයන් වලින් පසුව පමණක් සිදු කළ යුතු වේ.

### 2.4 භෞතික යටිතල පහසුකම් සැපයීම

#### 2.4.1 අරමුණ

භෞතික යටිතල පහසුකම් සංවර්ධනය

සැලසුම්ගත මානව ජනාවාස සංවර්ධනය, සුවබර දිවිපෙවෙතක් හා මනා ලෙස ක්‍රියාත්මක වන ආර්ථික කටයුතු සඳහා උපයෝගීතාවයන් හා සේවාවන් ඉතා වැදගත් වේ. එබැවින් අභිමත සංවර්ධන රටාව යථාර්ථවත් කරගැනීමේ දී එවැනි උපයෝගීතාවයක් ලබාදෙන නල ජල සැපයුම, වැසි ජල බැහැරකිරීමේ කාණු පද්ධති, පොදු පල්දෝරු කාණු, ද්‍රව හා ඝන අපද්‍රව්‍ය එකතුකිරීමේ හා බැහැරකිරීමේ පද්ධති වැනි භෞතික යටිතල පහසුකම් ප්‍රධාන කාර්යභාරයක් ඉටුකරනු ලැබේ. ඒ අනුව යෝජිත භූමියේ හා ජනාවාස උපායමාර්ග වලට ඉදිරියේදී සහය දැක්වීම සඳහා පහත අරමුණු සකස්කර ඇත.

##### 2.4.1.1 භාවිතකරන්නන් හා සේවා සපයන්නන් සඳහා ඇති පහසුකම

භාවිතකරන්නන්ට පහසුකම් සඳහා ඇති ප්‍රවේශකත්ව මට්ටම සේම සේවා සපයන්නන්ට ඒ සඳහා ලඟාවීමේ හැකියාව ද සාර්ථක සේවා සැපයීමක් සඳහා වැදගත් වේ. ජනාවාස රටාව මගින් මේ සඳහා සෘජු බලපෑමක් ඇතිකරනු ලැබේ.

##### 2.4.1.2 උපාය මාර්ගික හා ප්‍රායෝගික ආයෝජන


මේ වන විට දිවයිනේ සමස්ථ ජන ගහනයෙන් 95%කට වඩා වැඩි පිරිසකට විදුලි හා මාර්ග යටිතල සඳහා ප්‍රවේශවිය හැකි බවට නිරීක්ෂණය වී ඇත. සැපයුම් අඛණ්ඩතාව, මෙහෙයවීම, විධිමත් නඩත්තුව හා පහසුකම්, වර්ධනය කිරීම මෙම සැපයුම් සම්බන්ධව ඇති ප්‍රධාන ගැටළු වේ. වර්තමානයේදී ජල සැපයුම් හා ජලාපවහන සේවාවන් දිවයිනේ බොහෝ ප්‍රදේශවල සීඝ්‍රයෙන් වැඩිදියුණු කරමින් පවතී. නව යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සඳහා හා පවතින යටිතල පහසුකම් වර්ධනය කිරීම සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදුවන බැවින් පවතින මූල්‍ය සම්පත් සුදුසුම ලෙසට භාවිත කිරීම සඳහා ආයෝජනයන් සඳහා ප්‍රශස්ථ ප්‍රතිඵල ලබාදෙන උපාය මාර්ගික ව්‍යාපෘති හඳුනාගත යුතුය.

##### 2.4.1.3 ප්‍රශස්ථ උපයෝගීතාවය හා පාරිසරික තිරසාරීත්වය

සේවාවන් සැපයීමේදී සේවාවන් සඳහා ජනතාවගෙන් ඇති ඉල්ලුම හා සේවාවන්ගේ පැවැත්ම සඳහා අවශ්‍යකරන අනෙකුත් ක්‍රියාකාරකම් අනුව සේවා සපයන ආයතන විසින් අදාළ සේවාවන් හි ප්‍රමුඛතාවය තක්සේරු කලයුතු වේ.

එසේම මෙම සේවා උපයෝජනයන් සංවර්ධනය අභිමත දිශානතියට යොමුකරන මාර්ගෝපදේශකයක් වන බැවින් සේවාවන් සැපයීම මගින් අදාළ ස්ථානවල භෞතික සංවර්ධනය වේගවත් කළ හැකිවාක් මෙන්ම, සේවාවන් නොසැපයීම මගින් පාරිසරික සංවේදී ප්‍රදේශ හා රක්ෂිත ප්‍රදේශ මනා ලෙස ආරක්ෂා කරගැනීමටද හැකිවේ.

රූපසටහන 5.5 : යෝජිත යටිතල පහසුකම් සැපයීමේ ආකෘතිය 2050



### 2.4.2 ජල සැපයුම් හා ජලාපවාහනය

ජල සැපයුම් හා ජලාපවාහනය

ජලය යනු ගෘහස්ථ හා ව්‍යාපාරික භාවිතයන්, කෘෂි හා වාරිමාර්ග කටයුතු, ස්වභාවික පරිසර පද්ධතිවල තිරසාරීත්වය යන ත්‍රිවිධ අරමුණු සඳහා වැදගත් වන වෙළඳ වටිනාකමක් සහිත භාණ්ඩයක් වේ.

නාගරික ප්‍රදේශවල ගෘහස්ථ හා ව්‍යාපාරික භාවිතයන් සඳහා ඇති ජල ඉල්ලුම වර්තමානයේදී සපයනු ලබනුයේ ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගිනි. ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මගින් දැනටමත් 2020 සැපයීම් අවශ්‍යතාවයන් අරමුණු කරගනිමින් ජලසම්පාදන හා ජලාපවාහන ව්‍යාපෘතීන් ගණනාවක් ක්‍රියාවට නංවා ඇති නමුත් මෙම බොහෝ ව්‍යාපෘති ක්‍රියාත්මක වනුයේ ප්‍රාදේශීය හා කලාපීය මට්ටමිනි. මීට අමතරව අනාගත භෞතික සංවර්ධනය සඳහා වඩා ආරක්ෂිත, ප්‍රමාණවත් හා තිරසාරී ජල සැපයුමක් සඳහා ජාතික මට්ටමේ ජල සම්පත් කලමනාකරණ ව්‍යාපෘතියක් අවශ්‍ය වන අතර එවැනි ව්‍යාපෘතියක් තුළ පහත ලක්ෂණ අඩංගු විය යුතුය.

උක්ත සඳහන් කළ පරිදි හා සම්පත්වල යෝග්‍ය භාවිතය සහ ප්‍රශස්ථ උපයෝජන තහවුරු කිරීමට මෙන්ම යෝජිත ජනාවාස රටාව දිරිගැන්වීම සඳහා සහායතාවය දැක්වීම සඳහා උචිතම විකල්පය වනුයේ යෝජිත සංවර්ධන ජාල තුළ එකිනෙකට සම්බන්ධව ඇති කරන ජල සැපයුම් යෝජනා ක්‍රමයි. ජාල ගත වූ එවැනි ජල සැපයුම් යෝජනා ක්‍රමයක් මගින් ජල ඉල්ලුම පවතින දීර්ඝ පරාසයකින් යුත් සේවා ප්‍රදේශයක් සඳහා සැපයුම් සිදුකළ හැකි අතර එමගින් සෘතුමය වශයෙන් ජල මූලාශ්‍ර පදනම්කරගෙන ඇතිවන ජල සැපයුම් ගැටළු ද මගහරවා ගත හැකිය. එසේම වර්ෂාපතනයේ අඩුවීමක් පිළිබඳව පුරෝකථනය කර ඇති නමුත් පවතින සංවර්ධන දැක්ම තුළ 2030 දක්වා හා ඉන් ඔබ්බට ඇතිවන ජල ඉල්ලුම සපුරාගැනීමට ගංගාවල ඇති ජල සම්පත දූරදර්ශීව කළමනාකරණය කරගත හැකි විකල්ප ජල මූලාශ්‍ර කිහිපයක්ම ඇති බවට ද නිරීක්ෂණය කළ යුතුව ඇත.

පවතින ප්‍රධාන ජල මූලාශ්‍රයන්ගෙන් මහවැලි ගඟ, කළු ගඟ හා කැළණි ගංගා මගින් ප්‍රධාන සංවර්ධන ජාලයේ කොළඹ - ත්‍රිකුණාමළය අතර 2030 දක්වා ඇතිවන ජල ඉල්ලුම සැපිරීමට අවශ්‍ය වන ජල පරිමාණය උක්ත සඳහන් (සහ සම්බන්ධිත) අන්තර් ද්‍රෝණි ජල සැපයුම් සේවා ජාලය මගින් සපයාගත හැකි වනු ඇත. එසේම දකුණු සංවර්ධන ජාලයේ ඇතිවන ජල ඉල්ලුම ගිං හා නිල්වලා ගංගාවන්හි ඇති ජලය උපයෝගී කරගනිමින් උක්ත සඳහන් හා සමාන අන්තර් ද්‍රෝණි ජල සැපයුම් ජාලයක් මගින් සපුරාගැනීමට අවශ්‍ය වේ.

එනමුත් උතුරු හා නැගෙනහිර සංවර්ධන ජාලයන් තුළ පවතින ගංගාවන්හි ඇති ජල ප්‍රමාණය එම ප්‍රදේශය තුළ ඇතිවන ජල ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් එම ප්‍රදේශය තුළ ඇති නව ජල මූලාශ්‍ර පිළිබඳව ගවේෂණය කල යුතුවේ. යෝජිත "යාපනයට ගඟක්" (ආරුමුගම් යෝජනාව, 1965) ව්‍යාපෘතිය පිළිබඳව ශ්‍රී ලංකා රජය විසින් සලකා බලමින් සිටින අතර එම ව්‍යාපෘතිය මගින් උතුරු සංවර්ධන ජාලය තුළ ගිණිය හැකි ප්‍රතිලාභ ස්ථාපිත කිරීමට සේම උතුරු ප්‍රදේශයේ කෘෂි කර්මය මත පදනම් වූ සංවර්ධනයක් ඇති කිරීම සඳහා ඉහළ විභවතාවයක් සලසනු ඇත.

කෘෂිකාර්මික අරමුණු සඳහා අවශ්‍ය වන ජලය කළමනාකරණය කරනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව මගිනි. ප්‍රධාන හා සුළු පරිමාණ වාරිමාර්ග ජල යෝජනා ක්‍රම මගින් වගාකර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර් මිලියනයකට වඩා වැඩි බවට වාර්තා වී ඇති අතර ශ්‍රී ලංකාවේ සමස්ථ ආහාර නිෂ්පාදනයෙන් 65% කට වඩා වැඩි ප්‍රමාණයක් මෙම කෘෂි බිම් මගින් සපයනු ලැබේ. ආහාර සුරක්ෂිත භාවය තහවුරු කිරීම සඳහා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තය ආරක්ෂාකර ගත යුතු අතරම ඒ හා සබැඳි පරිසර පද්ධතීන් ද සංරක්ෂණය කළ යුතුවේ. එමෙන්ම උක්ත සඳහන් කළ ජාතික ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය තුළ වාරිමාර්ග හා අනෙකුත් කෘෂිකර්මය ආශ්‍රිත කටයුතු සඳහා ප්‍රශස්ථ ලෙස ජලය භාවිත කිරීම පිළිබඳ මාර්ගෝපදේශ ක්‍රියාමාර්ග ඇතුලත් කළ යුතු වේ.

මළ අපද්‍රව්‍ය බැහැරකිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍රාදේශීය මට්ටමින් සලකාබැලිම වඩා යෝග්‍ය වේ. 5.2 කොටස මගින් දක්වා ඇති යෝජිත ජනාවාස ව්‍යාප්ති උපාය මාර්ගය මගින් පුරෝකථනය කර ඇති සංඛ්‍යා අනුව ඊට අනුයාත ස්ථාපනයන් සමඟ වන නව භූගත මළාපවහන පද්ධතියක අවශ්‍යතාවය 2030 වන විට ප්‍රධාන ජන සංකේන්ද්‍රණ ප්‍රදේශ වන කොළඹ අධිනාගරිකයේ ඇති ශ්‍රී ජයවර්ධනපුර, කඩුවෙල, පැලියගොඩ, වත්තල, කොළොන්නාව, මහරගම වැනි ප්‍රදේශ වල ද හඳුනාගෙන ඇති නාගරික මධ්‍යස්ථානයන් වන මීගමුව, රාගම, ගම්පහ, මීරිගම, කුරුණෑගල, දඹුල්ල, ත්‍රිකුණාමලය, කින්නියා, මුතූර්, ගාල්ල, හික්කඩුව, මාතර, යාපනය, මඩකළපුව, කල්මුනේ, මහනුවර, අනුරාධපුරය හා නුවර එළිය වැනි ප්‍රදේශ වල ද ඇති වේ. 2030න් ඔබ්බට සිදුවන අනාගත සංවර්ධන රටාව අනුව හම්බන්තොට, මන්නාරම, කිලිනොච්චිය, එරාවූර්, රත්නපුරය හා යෝජිත ප්‍රධාන නාගරික සංකේන්ද්‍රණයන්ගෙන් යුක්ත ප්‍රදේශ තුළ ද තවදුරටත් මළ අපවහන පද්ධති ඇති කිරීම පිළිබඳව සලකා බැලිය හැකිය. එවැනි ස්ථාපිතයන් මගින් එම ස්ථානයන්හි සංවර්ධන විභවතාව වැඩිකරගත හැකි අතරම සංවේදී ස්වභාවික පරිසර පද්ධතීන් ආරාක්ෂාකර ගැනීමේ හැකියාවක් ද ඇත.

මතුපිට ජල අපවහනය සඳහා ද බහුවිද ක්‍රියාමාර්ගයන් කලාපීය හා ප්‍රාදේශීය යන මට්ටම් දෙකෙහි දී ම අවශ්‍ය වේ. එසේම සාමාන්‍ය ප්‍රතිපත්තියක් ලෙස වැසි ජල එක් රැස්කිරීමේ පහසුකම් ස්ථාපනය කිරීම පුද්ගලික සංවර්ධන කටයුතු වල දී සේම සාපේක්ෂ වශයෙන් විශාල පරිමාණයෙන් නාගරික ප්‍රදේශ තුළ සිදුවන සංවර්ධන කටයුතු වලදී ද සියලුම නිර්මිත පරිසර ප්‍රදේශයන් තුළ ප්‍රවර්ධනය කළ යුතුවේ (විශේෂයෙන්ම නාගරික ප්‍රදේශයන්හී) ජල ඉල්ලුමේ කොටසක් සපුරාගැනීමේ අනුපූරකයක් වීම, සංවර්ධිත ප්‍රදේශයන්හි පාංශු ජල අවශෝෂණය අඩුවීම නිසා ඇති වන ක්ෂණික ජල ගැලීම් පාලනය කිරීමට සපයන දායකත්වය හා භූගත ජල මූලාශ්‍ර නැවත ප්‍රාණවත් කිරීමට ඇති හැකියාව නිසා මෙම උපාය මාර්ගය ඉතා වැදගත් වේ.

සුදුසු ස්ථාන වල වේලි ඉදිකිරීම, ප්‍රජා මූලික සංවිධාන මගින් හෝ ගංගාධාර ප්‍රදේශයන් අයත්වන අදාළ පළාත් පාලන ආයතනයන් මගින් කළමනාකරණය කරනු ලබන සුළු පරිමාණයේ සිට මධ්‍ය පරිමාණය දක්වා එල්ලංගා පොකුණු පද්ධති ඇතිකිරීම අඩු ඝනත්වයකින් යුත් නිර්මිත ප්‍රදේශ තුළ ජල කළමනාකරණය සඳහා ඇති සාධනීයම විසඳුම වනු ඇත. තවද මෙවැනි පොකුණු ආශ්‍රිත යාබද පරිසරයන් පොදු විනෝදාස්වාද කටයුතු සඳහා යොදාගැනෙන ප්‍රදේශ ලෙස ද භාවිත කළ හැකිය.

**2.4.3 බලශක්තිය**

ලංකා විදුලිබල මණ්ඩලය විසින් කෙටුම්පත් කර ඇති 2018-2037 දිගු කාලීන ජනන ප්‍රසාරණ සැලසුම, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂම විසින් ප්‍රකාශයට පත්කර ඇති 2020 විදුලි සැපයුම, ඉදිරියේ ඇති අභියෝග හා නිර්දේශ සඳහා තිරසර බලශක්ති අධිකාරිය විසින් ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාවේ බලශක්ති ආරක්ෂණය සඳහා වන තිරසර බලශක්ති වැඩසටහන 2015-2025, ශ්‍රී ලංකාවේ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත්කර ඇති දැනුම පදනම්කරගත් ආර්ථිකයක් සඳහා වන බලශක්ති අංශයේ සංවර්ධන සැලසුම 2015-2025, 2003 අංක 26 ඛණිජතෙල් සම්පත් පනතින් ස්ථාපිත ඛණිජතෙල් මූලාශ්‍ර සංවර්ධන ලේකම් කාර්යාලය විසින් සම්පාදනය කර ඇති ඛණිජතෙල් ගවේෂණ සංවර්ධන සැලසුම ආදී මෙම අංශයට අදාළව පවතින සැලසුම් මගින් මෙරට බලශක්ති අංශය කෙරේ දැනටමත් ප්‍රමාණවත් අවධානයක් ලබා දී ඇත. උක්ත සඳහන් සැලසුම් වලින් අභිමත අරමුණු හා අභිප්‍රායන්ට අනුකූලව හා මෙම සැලසුමෙන් අභිමත භෞතික සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පහත සඳහන් උපාය මාර්ග යෝජනා කෙරේ. බලශක්තිය

උක්ත සඳහන් කරන ලද "2020 විදුලි සැපයුම, ඉදිරියේ ඇති අභියෝග හා නිර්දේශ" වාර්තාව මගින් තිරසාර ලෙස දිගු කාලීන බලශක්ති ආරක්ෂණය තහවුරු කිරීම සඳහා කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන විසඳුම් නිර්දේශ කර ඇත. එම වාර්තාවට අනුව වසර 2016 අවසන් වන විට ශ්‍රී ලංකාවේ බලශක්ති පද්ධතියේ සමස්ත පිරිවැටුම් ධාරිතාවය (සමස්ත බෙදාහැරිය හැකි මෙගාවොට් 3538 ධාරිතාවය සමග) ආසන්න වශයෙන් මෙගාවොට් 4054 වේ. 2016 දී වාර්තාවී ඇති උපරිම විදුලි ඉල්ලුම මෙගාවොට් 2453ක් වන අතර සමස්ත විදුලි නිෂ්පාදනය මෙගාවොට් 14,250කි. විදුලි ජනනය ප්‍රසාරණය සැලසුම් කිරීම උක්ත සඳහන් අරමුණු ළඟා කරගැනීමේ ක්‍රියාවලියේ එක්කොටසකි, විද්‍යුත් බලශක්තිය සඳහා වැඩිවන ඉල්ලුම සපුරාගැනීම සඳහා හා විරාම ගැන්වීම හේතුවෙන් ඉවත්වන තාප බලාගාර අනුව, අවශ්‍යතාවය ඇති වන පරිදි නව ජනන මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට අවශ්‍යව ඇත.

මානව සම්පතෙහි ශක්‍යතාවය ගොඩනැගීම තුළින් හා අන්තර් ජාතික කොන්ත්‍රාත්කරුවන්/ මෙහෙයුම්කරුවන් ශ්‍රී ලංකාවේ ඉහළ පෙළ ඛනිජතෙල් මෙහෙයුම්කරණ කටයුතු සඳහා සහභාගීකරගැනීම හරහා ඇතිවන තාක්ෂණික දියුණුව මගින් ජාතික ආර්ථිකයට අමතර වටිනාකමක් එකතුකිරීමේ අරමුණින් ඛනිජතෙල් මූලාශ්‍ර සංවර්ධන ලේකම් කාර්යාලය උපායමාර්ගික තෙල් හා ගෑස් ගවේෂණය, ඉස්මතුවන ව්‍යාපාරික ආකෘතීන් පිළිබඳව සැලකිල්ලට ගනිමින් සෘජු විදේශායෝජන ව්‍යාපෘතීන් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගු කාලීන සැලසුම් වශයෙන් ප්‍රමුඛතා ගතකරමින්, නව ප්‍රසම්පාදන ක්‍රමවේදයන් හඳුන්වාදෙමින්, වෙළඳපල විභවතාවයන් හා ජාතික ප්‍රතිලාභ සැපයීම ආදිය සමග ඉදිරියට යාමට සැලසුම් කර ඇත.

2003 අංක 26 දරණ ඛනිජතෙල් සම්පත් පනත ශ්‍රී ලංකාවේ ඛනිජතෙල් ගවේශනය හා සංවර්ධනය පාලනය කරනු ලබන ව්‍යවස්ථාපිත නීතියයි. මෙම පනත යටතේ ස්ථාපනය කර ඇති ඛනිජතෙල් මූලාශ්‍ර සංවර්ධන කමිටුව එම පනතේ ප්‍රතිපාදනයන් ක්‍රියාත්මක කිරීමට වගකියනු ලබන අතර ඛනිජතෙල් මූලාශ්‍ර සංවර්ධන ලේකම් කාර්යාලය ශ්‍රී ලංකාවේ සියලුම ඛනිජ තෙල් ගවේශන හා නිෂ්පාදන කටයුතු පරිපාලනය හා පාලන සඳහා වගකියනු ලැබේ.

විදුලිය හා ඛනිජ තෙල් මත පදනම් ඉන්ධන යන කොටස් දෙක සඳහා ම ඇතිවන ඉල්ලුමින් වැඩි කොටසක් බව සැළැස්මෙහි දක්වා ඇති සංවර්ධන ජාලයන්ගෙන් ඇති වනු ඇත. උක්ත 5.1 කොටසින් දක්වන ලද යෝජිත භෞතික ව්‍යුහයේ දක්වන පරිදි යෝජිත ජනාවාස රටාව, කාර්මික සංවර්ධනය හා ප්‍රවාහන යටිතල පහසුකම් සමග අනාගත ජාතික බලශක්ති ඉල්ලුමින් භාගයකට වැඩි ප්‍රමාණයක් (50%) යෝජිත නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය තුළට සංකේන්ද්‍රණය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඒ අනුව මෙම ප්‍රධාන සංවර්ධන ප්‍රදේශ ප්‍රවර්ධනය කිරීම සඳහා විධිමත් හා අවිච්ඡින්න විදුලිබල, ඛනිජ තෙල් හා ගෑස් සැපයුම් පද්ධතියක් (ජල සැපයුම සඳහා යෝජනා කරන ලද හා සමාන අඛණ්ඩ සේවා ජාලයක්) නැගෙනහිර-බටහිර සංවර්ධන ජාලය තුළ යෝජනා කරනු ලැබේ.

පවතින සේවා ජාලයන් වැඩිදියුණු කිරීමට අමතරව නව ඛනිජතෙල් හා ස්වභාවික වායු පර්යන්තයක් සහ විදුලිබලාගාරයක් ත්‍රිකුණාමළයට හා කොළඹට (කෙරළවලපිටිය) ආසන්නව ස්ථාපනය කිරීම සඳහා යෝජනා කෙරේ. මෙම අඛණ්ඩ නළ මාර්ග පද්ධතිය හරහා සමස්ත දිවයිනටම අවශ්‍ය විදුලිය, ද්‍රව ඉන්ධන හා ගෑස් සැපයීම සඳහා සහය ලැබෙනු ඇත. 2030ට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා මේ හා සමාන ස්ථාපනයන් අනෙකුත් සංවර්ධන ජාල තුළ සුදුසු ස්ථානයන්හි ඇති කිරීම පිළිබඳව ද සලකා බැලිය යුතුය. මෙම ස්ථාපිතයන්ට ඉඩ සැලසීම සඳහා ප්‍රධාන සංවර්ධන ජාලයන් තුළ යෝජනා කර ඇති අධිවේගී මාර්ග හා දුම්රිය මාර්ග අනුරේඛනයන් පහසුකම් ජාල ලෙස සැලකිය හැකිය.

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් 2016-2020 සඳහා සකස්කර ඇති බලශක්ති කළමනාකරණ ක්‍රියාකාරී සැලසුම අනුව 2020 වන විට සමස්ථ බලශක්ති අවශතාවයෙන් 20% පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සපුරා ගැනීමට අපේක්ෂා කරන අතර එය ළඟාකර ගත හැකි ඉලක්කයක් ද වේ. 2050 වන විට මෙය 30%-40% දක්වා වැඩි කර ගත හැකි නමුත් සමස්ත බලශක්ති ඉල්ලුමම පුනර්ජණනීය බලශක්ති මූලාශ්‍රයන්ගෙන් සපුරා ගැනීම අවිනිශ්චිතය. ශ්‍රී ලංකාව විසින් අත්සන් තබා ඇති ජාත්‍යන්තර සම්මුතීන් හා ගිවිසුම් මගින් එකඟවී ඇති වායු විමෝචන ඉලක්කයන් ළඟා කරගැනීමට හා පිරිසිදු බලශක්ති සැපයීමක් තහවුරු කිරීම සඳහා සියළුම නාගරික නේවාසික, වාණිජ හා ආයතනික සංවර්ධන කටයුතු වලදී වහල මත සවිකරන ලද සූර්යය බලශක්ති ජනන ඒකක ස්ථාපනය කිරීම අත්‍යවශ්‍ය රෙගුලාසියක් වශයෙන් සැලකීමට යෝජනා කරන අතර මෙම නාගරික ප්‍රදේශවලින් බලශක්ති අවශ්‍යතාවයෙන් අවම වශයෙන් 20%ක් සපුරාගැනීමට අරමුණු කෙරේ. එසේම අධිනාගරික ප්‍රදේශවලට ආසන්න බිම් ප්‍රදේශවල ද සූර්යය බලශක්ති ජනන ඒකක ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. කෙසේ වෙතත් සූර්ය කෝෂ විරාමකරණයේදී ජනනය වන අපද්‍රව්‍ය කළමණාකරණය කර ගැනීමට දීර්ඝ කාලීන වැඩපිළිවෙළක් දැන්සිටම සකසා ගත යුතුය. සූර්ය කෝෂ ජනප්‍රිය කරවීම සුදුසු වන්නේ එවැනි වැඩපිළිවෙළක් ද සූදානම් කිරීමත් සමගය.

මෙම සැලසුම මගින් හඳුනාගෙන ඇති මධ්‍යම අධිසංවේදී ප්‍රදේශ තුළ, සීතාවක (කිතුල්ගල), බ්‍රෝඩ්ලැන්ඩ් (හැටන්) හා මල්වල (රත්නපුර) යන ස්ථානයන්හි විශාල ප්‍රමාණයේ ජලවිදුලි බලාගාර කිහිපයක් ලංකා විදුලිබල මණ්ඩලය විසින් යෝජනා කර ඇත. මෙම සැලසුම මගින් සංවේදී ප්‍රදේශ සඳහා ජනහායන උපාය මාර්ගය යෝජනා කර ඇති නමුත් පරිසරයට ඇතිකරන බලපෑම පිළිබඳව සිදුකරන පුළුල් අධ්‍යනයන්ට යටත්ව සංවේදී කලාපයට අයත් මෙම ප්‍රදේශ තුළ වුවද උක්ත ජල විදුලි බලාගාර ස්ථාපනය කල හැකිය.

**2.4.4 අපද්‍රව්‍ය කළමනාකරණය**

අපද්‍රව්‍ය කළමණාකරණය

අභිමත භෞතික හා ආර්ථික සංවර්ධන දැක්මට සහාය දැක්වීම සඳහා කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණ යෝජනා ක්‍රමයක් අත්‍යවශ්‍ය ය. යෝජිත නාගරික සමූහිතයන් තුළ කාර්මික, වාණිජ, සායන හා අනෙකුත් සේවා පහසුකම්වලට අමතරව විශාල ප්‍රමාණයේ නේවාසික ජනගහනයක් ද අපේක්ෂා කෙරේ.

දැනටමත් ක්‍රියාත්මක කරමින් පවතින කෙරවලපිටිය, බොරලැස්ගමුව හා මහනුවර වැනි කසල බලශක්තිය බවට පත්කිරීමේ ව්‍යාපෘති මගින් හා අරුවක්කාලු වේ ඇති මහා පරිමාණ සෞඛ්‍යාරක්ෂිත කසළ රැඳවීමේ ව්‍යාපෘති 2020දී මෙහෙයුම් කටයුතු ආරම්භකිරීම මගින් ඉදිරි දශකය තුල නිපදවන කසල බොහෝ ප්‍රමාණයන් කළමණාකරණය කළ හැකි වනු ඇත. ඒ අනුව ජාතික මට්ටමේ කසළ කළමනාකරණ අධිකාරියක් මගින් ක්‍රියාත්මක කරනු ලබන නූතන තාක්ෂණික මැදිහත්වීමක් ඇති කසළ එකතුකිරීම, ප්‍රවාහනය හා බැහැර කිරීම සඳහා මධ්‍යම කළමනාකරණ ක්‍රමවේදයක් ප්‍රධාන සංවර්ධන ජාලයන්ට අයත් ප්‍රදේශයන්ට, අධිනාගරික ප්‍රදේශයන්ට හා ප්‍රධාන නගරයන්ට අයත් ප්‍රදේශයන්ට 2020 වන විට ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලැබේ.

සිදුකරගෙන යනු ලබන ප්‍රවර්ධන වැඩසටහන් හා එම ප්‍රදේශයන්ගෙන් අපේක්ෂිත අඩු ජනගහන මට්ටම නිසාවෙන් අනෙකුත් ප්‍රදේශවලින් සාපේක්ෂ වශයෙන් අඩු කසළ ප්‍රමාණයක් නිපදවෙතැයි අපේක්ෂා කරන අතර එය සම්ප්‍රදායික ප්‍රතිචක්‍රීකරණ ක්‍රමවේදයන්, කොම්පෝස්ට් කිරීම හා සෞඛ්‍යාරක්ෂිත ඉඩම් ගොඩකිරීම් ක්‍රමවේදයන් තුල කළමනාකරණය කරගත හැකිවනු ඇත.

අඩු කිරීම, අවම කිරීම හා නැවත භාවිතා කිරීම පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහන් වැඩි කිරීමත් සමග කසළ නිපදවීම හා බැහැරකිරීම අඩුවිය හැකි නමුත් පවතින සමාජ ආර්ථික සංවර්ධන තත්වයන් ඉලෙක්ට්‍රොනික හා සායනික කසළ වැනි සාම්ප්‍රදායික නොවන කසළ හැසිරවීමේදී ඵලදායී ප්‍රතිපත්ති, උපකරණ හා ක්‍රමවේදයන් පැවතීමේ ඇති අවශ්‍යතාවය පෙන්වා දෙනු ලැබේ. මෙම වර්ගයේ කසළ බැහැරකිරීම් පිළිබඳව යෝජනාවන් ඉදිරිපත්කිරීම

මෙම සැලසුමේ විෂයපථයෙන් ඔබ්බෙහි වන දෙයක් වන නමුත් මේ පිළිබඳව හොඳින් පර්යේෂණ සිදුකර සඵලදායී බැහැරකිරීමේ ක්‍රමවේද දියුණුකර ඇති බැවින් මෙම පහසුකම් ස්ථාපිත කිරීම සඳහා වඩාත්ම සුදුසු ප්‍රදේශ මෙම සැලසුමින් සපයනු ලබන භෞතික ව්‍යුහය තුළින් හඳුනාගත හැකිය.

### 2.5 සමාජ යටිතල පහසුකම් සැපයීම

#### 2.5.1 අරමුණ

සමාජ යටිතල පහසුකම් සංවර්ධනය

සමාජීය යටිතල පහසුකම් සැපයීම මානව ජනාවාස සංවර්ධනයේ දී හා ඒ ආශ්‍රිත ආර්ථික කටයුතු සංවර්ධනයේදී ඉතා වැදගත් වේ. අභිමත ජනාවාස සංවර්ධන රටාව සාර්ථකව ක්‍රියාවට නැංවීම සඳහා අවශ්‍ය වන සමාජීය යටිතල පහසුකම් අතරින් අධ්‍යාපනය, සෞඛ්‍ය හා පරිපාලන සේවාවන් ඉතා වැදගත් වන අතර රජය ද නිරන්තරව මේ පිළිබඳව වැඩි අවධානයක් යොමු කර ඇත. 'ළඟම පාසල - හොඳම පාසල', 'ද්විතීය අධ්‍යාපනය අනිවාර්ය කිරීම', 'සැමට තෘතීය අධ්‍යාපනය', 'කායිකව ක්‍රියාකාරී ජාතියක් තුළින් බෝනොවන රෝග නිවාරණය', ' විමධ්‍යගත පරිපාලනය', විද්‍යුත් පාලනය' වැනි මෙම ක්ෂේත්‍රයන්ට අදාළ නූතන උපාය මාර්ගික ප්‍රතිපත්ති මගින් දිවයිනේ භෞතික සංවර්ධනය මත සෘජු බලපෑමක් ඇතිකර තිබේ.

මෙම පසුබිම යටතේ අධ්‍යාපන, සෞඛ්‍ය හා පරිපාලනමය යටිතල පහසුකම්හි ඉදිරි සැපයුම් සඳහා පහත සඳහන් පොදු අරමුණු සඳහන් කෙරේ.

#### 2.5.1.1 මහජනතාව සඳහා සුවපහසුව

භෞතික යටිතල පහසුකම් හා සමානව පාසල්, රෝහල්, පරිපාලනමය කාර්යාල ආදී යටිතල පහසුකම් ස්ථාපනය සඳහා සුදුසු ස්ථාන තෝරාගැනීමේදී ඒවා භාවිත කරන්නන්ට සේම එම සේවා සපයන්නන් සඳහා වන සුවපහසුව පිළිබඳව සලකාබැලීම තැකිය යුතු වැදගත් කරුණක් වේ. මෙවැනි පහසුකම් සැලසුම් කිරීමේදී සැමවිටම ප්‍රධාන ප්‍රවේශ මාර්ගයන්ට හා නාගරික මධ්‍යස්ථානවලට සමීප වන ආකාරයෙන් එකිනෙකට ආසන්නව සැලසුම් කල යුතුවේ.

#### 2.5.1.2 උපරිම උපයෝජනයක් සඳහා උපාය මාර්ගිකව ආයෝජනය කිරීම

අධ්‍යාපනික, සෞඛ්‍ය, හා පරිපාලනමය යටිතල පහසුකම් දිවයින පුරා මැනවින් විහිදී ඇති බව නිරීක්ෂණය කල හැකිය. සමෘද්ධිමත් සමාජ තත්වයන් මත අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා වන ඉල්ලුම සුවිශේෂී පහසුකම් හා ස්ථානවලට සංකේන්ද්‍රගතව පැවතිය ද අනාගත සමාජීය යටිතල පහසුකම් සඳහා ආයෝජනය කිරීමේදී නව පහසුකම් ස්ථාපිත කිරීමට වඩා පවතින පහසුකම් සංවර්ධනය හා වැඩිදියුණු කිරීම තහවුරු කලයුතුය. ආයෝජන සඳහා සැලසුම් කිරීමේදී පුළුල් වූ ශක්‍යතා අධ්‍යනයක් හරහා පහසුකම් වලින් උපරිම උපයෝජනයන් ලබාගැනීම තහවුරු කලයුතුවේ.

#### 2.5.1.3 පිරිමැසුම් දායක මෙහෙයුම්කරණය හා තිරසර භාවිතය

ඇතැම් යටිතල පහසුකම් සඳහා සිදුකරන බොහෝ ආයෝජන මගින් නැවත ආර්ථිකයට සැලකිය යුතු ප්‍රතිලාභ අත්පත් කර නොදෙන බව නිරන්තරයෙන් සඳහන් වන කාරණයක් වේ. මැනවින් සංවිධානය වූ සේවා ධූරාවලියකින් හා විවිධ මට්ටම්වලදී සහ ස්ථාන වලදී ප්‍රජාව ආවරණය කිරීම මගින් සාමාන්‍යයෙන් අපතේ හැරීම් අවමකර ගත හැකි වන අතර භාවිතය හා ඒ සඳහා වන උපයෝගීතාව උපරිම කරගත හැකිය. එසේම ඉදිරියට එමින් පවතින ස්වයංක්‍රීය සේවාවන්, ඉලෙක්ට්‍රොනික ඉගෙනුම්, ඉලෙක්ට්‍රොනික උපදේශනයන් ආදිය මගින් වඩාත් කාර්යක්ෂම සේවාවක් ලබා දිය හැකි අතර ඒ සඳහා වන පිරිවැය ද අවම වේ.

#### 2.5.2 අධ්‍යාපනය

අධ්‍යාපනය

වර්තමානයේ දී ප්‍රාථමික හා ද්විතීය අධ්‍යාපනයේ නිරීක්ෂණය වන කලාපීය විෂමතාවයන් මැඩපැවැත්වීම සඳහා අධ්‍යාපන ප්‍රතිපත්ති වල විප්ලවීය වෙනසක් අවශ්‍ය වේ.

වර්තමානයේදී දිවයින පුරා ප්‍රාථමික අධ්‍යාපනික පහසුකම් මැනවින් ස්ථානගත වී ඇති අතර ග්‍රාමීය ප්‍රදේශ වල සිට පවා එම පහසුකම් සඳහා ප්‍රවේශවීමට ඇත්තේ උපරිම වශයෙන් කිලෝමීටර් 2ක දුරකි. මෙවැනි ස්ථාන වල ඇති මෙම පහසුකම් මගින් ම අපේක්ෂිත ජනාවාස ව්‍යාප්තියට අවශ්‍ය වන සේවා ඉල්ලුම අවම එකතුකිරීම හා සංවර්ධනය

කිරීම් තුල මැනවින් සපුරාගත හැකිය. එසේ නමුත් මෙවැනි සෑම ස්ථානයකම පවත්නා පහසුකම්වල ඇති ගුණාත්මක බව ප්‍රසංසනීය නොවේ. ජනප්‍රිය පාසල් හා අනෙකුත් පාසල් අතර දැඩි විෂමතාවයන් නිරීක්ෂණය වේ. රජය විසින් ගෙනයනු ලබන 'ළඟම පාසල හොඳම පාසල' ප්‍රතිපත්තිය යතාර්ථයක් බවට පත්කරගැනීමට නම් ඉදිරි වසර 10 තුළ ප්‍රාථමික අධ්‍යාපනයේ යටිතල පහසුකම් සඳහා සැලකිය යුතු ආයෝජනයක් සිදුකිරීම අත්‍යවශය වේ. හඳුනාගත් පාසල් ගොඩනැගිලි, විෂය හා විෂය පරිබාහිර ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ඉඩ පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, ගුරුවරුන් සඳහා වන නවාතැන් පහසුකම් හා අනෙකුත් අධ්‍යාපන යටිතල පහසුකම් මේ සඳහා ඇතුලත් වේ. ජනප්‍රිය පාසල් සඳහා වන අධික පීඩනයෙන් මිදීම සඳහා ප්‍රාථමික පාසල් කුමන හෝ අයුරකින් ද්විතීය පාසල් වලින් වෙන්ව පැවතිය යුතුමය.

'ද්විතීය අධ්‍යාපනය අනිවාර්යය කිරීමේ' රජයේ ප්‍රතිපත්තිය ප්‍රධාන නාගරික ප්‍රදේශවලට ආසන්නව පුළුල් ලෙස විහිදී ඇති ද්විතීය පාසල් තුළින් සඵල කරගත හැකිය. සැලකිය යුතු ජන ඝනත්වයක් සහිතව සියලු ප්‍රදේශයන්ගේ සිට උපරිම වශයෙන් කිලෝමීටර් 15ක් ඇතුලත දුරකින් වර්තමානයේ දී ද්විතීය පාසල් ස්ථානගත ව ඇති බව නිරීක්ෂණය වී ඇති අතර සිසුන් සඳහා තෘප්තිමත් විය හැකි සංචලතාවයකින් යුත්කව එම පාසල් පද්ධතිය මගින් සමස්ථ දිවයිනම මැනවින් ආවරණයව ඇත. යහපත් අධ්‍යාපනයකින් යුත් අනාගත පරපුරක් හා සියලුම පාසල් අතර සමබර අධ්‍යාපනික පහසුකම් ඇතිකිරීම සඳහා ප්‍රාථමික පාසල්වලට සමානව නාගරික හා නාගරික නොවන පාසල් වල දැකිය හැකි විෂමතාවයන් ද ඉදිරි දශකයේ මුලිනුපුටා දැමිය යුතුවේ. වර්තමානයේදී පාසල් කටයුතු සඳහා විවිධ පාර්ශවකරුවන් මගින් ප්‍රකට වන මැදිහත්වීම් මගින් ද්විතීය අධ්‍යාපනය වඩා තිරසාරී භාවිතයක් තුලට කැඳවාගෙන යා හැකිය.

තෘතීය අධ්‍යාපනය සඳහා වන ඉල්ලුම වැඩිවෙමින් පවතී. වර්තමානයේ පවතින රජයේ විශ්වවිද්‍යාල හා රාජ්‍ය නොවන උපාධි පිරිනැමීමේ ආයතනය තුලින් ඇතිවන ඉල්ලුම සැපිරීම සඳහා ඔවුන්ගේ ශක්‍යතාවයක් වර්ධනය කරගත යුතු වේ. මෙම සැලසුමින් හඳුනාගනු ලැබූ නාගරික සාමූහිතයන් තුල නව විශ්වවිද්‍යාල ස්ථාපිත කිරීමටත්, පවතින විශ්වවිද්‍යාල පුළුල්කිරීමටත් යෝජනා කෙරේ. බොහොමයක් ප්‍රධාන නාගරික ප්‍රදේශ තුල විශ්වවිද්‍යාල හා අනෙකුත් තෘතීය අධ්‍යාපනික පහසුකම් ස්ථානගතව ඇති නමුත් මීරිගම, දඹුල්ල, මහියංගනය, වැල්ලවාය හා පුත්තලම යන ස්ථානයන් අනාගත තම ආයතන ස්ථාපිතයන් හා පවතින ආයතන පුළුල්කිරීම සඳහා සලකා බැලිය යුතුය. මෙමගින් එම ප්‍රදේශවල ආකර්ශණය ඇති කරගත හැකි අතරම ප්‍රාදේශීය ආර්ථිකය පුබුදුවාලීමට හා යෝජිත යටිතල පහසුකම් මගින් අධ්‍යාපන ආයතන සඳහා සේවා සැපයීමට ද හැකිය.

තාක්ෂණිකව සුදුසුකම්ලත් ශ්‍රමහමුදාවක් අනාගත රැකියා අවස්ථා තුළ නියුක්ත කිරීමේ අවශ්‍යතාවය සැපයීමට වෘත්තීය පුහුණුව සඳහා ඉහල ඉල්ලුමක් පැවතිය හැකිය. මෙම වාර්තාවේ 5.2 කොටස මගින් හඳුනාගෙන ඇති අධිනාගරිකයන්ගේ හා ප්‍රධාන නගරවල දැනටමත් තාක්ෂණික හා වත්තීය පුහුණු ආයතනයන් ස්ථානගතව ඇති බව නිරීක්ෂණය කල හැකිය. මෙම ස්ථානවල පවතින පහසුකම් මතුවන ශ්‍රමහමුදාවේ අවශ්‍යතාවයන්ට ගැලපෙන ආකාරයෙන් වැඩිදියුණු කලයුතු වේ.

**2.5.3 සෞඛ්‍ය**

සෞඛ්‍ය

අධ්‍යාපනික යටිතල පහසුකම්වලට සමානව සෞඛ්‍ය අංශයේ පහසුකම් ද ධූරාවලි ව්‍යූහයක් අනුව, දිවයිනේ සියලු ප්‍රදේශයන්ගේ සිට සාධාරණ දුරකින් ළඟාවිය හැකි අයුරින්, සමස්ථ දිවයිනම මැනවින් ආවරණය වන පරිදි ස්ථානගත වී ඇත. මෙම යටිතල පහසුකම් වල තත්වය හා ගුණාත්මක භාවය යහපත් සෞඛ්‍ය සේවාවක් සැපයීම සඳහා වැඩිදියුණු කිරීමට අවශ්‍යව ඇත.

අභිමත ජනාවාස ව්‍යාප්ති රටාව සඳහා සේවා සැපයීම උදෙසා වර්තමානයේ පරිපාලන දිස්ත්‍රික් පදනම් වූ රෝහල් ව්‍යාප්තියට වෙනස්ව යමින් දඹුල්ල, ඇඹිලිපිටිය, මහියංගනය හා වැල්ලවාය යන රෝහල් වල පහසුකම් ඉහළ තත්වයකට (වර්තමාන මහ රෝහල් වලට සමානව) වැඩිදියුණු කළ යුතු වේ. එසේම කොළඹට අමතරව ත්‍රිකුණාමලය, මාතර, අම්පාර හා කිළිනොච්චිය යන ප්‍රදේශ වල ජාතික මට්ටමේ සෞඛ්‍ය පහසුකම් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.

**2.5.4 පරිපාලනය**

පරිපාලනය

නාගරික ප්‍රදේශවලට මිනිසුන් ආකර්ශනය කරගැනීමේ දී හා එම ප්‍රදේශ ක්‍රියාකාරීව පවත්වාගෙන යාම සඳහා පරිපාලන සේවාව ඉතා වැදගත් කාර්ය භාරයක් ඉටුකරනු ලැබේ. වර්තමාන පරිපාලන අංශ හා ධූරාවලිය බ්‍රිතාන්‍යන් විසින් හඳුන්වා දෙනු ලැබූවක් බව නිරීක්ෂණය කල හැකිය. යෝජිත ජනාවාස සංවර්ධන උපාය මාර්ගයේ අභිවෘද්ධිය උදෙසා මෙම පරිපාලන ව්‍යූහය ඉදිරි දස වසර තුල වෙනස්විය යුතු වේ. මෙම සැලසුම මගින් වර්තමානයේ පවතින දිස්ත්‍රික් පරිපාලන කටයුතු මාතලේ සිට දඹුල්ලටත්, බදුල්ල සිට වැල්ලවායටත්, යාපනය සිට කිලිනොච්චියටත් යනාදී වශයෙන් නුදුරු අනාගතයේදී වෙනස්කිරීමට යෝජනා කරනු ලබයි. මෙලෙස සිදුකිරීමට යෝජනා කරනු ලබනුයේ වර්තමානයේදී මෙම පරිපාලනමය කටයුතු ස්ථානගතව ඇති ස්ථානයන් වල තිබෙන අඩු ශක්‍යතා

ධාරිතාව නිසාවෙන් අනාගතයේදී මෙම ස්ථාන සඳහා සිදුවන නාගරික ඒකරාශීවීම් අධෛර්යමත් කිරීම සඳහා හා නව ස්ථාන කරා නාගරික ආකර්ශනය ඇති කරලීම ප්‍රවර්ධනය කිරීමක් ලෙසය.

**2.6 කාර්මික සංවර්ධනය**

**2.6.1 අරමුණ**

කාර්මික සංවර්ධනය

ශ්‍රී ලංකාවේ කලින් කලට බලයට පැමිණි බොහෝ රජයන් මගින් නිෂ්පාදන අංශයේ සංවර්ධනය සඳහා අවධානය යොමුකර ඇති අතර ඉතිහාසයේ විවිධ අවස්ථාවන්හිදී කාර්මික සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කර ඇත. තවද මේ සඳහා විවිධ ආයතනයන්, කාර්මික ජනපද, විශේෂ අපනයන සැකසුම් කලාප හා කර්මාන්ත සමූහයන් සම්පාදනය කර ඇති අතර ඒවා ක්‍රියාත්මක වෙමින් ද පවතී. වර්තමානයේ පවතින තත්වය යටතේ තවමත් මෙවැනි බොහෝ කාර්මික ස්ථාපිතයන් හුදකලාව ක්‍රියාත්මක වන අතර කාර්මික සංවර්ධනයට මගපෙන්වීම සඳහා පෘථුල වූ ප්‍රතිපත්තියක් සකස්කිරීමේ අවශ්‍යතාවය තවමත් පවතී. එබැවින් අනාගත කාර්මික සංවර්ධන ප්‍රතිපත්ති තුල භෞතික සංවර්ධනය මගින් සැලකිල්ලට බඳුන්කල යුතු මාර්ගෝපදේශ ප්‍රතිපත්ති වශයෙන් පහත සඳහන් අරමුණු යෝජනා කෙරේ.

**2.6.1.1 දැනුම පදනම් කරගත් හා අගය එකතුකරනු කර්මාන්ත සඳහා වැඩි බරක් තැබීම**

දැනුම පදනම්කරගනු ලැබූ කර්මාන්ත හා අගය එකතුකරනු ලබන කර්මාන්ත ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනය සඳහා ඇති ප්‍රමුඛතම පරාසය වන බවට විශාල වශයෙන් පිළිගෙන ඇත. ඉහළ ගුණාත්මක බවකින් යුතු ශ්‍රම බලකායෙන් වාසි ලබාගැනීමට නම් තොරතුරු තාක්‍ෂණය හා සහසම්බන්ධිත කර්මාන්ත, නැනෝ තාක්‍ෂණය, ජාන තාක්‍ෂණය, ගගන තාක්‍ෂණය, ජෛව-වෛද්‍ය තාක්‍ෂණය ආදිය සඳහා ඉහළ ප්‍රමුඛතාවයන් ලබාදිය යුතු වේ.

**2.6.1.2 පරිසර දූෂණයන් රහිත කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම**

හරිතාගාර වායු විමෝචනය සඳහා නිෂ්පාදන කර්මාන්ත වැඩිම දායකත්වයක් ලබාදේ. නවීන නවෝත්පාදනයන් මත පදනම්වූ කර්මාන්ත, කාර්යක්‍ෂම පාලන හා ස්වයංක්‍රීය උපාය මාර්ග වලට අනුගත වීම මගින් අහිතකර විමෝචනයන් නොමැති තත්වයන් සඳහා මගපාදා ගත හැකිය.

කෙසේ වෙතත් ශ්‍රී ලංකාවට 2050 වන තෙක් සම්පූර්ණයෙන්ම බැර හා ලුහු නිෂ්පාදන කර්මාන්තයන්ගෙන් මිදීමට හැකියාවක් නොමැත. එබැවින් එවැනි කර්මාන්ත අනුමත වායු විමෝචන මට්ටම් පවත්වාගෙන යාම, පරිසර දූෂණයන් නොමැති තාක්‍ෂණයන් සඳහා අනුගතවීම, කර්මාන්ත ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන් පවත්වාගෙන යාම වැනි දෑ පවත්වාගෙන යා යුතුය. එසේම නිෂ්පාදන කර්මාන්ත සැලසුම් කිරීමේදී හා නිර්මාණය කිරීමේදී 'පද්ධති සුසංයෝගය' (systems symbioses), කාර්මික පරිසරවේදය (Industrial Ecology), පරිසර හිතකාමී කර්මාන්ත උද්‍යාන (Eco-industrial parks) වැනි නැගී එන නව සංකල්පයන් භාවිත කළ හැකිය.

**2.6.1.3 පවතින වරාය යටිතල පහසුකම් ප්‍රශස්ථ ලෙස භාවිත කිරීම**

යටිතල පහසුකම් පැවතීම කර්මාන්ත ස්ථාන ගතවීම කෙරේ දැඩිව බලපානු ලැබේ. ප්‍රවාහන වියදම් හා පාරිසරික බලපෑම් අවම කරගැනීම සඳහා ආනයන හා අපනයන කටයුතු ආශ්‍රිත විශාල පරිමාණයේ එකලස්කිරීමේ හා අංගන පහසුකම් සඳහා ප්‍රධාන වරායන් වල ප්‍රතිලාභ ලබා ගත යුතුය. කාර්යක්‍ෂම සහ පිරිමැසුම්දායක යටිතල පහසුකම් සැපයීමක් හා ස්ථාපිතයන් සඳහා වන සේවාවන් ඒකාබද්ධ කිරීමට හා එමගින් ඇතිවන සෘණ බාහිරතා අවමකරගැනීමට අනෙකුත් මහා පරිමාණයේ කර්මාන්ත නම් කරන ලද ප්‍රදේශවලට සංකේන්ද්‍ර කල යුතු වේ.

**2.6.1.4 සම්ප්‍රදායික කර්මාන්ත ආරක්‍ෂා කරගැනීම**

සම්ප්‍රදායික කර්මාන්ත හා ගෘහාශ්‍රිත කර්මාන්ත ආරක්‍ෂා කරගත යුතු අතර ඒවායේ දිගු කාලීන පැවැත්මට අවශ්‍ය සහයතාවය ද දැක්විය යුතුය. ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියේ අරමුණුවල පැවතිය ද කර්මාන්ත ආශ්‍රිත අනෙකුත් සාධක ද සළකා බලමින් මේ පිළිබඳව වෙනම උපාය මාර්ගික ප්‍රතිපත්තියකින් සම්පාදනය අවශ්‍ය වේ.

**2.6.2 සංවර්ධන ජාලයන්ට සංකේන්ද්‍ර කිරීම**

මානව ජනාවාස ව්‍යාප්තිය තහවුරු කිරීම සඳහා රැකියා උත්පාදන ප්‍රධාන කර්මාන්ත සංවර්ධනයන් යෝජිත සංවර්ධන ජාල තුලට සංකේන්ද්‍ර කිරීමට යෝජනා කෙරේ. කොළඹ හා ත්‍රිකුණාමලයේ පිහිටා ඇති වරායන් හරහා ලබාගන්නා විවිධ අවස්ථාවන් උකහාගැනීම මගින් ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික දියුණුව නැගෙනහිර- බටහිර සංවර්ධන ජාලය මගින් පූරණය කරගත හැකිවේ. පවතින ප්‍රවාහන යටිතල පහසුකම්, ඉඩම් හා මානව සම්පතෙන් උපරිම ප්‍රයෝජන ලබාගෙන කාර්මික කටයුතු වලින් වැඩි ප්‍රතිශතයක් හා අනාගත රැකියා අවස්ථාවන්ගෙන් වැඩි ප්‍රමාණයක් මෙම සංවර්ධන ජාලය තුල ඇති කල හැකිය.

පවතින හා යෝජිත යටිතල පහසුකම්, ඉඩම් පැවතීම යන කරුණු මත හොරණ, රාගම, ඒකල, බියගම, කටුනායක, මීරිගම, අලව්ව, කුරුණෑගල, ඉබ්බාගමුව, දඹුල්ල හා ත්‍රිකුණාමලය යන ස්ථාන නිෂ්පාදන අංශයේ කර්මාන්ත සඳහා හඳුනාගෙන ඇත. මෙම ස්ථාන 2030 දක්වා නිෂ්පාදන කර්මාන්ත ස්ථාපන ඉල්ලුම සපුරාලීමට පුළුල් කල හැකි කර්මාන්ත පුරයන් ලෙස දැනටමත් නම් කර තිබේ.

ජල සම්පත පැවතීම මත අනෙකුත් සංවර්ධන ජාල තුන තුල ද (ප්‍රධාන වශයෙන් හම්බන්තොට වරාය සංවර්ධන කටයුතු ආශ්‍රිතව හම්බන්තොට ද, අම්පාර හා කිලිනොච්චිය) මහා පරිමාණ කර්මාන්ත සංවර්ධනයක් යෝජනා කරනු ලැබේ.

**2.6.3 නවෝත්පාදන පදනම් කර්මාන්ත සඳහා විශේෂ කලාපයන්**

නවෝත්පාදන කර්මාන්ත

ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුබුදුවාලිමේ මූලිකය මූලිකයන් සේ සැලකිය හැකි නවෝත්පාදන කර්මාන්ත වලට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වලින් අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ ලබාගැනීම සඳහා පවතින විශ්ව විද්‍යාලවලට යාබදව ඉඩ සැලසීමට යෝජනා කරනු ලැබේ. දැනට ක්‍රියාත්මක කරමින් පවතින ලබන කොළඹ තාක්‍ෂණික නගර ව්‍යාපෘතිය බටහිර කලාපයේ මෙවැනි සංවර්ධන කටයුතු සඳහා උත්ප්‍රේරකයක් විය හැකිය. මීට අමතරව කුරුණෑගලට ආසන්නව (වයඹ විශ්වවිද්‍යාලය හා අනුබද්ධ) හා ත්‍රිකුණාමලයේ (නැගෙනහිර විශ්වවිද්‍යාලය හා අනුබද්ධ) මේ හා සමාන තාක්‍ෂණික උද්‍යාන සංවර්ධනයන් ඇති කිරීමට යෝජනා කෙරේ.

**2.6.4 සැකසුම් හා අගය එකතු කිරීමේ කර්මාන්ත**

අගය එකතු කිරීමේ කර්මාන්ත

කෘෂිකර්මාන්තය, සම්ප්‍රදායික නොවන වගාවන්, ගොවිපොල හා ධීවර කටයුතු සංවර්ධනය ආශ්‍රිතව මහා පරිමාණ අගය එකතුකිරීමේ කර්මාන්ත සංවර්ධන පුරයන් ප්‍රධාන සංවර්ධන ජාලයේ කොළඹ- මීගමුව ප්‍රදේශයේ, මීරිගම, කුරුණෑගල, දඹුල්ල, හා ත්‍රිකුණාමලය යන ප්‍රදේශයන් තුලත්, උතුරු සංවර්ධන ජාලයේ කිලිනොච්චියේත්, දකුණු සංවර්ධන ජාලයේ ඇඹිලිපිටිය හා හම්බන්තොටත්, නැගෙනහිර සංවර්ධන ජාලයේ අම්පාර ප්‍රදේශය තුලත් යෝජනා කරනු ලැබේ. මීට අමතරව අනුරාධපුර, වව්නියාව, මන්නාරම, මහියංගනය හා වැල්ලවාය යන අනෙකුත් ස්ථානයන්හි ද මහා පරිමාණයේ කෘෂි සැකසුම් හා අගය එකතුකිරීමේ කර්මාන්ත සංවර්ධනයන් සඳහා ඉඩසැලසිය හැකිය.

**2.6.5 වරාය ආශ්‍රිත බැර භාණ්ඩ කර්මාන්ත**

බැර භාණ්ඩ කර්මාන්ත

බැර කර්මාන්ත හා එකලස්කිරීමේ කර්මාන්ත ශාලා සඳහා හඳුනාගෙන ඇති උචිතම ස්ථානයන් වන්නේ ත්‍රිකුණාමලය හා හම්බන්තොට වරාය ආසන්නයේ පිහිටි ස්ථානය. ඉදිරි කාලපරිච්ඡේදය තුලදී අධි තාක්‍ෂණික හා මහා පරිමාණ කර්මාන්ත බොහෝ වශයෙන් ආනයනික අමුද්‍රව්‍ය මත පදනම් වනු ඇති අතර ඒවා බොහෝ වශයෙන් බාහිර වෙළඳපල අරමුණු කරගෙන අපනයන කරනු ඇත. එබැවින් මෙම කර්මාන්ත වරායන්ට ආසන්නව පැවතීම නිසා ස්වභායෙන්ම එහි වාසි ලබාගනු ඇත. තවද පරිසර සංරක්‍ෂණය තහවුරු කිරීම සඳහා හා එමගින් ඇතිවන සෘණ බාහිරතා වැළැක්වීම සඳහා මහා පරිමාණ කර්මාන්ත අභ්‍යන්තර ප්‍රදේශවලට නොගෙන ආ යුතුය.

වරාය සමීපස්ථ ප්‍රතිපත්තියට සහයතාවය දැක්වීම සඳහා භාණ්ඩ ආශ්‍රිත කර්මාන්ත කොළඹ- මීගමුව අතර ප්‍රදේශයේත්, ත්‍රිකුණාමලය- කන්තලේ ප්‍රදේශයේත් හා හම්බන්තොට - සූරියවැව යන ප්‍රදේශ වලත් දියුණු කල හැකිය.

**2.7 කෘෂිකර්මාන්තය හා වතුවගාව**

**2.7.1 අරමුණ**

කෘෂි කර්මාන්තය හා වතු වගාව

ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට කෘෂිකර්මාන්තය හා වතුවගාවෙන් ලැබෙතැයි අපේක්‍ෂිත සාපේක්‍ෂ අඩු දායකත්වය හමුවේ වැදගත් අභිමතාර්ථයක් වන ආහාර සුරක්‍ෂිතතාවය, කාළගුණික වෙනස්වීමෙන් ඇතිවන බලපෑම් හා ජෛව විවිධත්ව සංරක්‍ෂණ අවශ්‍යතාවය යන අංශ පිළිබඳව භෞතික සංවර්ධන සැලසුම් සකස්කිරීමේදී සැලකිලිමත් විය යුතු වේ. එබැවින් අත්‍යවශ්‍ය ආහාරවලින් ස්වයංපෝෂිතවීම. දැඩි අවදානම් සහිත පාරිසරික සම්පත් සංරක්‍ෂණය කිරීම හා දීර්ඝ ඉතිහාසයක් ඇති සම්ප්‍රදායික ක්‍රමවේද අනාගත පරපුර දක්වා පවත්වාගෙන යාම අරමුණ කරගෙන පහත සඳහන් උපාය මාර්ග යෝජනා කරනු ලැබේ.

**2.7.2 අඩු මිනිස් ශ්‍රම භාවිතය**

අඩු මිනිස් ශ්‍රම භාවිතය

ආහාර සුරක්ෂිතතාවය හා සම්ප්‍රදායික වගා සම්ප්‍රදාය ආරක්ෂාකර ගැනීම උදෙසා මෙම අංශය කෙරේ සැලකිලිමත් විය යුතුය. කෙසේ වෙතත් 2030 වන විට ඍජු ලෙස කෘෂිකාර්මික කටයුතුවල නිරතව සිටින වර්තමාන 30%ක් වන වර්තමාන ජනගහන ප්‍රතිශතය 20% දක්වා අඩු වෙතැයි අපේක්ෂා කෙරේ. එබැවින් මෙම අංශය සඳහා සීඝ්‍ර නවීකරණයක් හා තාක්ෂණික මැදිහත්වීමක් අවශ්‍ය වන අතර එමගින් සාම්ප්‍රදායික ක්‍රියාකාරීත්වයන් සඳහා බාධා ඇතිකිරීමක් ද නොවිය යුතුය. තවද මේ සඳහා නවීන  ගොවි ප්‍රජාවක් ඇති කිරීම, තාක්ෂණය වැඩිදියුණු කිරීම, අදාල ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු හා සේවා සැපයුම් වැඩසටහන් අවශ්‍ය වන අතර එවැනි ක්‍රියාකාරකම් යෝජිත අධිනාගරිකයන් හා ප්‍රධාන නගර කේන්ද්‍ර කොට ගෙන ආර්ථික කටයුතු පවත්වා ගත හැක.

**2.7.3 සඵලදායී ඉඩම් භාවිතය**

සඵලදායී ඉඩම් භාවිතය

දත්ත වලට අනුකූලව වී ගොවිතැන හා මධ්‍යකඳුකර ප්‍රදේශයේ වතුවගාව යන ද්විත්ව ගොවිතැන් කටයුතු සඳහා භාවිත කර ඇති මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් දහ හත් ලක්ෂයක් (1.7 මිලියන) පමණ වන අතර එය සමස්ථ භූමි ප්‍රමාණයෙන් හතරෙන් එකක් (25%) පමණ වේ. එසේම සංඛ්‍යා දත්ත වලට අනුකූලව වගාවන් සඳහා යොදාගෙන ඇති භූමි ප්‍රමාණය පසුගිය දශකය තුළ 15%කින් පමණ වර්ධනය වී ඇත. මෙම රූපනය ප්‍රධාන අංශ දෙකක් කෙරේ අවධනය යොමුකරවයි. ඉන් පළමුවැන්න වන්නේ කෘෂිකර්මාන්තය සඳහා භාවිත කර ඇති අමතර ඉඩම් අත්‍යවශයෙන්ම සපයාගෙන ඇත්තේ වනාත්තර හා සංරක්ෂණ ඉඩම් වලින් වන අතර මෙය ධනාත්මක නිමිත්තක් නොවේ. දෙවැන්න වනුයේ මෙම කාල සීමාව තුල ඇති වූ ඵලදායීතාවයට ගැටළු මතුකරන ගංවතුර තත්වයන් ය. එම නිසාවෙන් කෘෂිකාර්මික භාවිතයන් සඳහා ඉඩම් වෙන්කිරීමේ දී හා ඒ හා සම්බන්ධ කටයුතුවල සමීප පාලනයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් බලපවත්වනු ලබන ක්‍රමවේදයක් ඇති කර ඉන් සමස්ථ ජාතිය සඳහා ප්‍රතිලාභ අත්පත් කරදීම සඳහා අත්‍යවශ්‍ය වේ.

**2.7.4 නාගරික ප්‍රදේශවල ඇති කෘෂිකාර්මික ඉඩම් ආරක්‍ෂා කිරීම**

කෘෂිකාර්මික ඉඩම් ආරක්ෂා කිරීම

භෞතික සංවර්ධනය සඳහා නාගරික ප්‍රදේශවල ඇති කුඹුරු හා වතුවගා කෘෂිකාර්මික ඉඩම්වලට ඇත්තේ වැඩිවන ඉල්ලුමකි. නාගරික ප්‍රදේශවල කෘෂිකාර්මික ඉඩම් භාවිතයන් පැවතීම ආර්ථික වශයෙන් ලාභදායි නොවුනත්, පරිසර පද්ධතිවල පැවැත්ම, අපවහනය, නාගරික උණුසුම  පාලනය කිරීම හා සුළං තීරයන් පවත්වාගෙන යාම, මහජන විවෘත ප්‍රදේශ අවශ්‍යතාවය, විවිධ ස්ථාන වලට ආවේණික ස්වභාව සෞන්දර්ය ආදී වෙළඳපල පදනම් නොකරගත් ලාභයන් පිළිබඳව ද නාගරික සංවර්ධන සැලසුමක් මගින් ඇගයීමක් කලයුතු වේ.

**2.75 ඉහළ ගුණාත්මක බවකින් යුත් වතුවගාවන්**

ඉහළ ගුණාත්මක බවකින් යුත් වගාවන්

තේ, රබර් හා පොල් යන වගාවන් විදේශ ආදායම් ඉපැයීම සඳහා ප්‍රධාන දායකත්වයක් ලබාදෙනු ලැබූව ද ඒවායේ ඇති වැදගත්කම අනෙකුත් සාම්ප්‍රදායික අපනයනයන් සමග ක්‍රම ක්‍රමයෙන් අඩුවෙමින් පවතී. තේ හා රබර් වගාවන් ආශ්‍රිත වත්මන් ගැටළුකාරී තත්වයන් වන කම්කරු හිඟය, අනෙක් නිෂ්පාදනකරුවන්ගෙන් ඇතිවන තරඟකාරීත්වය, ආදේශක නිසාවෙන් වෙළඳපොල අඩුවී යාම ආදී කරුණු ශ්‍රී ලංකාවට තවදුරටත් වතුවගාව සම්ප්‍රදායික ලෙස කරගෙනයාමට දිරියක් නොදේ. ඒ වෙනුවට කල හැකිව ඇත්තේ ඉහල ගුණාත්මක බවකින් යුතු නිෂ්පාදනයන් ප්‍රවර්ධනය කිරීමක් පමණකි.

**2.7.6 මධ්‍යම අධිසංවේදී ප්‍රදේශයේ නැවත වනවගා කිරීම**

මධ්‍යම අධිසංවේදී ප්‍රදේශයේ නැවත වන වගා කිරීම

ඉහල උන්නතාංශ වල තේ වගාකිරීම සමග ඇතිව ඇති පාරිසරික ගැටළු නිසාවෙන් හා මධ්‍යම අධිසංවේදී ප්‍රදේශය සංරක්ෂණය කිරීමට ඇතිව ඇති අවශ්‍යතාවය නිසාවෙන් භාවිතයට නොගන්නා වතුවගාවන් වාණිජ නොවන වන වගාවන් හා සම්ප්‍රදායික නොවන අපනයන බෝග වගාවන් බවට පරිවර්තනය කිරීමට මෙම සැලසුම මගින් යෝජනා කරනු ලැබේ. එසේම 2020-2050 අතර කාලය තුල මීටර් 300කට වඩා උන්නතාංශයකින් යුත් ප්‍රදේශවල තේවගාව සඳහා උපයෝගිකරගෙන ඇති ඉඩම් ප්‍රමාණය 01%ක් දක්වා අඩු කිරීමට ද යෝජනා කෙරේ. තවද පහත රට ප්‍රදේශවල ඇති වතුවගාව එම ආකාරයෙන්ම පවත්වාගෙනයාමට යෝජනා කරන නමුත් ඒ සඳහා සුදුසු ඉඩම්වල යොදාගන්නා බව තහවුරු කිරීම සඳහා දැඩි රෙගුලාසි පැවතිය යුතුවේ.

**2.7.7  නාගරික  වනාන්තර**

නාගරික වනාන්තර

යෝජිත සංවර්ධන ජාල තුල ඇති කෘෂිකාර්මික හා රබර් ඉඩම් සඳහා (විකල්ප සංවර්ධන අවශ්‍යතාවයන් සඳහා) අනාගතයේදී ඉල්ලුමක් ඇතිවිය හැකිය. මෙම ඉඩම්වල ඉහල ඵලදායිතාවයක් නොමැති වුවත් එම ඉඩම් මගින්

කාබන් විමෝචනයට හුදකලා වශයෙන් ලබාදෙන දායකත්වය, වායුගෝලීය උෂ්ණත්වය අඩුකිරීම හා එමගින් ලබාදෙන ස්වභාව සෞන්දර්යයට සාපේක්ෂව එවැනි ඉඩම්වල ඇති වෙළඳපල වටිනාකම හා එවැනි ප්‍රාදේශිය ඉඩම් සඳහා සකස්කරනු ලබන සැලසුමක් මගින් ඵලදායි භාවිතයන් සඳහා යොදාගැනීම ආදී තත්වයන් අනුව තත්වයෙන් තත්වයට ඇගයීම් කල යුතුවේ. අඩු නාගරික පරිසරවල පිහිටි මෙවැනි ඉඩම් වශයෙන් 60%ක් පමණ 2016 UN REDD වැඩසටහන මගින් සකස්කරනු ලැබූ ජාතික වනාන්තර වැඩිකිරීමේ ඉලක්කයන් ලඟාකරගැනීම සඳහා සංරක්ෂණය කිරීමට යෝජනා කරනු ලැබේ.

**2.7.8 පොල් ඉඩම් ආරක්ෂා කිරීම**

පොල් ඉඩම් ආරක්ෂා කිරීම

නොගිලිහෙන ඉල්ලුමක් පැවතිය හැකි පොල් වගාව 2030 දක්වා විශාල වශයෙන් ආරක්ෂාකර ගැනීමට අවශ්‍යව ඇත. ඉඩම් කට්ටිකරණය හා වතු සංරක්ෂණය කරගැනීම පිළිබඳව විධිමත් විකල්ප ආර්ථික ක්‍රියාමාර්ග මගින් කතාකල යුතු වේ. මේ අනුව අක්කර 10ට අඩු ඉඩම් කට්ටිකරණය පිළිබඳව ඇති වර්තමාන ප්‍රතිපත්තිය පිළිබඳව නැවත විමසා බැලිය යුතු වේ.

**2.8 ධීවර කටයුතු**

**2.8.1 අරමුණු**

ධීවර කටයුතුවල සංවර්ධනය සහ ජලජ සම්පත්

ධීවර අංශයේ සංවර්ධනය සඳහා වර්තමානයේ පවතින සැලසුම වනුයේ ධීවර හා ජලජ සම්පත් අංශ සඳහා සකස්කර ඇති 2007-2016 දස අවුරුදු සංවර්ධන ප්‍රතිපත්ති රාමුව (2007) ය. එමගින් පහත ආංශික ප්‍රතිපත්ති වලින් අභිමත ඉලක්කයන් සපුරාගැනීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හා ක්‍රියාකාරකම් සපයනු ලැබේ.

- ජාතික මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම මගින් පෝෂණ මට්ටම ඉහළ නැංවීම හා ජනතාවගේ ආහාර සුරක්ෂිතතාවය වැඩිකිරීම
- පසු අස්වනු හානිය අඩුකිරීම හා මත්ස්‍ය නිෂ්පාදනයේ ගුණාත්මක බව හා ආරක්ෂාව පිළිගත් ප්‍රමිතීන් වලට අනුව වැඩිදියුණු කිරීම
- ධීවර අංශයේ රැකියා අවස්ථාවන් හා ඒ අශ්‍රිත කර්මාන්ත වැඩිකිරීම හා ධීවර ප්‍රජාවගේ සමාජ ආර්ථික තත්වය වැඩිදියුණු කිරීම
- ධීවර නිෂ්පාදන මගින් විදේශ විනිමය ඉපැයීම් වැඩිකිරීම
- වෙරළබඩ හා ජලජ පරිසර සංරක්ෂණය කිරීම
- ධීවර අංශයේ ජාතික සංවර්ධන උපායමාර්ගය 2010- 2013' එම අංශයේ සංවර්ධනය සඳහා පැවති කෙටිකාලීන සංවර්ධන සැලසුම වේ. එම උපාය මාර්ගය මගින් පහත අංශ කෙරේ අවධානය යොමුකර ඇත.
- 2013 වන විට වාර්ෂික ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය කිලෝග්රෑම් 21.9 දක්වා වැඩි කිරීම
- දේශීය මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම. 2013 වන විට පදනම් වර්ෂයේ ජාතික මාලුබනිෂ්පාදනය දෙගුණ කිරීම
- වෙළඳපොල ප්‍රවර්ධනය කිරීම මගින් මිල තරඟකාරීත්වයක් ගොඩනගා ගැනීම
- ධීවර කටයුතු වල සංවර්ධනය හරහා ධීවර ප්‍රජාවගේ සමාජීය සංවර්ධනය සඳහා ක්‍රියාමාර්ග ගැනීම
- නාවික තාක්ෂණයෙන් හා ජාත්‍යන්තර මුහුදු නීති අනුව ධීවර කටයුතු ක්‍රියාවට නැංවීම හා පාළනය කිරීම

මෙම සැලසුම්වල වලංගුභාවය මේ වන විට අවසන්ව ගොස් ඇති බැවින් මෙම සැලසුම්වල අරමුණු ඉටුකරගැනීම පිළිබඳව තක්සේරු කිරීමක් මෙන්ම නව සැලසුමක් සකස්කිරීම ද සිදුකල යුතුව ඇත.

**2.8.2 පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම**

ධීවර කර්මාන්තයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

වෙරළබඩ හා නොගැඹුරු ධීවර කර්මාන්තයට අදාලව පවතින යටිතල පහසුකම් වලින් (ප්‍රධාන ධීවර වරායන්, බෝට්ටු නැංගුරම්ලෑමේ ස්ථාන, එකතුකිරීමේ මධ්‍යස්ථාන, ගබඩා හා පුහුණු පහසුකම්) දිවයින පුරා ඇති වෙරළබඩ කලාපය මැනවින් ආවරණය වී ඇත. ධීවර අංශය නවීකරණය කිරීම සඳහා හා ධීවර කටයුතු වල නියුතු ප්‍රජාවගේ ජීවන තත්වය නගාසිටුවීම සඳහා මෙම පහසුකම් වල ඉක්මන් හා විශාල වැඩිදියුණු කිරීමක් අවශ්‍යව ඇත. නව යටිතල පහසුකම් ස්ථාපනය කිරීම පිළිබඳව 2030න් පසුව පමණක් සලකාබැලිය හැක.

**2.8.3 පසු අස්වනු කළමනාකරණය, සැකසුම් හා අගය එකතුකිරීම් සඳහා ඉඩකඩ සැලසීම**

මත්ස්‍ය අස්වැන්නේ කාර්යක්ෂම කළමනාකරණයට හා මත්ස්‍ය අස්වැන්න සඳහා අගය එකතුකිරීමට සහයතාවය දැක්වීම සඳහා නිෂ්පාදන කර්මාන්ත ශාලා, ඇසුරුම් කිරීමේ ඒකක, ශීත ගබඩා පහසුකම් වැනි අවශ්‍ය පහසුකම් කොළඹ, මීගමුව, බේරුවල, ත්‍රිකුණාමලය, ගාල්ල, මාතර, තංගල්ල, හම්බන්තොට, යාපනය, මන්නාරම, මුලතිව්, මඩකලපුව, ඔලුවිල් හා කල්පිටිය වැනි ප්‍රධාන ධීවර මධ්‍යස්ථාන වලට සැපයිය යුතුය.

**2.8.4 මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම**

ප්‍රධාන ජලාශ ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තය දියුණුකල යුතු නමුත් එවැනි ස්ථාන තෝරා ගැනීමට පෙර මත්ස්‍ය අභිජනනය කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා ඇති බාධක පිළිබඳව සැලකිල්ලක් දැක්විය යුතුය.

මිරිදිය ධීවර කර්මාන්තය සංවර්ධනය කිරීම

**2.9 ඩිජිටල් යටිතල පහසුකම්**

**2.9.1 අරමුණ**

මුළු ලොවම අන්තර්ජාල පහසුකම්වලට පරිණාමය වන යුගයක, ශ්‍රී ලංකාව ද ජාතික, කළාපීය සහ ප්‍රාදේශීය ලෙස සැලසුම්, පරිපාලන, මහජන සම්බන්ධතා, සන්නිවේදන, රාජ්‍යයන් අතර දේශීය සහ අන්තර්ජාතික සබඳතා වලින් ඩිජිටල් යටිතල පහසුකම් සඳහා සූදානම් කිරීමට සිදු වේ.

ඩිජිටල් යටිතල පහසුකම්

ජාතික මට්ටමේ මූලාරම්භයන් සහ වැඩසටහන් කිහිපයක් දැනටමත් සුදුසු ලෙස ආරම්භ වී ඇති අතර, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමේ දී එහි වැදගත්කම අනුව පහතින් දක්වා තිබේ.

**2.9.2 අවකාශීය දත්ත යටිතල පහසුකම් ( Spatial Data Infrastructure)**

සෑම මට්ටමකට සැලසුම්, ක්‍රියාත්මක කිරීම්, නියාමනය කිරීම සහ බලාත්මක කිරීමේ දී අවකාශීය තොරතුරු මූලික අවශ්‍යතාවයක් වේ. උසස් තාක්ෂණයත් සමග වේගවත්, විශ්වාසනීය, ඉතා නිවැරදි සහ පිරිවැය ඵලදායීතාවයෙන් යුත් (සංඛ්‍යාංක ආකෘති අවකාශීය තොරතුරු සඳහා) සියලු කාර්යයන්හිදී ඉහළ ඉල්ලුමක් පවතී. වර්තමානයේ දී ජාතික මට්ටමේ සංවිධාන කිහිපයක් සංඛ්‍යාංක අවකාශීය තොරතුරු භාවිතා කරන නමුදු මෙම දත්ත ගබඩාවන් නිර්මාණය කිරීම සහ නඩත්තු කිරීම එම එක් එක් ආයතනයන්ගේ සුවිශේෂී වූ අවශ්‍යතා සඳහා පමණක් වීම අවාසනාවකට කරුණක් වේ. අයිතිය, අනම්‍යතාවය, නිලතන්ත්‍රය වැනි කරුණු හේතුවෙන් මෙම තොරතුරු පද්ධති පුළුල් ලෙස පැතිරීම අවහිර වී ඇත. සංවර්ධන අරමුණු දෙසට ගමන්කිරීම උදෙසා අවකාශීය තොරතුරු එකතුකිරීම සහ අලුත්කිරීම, සත්‍යතාවය බැලීම, ප්‍රචාරණය සහ සම්බන්ධීකරණය සඳහා ජාතික තලයේ අධිකාරියක් කාලානුරූපව අවශ්‍ය වී තිබේ.

අවකාශීය දත්ත යටිතල පහසුකම්

ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය මගින් ආරම්භ කරන ලද සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණික ආයතනය (ICTA) මගින් ක්‍රියාත්මක කරන ලද ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI) ඉහළ හා කාලීන වටිනාකමකින් යුක්ත වේ. ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI), විවිධ ආයතන මගින් යාවත්කාලීන කරන ලද, විවිධ ආයතනවල විවිධ අරමුණු සඳහා පුළුල් භාවිතයන් සඳහා, පිළිගත් විවිධ වූ අවකාශිය දත්ත සඳහා විද්‍යුත් වේදිකාවක් සපයනු ලබයි. එමගින් ද්විත්ත්වකරණය වැළැක්වීම, අවම පිරිවැයක් සහිත වීම, විශ්වාසනීයත්වය ඉහළ නැංවීම සහ තොරතුරුවල ඒකීයත්වය, විවිධ සංවර්ධන වැඩසටහන් අතර සහක්‍රියාවන්ට මගපෙන්වීම සිදුකරනු ලබයි. මේ නිසා ජාතික අවකාශීය දත්ත යටිතල පහසුකම් (NSDI) ශක්තිමත් කිරීම හදිසි අවශ්‍යතාවයක් වේ.

**2.9.3 පෞද්ගලික දත්ත/ අනන්‍ය යටිතල පහසුකම්**

අවකාශීය තොරතුරුවලට සමාන්තරව, කාර්යක්ෂමතාවය ක්‍රමවත්බව, පිරිවැය ඵලදායීතාවය සඳහා සෞඛ්‍ය, අධ්‍යාපනය, සමාජ සුභසාධනය, බැංකු, ආරක්ෂාව, ආදායම් බදු සහ ශක්‍යතා ධාරිතාවය වැනි සියලුම අංශවල පුරවැසියන් සඳහා සේවා සැපයුම් කාර්යක්ෂම කිරීමට විද්‍යුත් පෞද්ගලික තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය මතුව තිබේ. වර්තමානයේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් ඉලෙක්ට්‍රොනික ජාතික හැඳුනුම්පත ක්‍රියාවට නැංවීම ප්‍රශංසනීය ආරම්භයක් ලෙස සැලකිය හැකි අතර, 'විද්‍යුත් හැඳුනුම් ක්‍රියාවලිය', පොදු අභිරුචිය මෙන්ම රජයේ අරමුණු ළඟා කර ගැනීමේ දී ඉහළ සේවාවක් සපයන වේගවත් සංවර්ධනයකට සහාය දෙයි. රහස්‍යභාවය සමග විවිධ ආයතන අතර පුළුල්ව විහිදුණු, සෞඛ්‍ය සහ වෛද්‍ය පහසුකම් සඳහා නෛතික සැකසුමක් සහ ආරක්ෂක ක්‍රියාමාර්ගයන් සහිත වූ, අධ්‍යාපනයේ නියැලීම, ආරක්ෂාව සම්බන්ධ කටයුතු සහ පොදු සේවාවන්ට ළඟාවීමේ හැකියාව සංවර්ධනය කරන ලද විද්‍යුත් හැඳුනුම් ක්‍රියාවලිය ජෛවමිතික දත්ත සංචිතයක අවශ්‍යතාව පෙන්වයි. ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව

පෞද්ගලික දත්ත යටිතල පහසුකම්

මගින් මෙවැනි දත්ත සම්මුච්චිත ක්‍රියාත්මක කිරීම් සහ නඩත්තු කිරීම් කළ යුතුය. ආරම්භයේදී ඉහළ පිරිවැයක් දරා ස්ථාපනය කළ යුතු වුවත් ආයතනවල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේදී සහ පොදු සේවාවන් වලදී රජය විසින් දැරිය යුතු අමතර පිරිවැය මෙමගින් අවම කර ගත හැකිය.

සංවර්ධනය සහ සංරක්ෂණය කිරීම සඳහා වන ප්‍රතිපත්ති හා සැලසුම්

**2.10 පවතින ප්‍රතිපත්ති හා සැලසුම්**

පහත සඳහන් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති හා සවිස්තරාත්මක සැලසුම් ප්‍රකාශයට පත්කර ඇති බව හෝ සකස්කර ඇති බව නිරීක්ෂණය කල හැකිය. ජාතික භෞතික සැලසුම් මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හා ජාතික භෞතික සැලසුම සකස්කිරීමේදී මෙම සැලසුම් හා ප්‍රතිපත්ති පිළිබඳව අධ්‍යනය කරන ලදි. මෙම සැලසුම් හා ප්‍රතිපත්ති බොහෝ වශයෙන් 03 වන කොටසේ දී දක්වන ලද ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්ති සමග අනුකූල වේ. එබැවින් මෙම සැලසුම ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් සැලසුම් හා ප්‍රතිපත්ති මෙම සැලසුම හා අනුකූල වන සුවිශේෂී ආංශික ප්‍රතිපත්ති වශයෙන් සලකනු ලැබේ.

**2.10.1 වායු ගුණාත්මක බව කළමනාකරණය කිරීම සඳහා වන ක්‍රියාකාරී සැලසුම - පිරිසිදු වාතයක් සඳහා වන ක්‍රියාකාරී සැලසුම 2025** (An action Plan for air Quality Management - Clean Air Action Plan 2025)
මෙම සැලසුම් සම්පත් කලමනාකරණ මධ්‍යස්ථානය විසින් සකස්කර ඇත.

**2.10.2 ජාතික ජෛව විවිධත්ව උපාය මාර්ගික සැලසුම 2016-2022** (National Biodiversity Strategic Action Plan (NBSAP)

මෙම සැලසුම ජෛව විවිධත්වය සඳහා වන ලේකම් කාර්යාලය, මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් පරිසර සංරක්‍ෂණය සඳහා වන ජාත්‍යන්තර සංවිධානයේ ශ්‍රී ලංකා කාර්යාලයේ (IUCN)තාක්‍ෂණික සහයෝගය සමග සකස් කර ඇත (2016 මැයි).

**2.10.3 ජාතික දේශගුණික වෙනස්වීමේ ප්‍රතිපත්තිය (2012) හා ජාතික ආපදා කළමනාකරණ ප්‍රතිපත්තිය (2010)** (National Climate Change Policy (2012) and National Disaster Management Policy (2010)
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් 'ජාතික ආපදා කළමනාකරණ සැලසුම 2013-2017' සකස්කර ඇත.

**2.10.4 අලි සංරක්‍ෂණ ජාතික ප්‍රතිපත්තිය -2006** (National Policy on Elephant Conservation – 2006) මෙම ප්‍රතිපත්තිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සකස්කර ඇත.

**2.10.5 වනජීවී සංරක්‍ෂණ ජාතික ප්‍රතිපත්තිය-2000** (The National Policy on Wild Life Conservation - 2000) මෙම ප්‍රතිපත්තිය මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් සකස්කර ඇත.

**2.10.6 ජාතික ආයෝජන වැඩසටහන හා ක්‍රියාකාරී සැලැස්ම 2017** (National REDD+ Investment Framework and Action Plan (NRIFAP) 2017)

මෙම වැඩසටහන හා ක්‍රියාකාරී සැලසුම වන හායනය හා වනාන්තර අඩුවීමෙන් ඇති වන විමෝචනයන් අඩුකිරීමේ ශ්‍රී ලංකා ජාතික වැඩහටහන හා එක්සත් ජාතීන්ගේ වන හායනය හා වනාන්තර අඩුවීමෙන් ඇති වන විමෝචනයන් අඩුකිරීමේ වැඩසටහන මගින් 2017 දී සකස්කර ඇත.

**2.10.7 ශ්‍රී ලංකා සංචාරක උපාය මාර්ගික සැලසුම 2017-2020** ( Sri Lanka Tourism Strategic Plan (2017-2020)
මෙම සැලසුම ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සකස්කර ඇත.

**2.10.8 ජාතික ඛනිජ සම්පත් ප්‍රතිපත්තිය** (National Policy on Mineral Resource)
මෙම ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් අංශයේ ඇති උපරිම විභවතාවයන් ප්‍රයෝජනයට ගැනීම, දිවයිනේ ඛනිජ සම්පත් සඳහා අගය එකතුකිරීම් ප්‍රවර්ධනය කිරීම, සමාජීය හා ආර්ථික අවශ්‍යතාවයන් සමබරව පවත්වාගෙන යන අතරතුර තිරසාරී සංවර්ධන ක්‍රියාමාර්ග මගින් පරිසර කළමනාකරණය තහවුරු කිරීම සඳහා කළමනාකරණය කිරීමේ හා ශක්තිමත් කිරීමේ අරමුණින් ජාතික විද්‍යා හා තාක්‍ෂණික කොමිසම මගින් සකස්කර ඇත.

**2.10.9 විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම්** (Telecommunication and Digital Infrastructure)
ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම මගින් ෆයිබර් ඔප්ටික් ජාල සැලසුම සකස්කර ඇත.

**2.10.10 ජාතික නිවාස ප්‍රතිපත්තිය (2019 ජනවාරි ප්‍රතිශෝධනය)**

මෙම ප්‍රතිපත්තිය නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් සකස් කර ඇත.

දැනට ප්‍රකාශයට පත් කර ඇති ජාතික නිවාස ප්‍රතිපත්තියට අමතරව, නාගරික ප්‍රදේශ වල වඩා හොඳ සමාජ සම්මිශ්‍රණයක් සඳහා පුද්ගලික අංශය සමග තරඟකාරීව අඩු ආදායම් හා මධ්‍ය ආදායම් පවුල් වලට දැරිය හැකි නිවාස සඳහා සුදුසු ප්‍රදේශ වල රජයේ ආයතන වල මැදිහත්වීමෙන් නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීම අත්‍යවශ්‍ය වේ.

**2.11 අවශ්‍ය ප්‍රතිපත්ති හා සැලසුම්**

මෙම සැලසුම්න් අභිමත සංවර්ධනයට සහාය දැක්වීම සඳහා පහත සඳහන් විෂය ක්ෂේත්‍රයන් සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්ති වල හා සැලසුම් වල අවශ්‍යතාවයක් ඇති බවට නිරීක්ෂණය වේ. අනාගත සංවර්ධනය සඳහා අවශ්‍ය වන ප්‍රතිපත්ති හා සැලසුම්

**2.11.1 සාගර සම්පත් සංවර්ධනය හා සමුද්‍ර දූෂණය වැළැක්වීම**

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක කරගත හැකි සාගර සම්පත් වල සඵලදායී හා තිරසර භාවිතයක් සඳහා ජාතික මට්ටමේ ප්‍රතිපත්තියක හා සැලසුමක අවශ්‍යතාවයක් පවතී. තවද මෙම සම්පත් වල තිරසර බව රඳා පවතිනුයේ ඒවායේ මනා කළමනාකරණය අනුවය. නැව් කටයුතු ආශ්‍රිත ක්‍රියාකාරකම්, නීති විරෝධී මසුන් ඇල්ලීමේ ක්‍රම, වෙරළබඩ දූෂණය වීම, ගොඩබිම ඇති අපද්‍රව්‍ය මුහුදට බැහැර කිරීම, කැනීම් කටයුතු ආදී ක්‍රියාකාරීත්වයන් හේතුකොටගෙන සමුද්‍ර දූෂණය සිදුවන අතර එය සාගර සම්පත්වල දිගුකාලීන පැවැත්මට හා තිරසර භාවිතයට ප්‍රධාන තර්ජනයක් වේ. මේ අනුව සමුද්‍ර දූෂණය වැලැක්වීමේ ප්‍රතිපත්තියක අවශ්‍යතාව ඉස්මතුව ඇත.

**2.11.2 ශ්‍රම සම්පත සංවර්ධනය**

මානව සම්පත ඕනෑම රටක ජාතික සංවර්ධනය සඳහා ඉතා වැදගත් වන සාධකයක් වේ. එහෙත් තවමත් මෙරට ශ්‍රම සම්පත් භාවිතය සඵලදායී ලෙස කළමනාකරණය කර නොමැති බව නිරීක්ෂණය වී ඇත. තවද ඉහළ ගෙවීමක් සිදුකරන අංශ කිහිපයක (උදා: ඉදිකිරීම්, නිෂ්පාදන, ඉලෙක්ට්‍රොනික, තොරතුරු තාක්‍ෂණය ආදී) දැඩි ශ්‍රම හිඟයක් පවතින අතරම මේ හා සමානම ශ්‍රම අතිරික්තයක් ත්‍රිරෝද රථ ක්‍රියාකරුවන්, පදික වෙළඳාම වැනි අවිධිමත් ක්‍රියාකාරකම් සඳහා යෙදවී ඇත. මෙම තත්ත්වය අධ්‍යාපන සංවර්ධනය සමග සම්බන්ධ වූ ජාතික මට්ටමේ මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක හා සැලසුමක ඇති කාලීන අවශ්‍යතාවය පැහැදිලිව පෙන්වා දෙනු ලබයි.

**3.1 ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ගය**

**3.1.1 අරමුණ**

මෙම වාර්තාවේ 1 වන කොටසින් සඳහන් කරන ලද පරිදි ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ භෞතික පරිසරය සම්බන්ධ කටයුතු සැලසුම් කිරීමේදී හා ඒ සඳහා ඍජු බලපෑමක් ඇතිකරනු ලබන පහසුකම් හා සේවාවන්ට අදාල යටිතල පහසුකම් ස්ථාපනය කිරීමේදී ජාතික මට්ටමේ සියළුම සංවර්ධන ආයතනයන්ට එම සංවර්ධන කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා පුළුල් වූ මාර්ගෝපදේශකත්වයක් සැපයීමයි. ක්‍රියාත්මක කිරීම

ජාතික භෞතික සැලසුම උක්ත සඳහන් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියෙන් ව්‍යුත්පන්න වූ ක්‍රියා රාමුවක් වේ. මෙම සැලසුම මගින් පුළුල් වූ භෞතික ව්‍යුහ ක්‍රියා රාමුවක් සපයන අතර එය බලාත්මක කිරීම සඳහා තාක්‍ෂණික වැඩපිළිවෙලක් සේම පරිපාටික වැඩපිළිවෙලක් ද අවශ්‍ය වේ. ඒ යටතේ පහත උපාය මාර්ග යෝජනා කෙරේ.

**3.2 තාක්‍ෂණික වැඩපිළිවෙල**

**3.2.1 සවිස්තරාත්මක කලාපීය භෞතික සැලසුම**

නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත (2000 සංශෝධිත පනත) මගින් දක්වන ප්‍රතිපාදනයන්ට අනුව ප්‍රධාන ජාතික භෞතික සැලසුම පලාත් මට්ටමින් හෝ විශේෂයෙන් ප්‍රකාශයට පත්කරන ලද කලාප මට්ටමින් සකස්කරන ලද සවිස්තරාත්මක කලාපීය සංවර්ධන සැලසුම් බවට පරිවර්තනය කල යුතුය. පහත සඳහන් සැලසුම් ප්‍රමුඛතා සැලසුම් වශයෙන් යෝජනා කරනු ලැබේ. කලාපීය සංවර්ධන සැලසුම්

1. නැගෙනහිර- බටහිර සංවර්ධන ජාල (Development Corridor) කලාපීය සංවර්ධන සැලසුම
2. උතුරු සංවර්ධන ජාල (Development Corridor) කලාපීය සංවර්ධන සැලසුම
3. දකුණු සංවර්ධන ජාල (Development Corridor) කලාපීය සංවර්ධන සැලසුම
4. නැගෙනහිර සංවර්ධන ජාල (Development Corridor) කලාපීය සංවර්ධන සැලසුම
5. විසල් මහනුවර කලාපීය සංවර්ධන සැලසුම
6. විසල් අනුරාධපුරකලාපීය සංවර්ධන සැලසුම
7. ප්‍රධාන නගර 9 ආශ්‍රිත කලාපීය සංවර්ධන සැලසුම

8. මධ්‍ය කඳුකරය හා ඒ ආශ්‍රිත සංවේදී ප්‍රදේශය සංරක්ෂණය නිරීමේ සැලසුම

9. වන සංරක්ෂණය හා ජෛව විවිධත්ව ආරක්ෂණ සැලසුම

10. වැව් හා ඒ ආශ්‍රිත ජල පෝෂණ එල්ලංගා ප්‍රතිෂ්ඨාපනය කිරීමේ සැලසුම

වර්තමානයේ පවතින නෛතික රාමුව හා ආයතනික ව්‍යුහය තුල උක්ත සඳහන් සැලසුම් සකස්කිරීම එවැනි සැලසුම් සකස්කිරීම සඳහා බලය පැවරී ඇති හා එවන් සංවර්ධන සැලසුම් සකස්කිරීම සඳහා ශක්‍යතාවයක් ඇති ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් හෝ නාගරික සංවර්ධන අධිකාරිය මගින් අදාල අනෙකුත් පාර්ශවයන්ගේ සහභාගීත්වයෙන් යුතුව කල යුතුවේ. වෙනත් ආයතනයක් මගින් මෙවැනි සැලසුමක් සකස්කරනු ලබන්නේ නම් සුනම්‍ය වැඩ පිළිවෙලක්, ඉහල මට්ටමේ එකඟතාවයක් හා ප්‍රධාන වෙනස්කම් අඩුවීමක් තහවුරු කිරීම සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, නාගරික සංවර්ධන අධිකාරිය හා අදාල පළාත් පාලන ආයතන එම සැලසුම් කටයුතු සඳහා සම්බන්ධ කරගත යුතුවේ.

එසේම කලාපීය සැලසුම් සඳහා යෝජනා කර ඇති ප්‍රදේශ වල සීමාවන් ශ්‍රී ලංකාවේ විවිධ පරිපාලන දිස්ත්‍රික්ක හරහා ගමන්කර ඇති බැවින් මෙම සැලසුම් සකස්කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා පලාත් පරිපාලනය හා දේශපාලන අධිකාරිය සමග ඉහළ මට්ටමේ සම්බන්ධීකරණයක් අවශ්‍ය වේ. තවද මෙම කටයුතු සම්බන්ධීකරණය කිරීමේ අධිකාරි බලය මෙහිදී ජාතිත භෞතික සැලසුම් දෙපාර්තමේනතුව වෙත ලබාදීමට යෝජනා කරනු ලැබේ.

**3.2.2 සවිස්තරාත්මක ප්‍රාදේශීය සංවර්ධන සැලසුම්**

වර්තමානයේදී ප්‍රාදේශීය සංවර්ධන සැලසුම් නාගරික සංවර්ධන අධිකාරිය මගින් 1978 නාගරික සංවර්ධන අධිකාරී පනත හා එහි සංශෝධනයන් මගින් එම ආයතනය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව සකස්කරන අතර නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත (2000 සංශෝධිත) පනත මගින් දක්වන ප්‍රතිපාදනයන්ට අනුව ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව හෝ එවැනි සංවර්ධන සැලසුම් හා ව්‍යාපෘති සකස්කිරීමට බලය පැවරී ඇති අනෙකුත් සංවර්ධන ආයතනයන් හා ආංශික සංවර්ධන ආයතන මගින් ද ඔවුනට පැවරී ඇති නීතිමය බලතල ප්‍රකාරව සැලසුම් සකස්කරනු ලැබේ. එමෙන්ම අදාළ ආංශික සංවර්ධන ආයතන මගින් ඔවුනට නෛතිකව පැවරී ඇති ප්‍රතිපාදනයන් ප්‍රකාරව මෙම සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කිරීම හා ක්‍රියාවට නැංවීම සිදුකරනු ලැබේ.

නමුත් මෙම සැලසුම් ජාතික භෞතික සැලසුමෙන් සකස්කරන ලද ක්‍රියාරාමුවට දැඩිව අනුගත විය යුතු බවට යෝජනා කරනු ලැබේ. කුමන හෝ ප්‍රධාන හේතුවක් නිසාවෙන් යම් වෙනස්වීමක් ඇති වුවහොත් එම වෙනස්වීම අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව (පහත 6.3.3 කොටස මගින් සඳහන් කරනු ලබන) විසින් විවරණය කල යුතු අතර ඒ සඳහා ජාතික භෞතික සැලසුම් සභාවේද (පහත 6.3.1 කොටස මගින් සඳහන් කරනු ලබන) අනුමැතිය ලබාගත යුතුවේ.

**3.2.3 ප්‍රතිපත්තිය හා සැලසුම සඳහා සංශෝධන එක්කිරීම**

ප්‍රතිපත්තිය හා සැලසුම සඳහා සංශෝධන එක්කිරීම

මෙහි දක්වන ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලසුම වසර 10ක් අවසානයේ ක්‍රියාත්මක කිරීමේ මට්ටම තක්සේරු කරනු වස් (එහි සාධනීය තත්වයන් හා සංශෝධන අවශ්‍යතාවයන් හඳුනාගැනීම සඳහා) සම්පූර්ණ වශයෙන් විවරණය කළයුතු වේ.

එම සංශෝධනයන් සිදු කරනු ලබන ආකාරය මෙම වාර්තාවේ 01 වන පරිච්ඡේදයේදී සඳහන් කර ඇත.

පාර්ශවකරුවන්ගේ සහයෝගය ඇතිව, මෙම අරමුණ සඳහා පිහිටුවනු ලබන තාක්ෂණික ඇගයීම් කමිටුවේ මගපෙන්වීම යටතේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් විවරණය කිරීමේ කාර්යය ආරම්භ කල යුතුය. මෙම කාර්යය ඉටුකිරීමේදී භෞතික සැලසුම් හා සංවර්ධන කටයුතු සඳහා 03 වන පරිච්ඡේදයේදී දක්වන ලද ප්‍රධාන මාර්ගෝපදේශ ප්‍රතිපත්ති හතර මූලිකාංග ලෙස අඛණ්ඩව පවත්වාගෙන යා යුතු අතර ප්‍රතිපත්තියේ හා සැලසුමේ අභිවෘද්ධිය උදෙසා එවැනි තවත් බොහෝ මූලිකාංග එකතුවනු ඇත.

**3.3.3 පරිපාටික වැඩපිළිවෙල**

**3.3.1 රජයේ ප්‍රධානියා මුලසුන හොබවන ජාතික භෞතික සැලසුම් සභාව විසින් වාර්ෂික ප්‍රගති සමාලෝචනයන් සිදුකිරීම**

පරිපාටික වැඩපිළිවෙල

වසර 2000 (සංශෝධිත) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ (3(1) කොටස මගින් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා සැලසුම සකස්කිරීම සඳහා යොමු කිරීමට 'ජාතික භෞතික සැලසුම් සභාව' නම් උත්තරීතර

මණ්ඩලය ස්ථාපනය කිරීම පිළිබඳව සඳහන් කර තිබේ. මෙම සැලසුම් සභාවේ සභාපති වශයෙන් රාජ්‍යයේ ප්‍රධානියා නම්කිරීම මගින් හා අනෙකුත් ප්‍රධාන අමාත්‍යාංශවලින් නියෝජිතයින් මෙම සභාවට නම්කිරීම මගින් ජාතික භෞතික සැලසුම හා ප්‍රතිපත්තිය සඳහා අවශ්‍ය නීත්‍යානුකූල භාවය හා උත්තරීතර බව සපයා දී ඇත.

මෙම සැලසුම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා හා පාලනය කිරීම සඳහා එහි සාධනයන් පිළිබඳව වාර්ෂික (හෝ ඊට අඩු) ප්‍රගති සමාලෝචනයන් අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව (6.3.3 කොටසින් සඳහන් කරන ලද) සිදුකල යුතු අතර එය අනුමැතිය සඳහා ජාතික භෞතික සැලසුම් සභාව වෙත යොමුකල යුතුවේ. කමිටුව විසින් සැලසුම් සභාව වෙත යොමුකරනු ලබන විවරණයන් හා ප්‍රතිචාර වලට අදාලව ගතයුතු ක්‍රියාමාර්ග සැලසුම් සභාව විසින් දන්වනු ලදුව සැලසුම් සඳහා අවශ්‍ය යාවත්කාලීන කිරීම් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ඇත.

**3.3.2 මෙම සැලසුමින් දැක්වෙන සංවර්ධන කටයුතු සඳහා වෙන්කරනු ලබන ප්‍රතිපාදන ප්‍රමුඛතාගත කිරීම ජාතික සැලසුම්/ ක්‍රමසම්පාදනය දෙපාර්තමේන්තුව මගින් සිදුකිරීම**

ජාතික හා කලාපීය මට්ටමේ ව්‍යාපෘති සකස්කිරීම හා ක්‍රියාත්මක කිරීම රජයේ භාණ්ඩාගාරය මගින් ලැබෙන ප්‍රතිපාදන මත දැඩිව රඳා පවතී. වර්තමානයේ පවතින වැඩපිළිවෙල අනුව වාර්ෂික අයවැය වෙන්කිරීම් මෙන්ම ව්‍යාපෘති හා වැඩපිළිවෙලවල් සඳහා වන විදේශාධාර ද ජාතික සැලසුම්/ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය හරහා ලැබේ. මේ අනුව මෙම වාර්තාව මගින් දක්වන ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය හා එහි ක්‍රියාත්මක කිරීමට බලපානු ලබන බොහෝ පාලනය කිරීම් ජාතික සැලසුම්/ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

එබැවින් මෙම සැලසුමේ මූලික ක්‍රියාකරුවකු ලෙස මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ පවතින ජාතික සැලසුම්/ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව යෝජනා කෙරේ. පෞද්ගලික අංශයේ දායකත්වයන් මගින් ලැබෙන අනෙකුත් සෘජු ආයෝජන පිළිබඳව නාගරික සංවර්ධන අධිකාරිය, පළාත් පාලන ආයතන, වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව, මාර්ග සංවර්ධන අධිකාරිය හා මධ්‍යම පරිසර අධිකාරිය වැනි අදාල ආයතන මගින්ම විවිරණය කරනු ලැබේ. තවද මෙම ආයතන ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියේ භාරකාරත්වය සඳහා නිර්නාමික ප්‍රධාන පාර්ශවකරුවන් ද විය යුතුවේ.

**3.3.3 ස්ථිරතාවය හා අඛණ්ඩත්වය සඳහා අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුවේ වාර්ෂික රැස්වීම්**

උක්ත සඳහන් කරන ලද වසර 2000 (සංශෝධිත) නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනතේ මගින් අන්තර් අමාත්‍යාංශ සම්බන්ධීකරණ කමිටුව ස්ථාපනය කර ඇති අතර එහි 4 ඒ (1) කොටස මගින් දක්වන ආකාරයට මෙම කමිටුවේ වාර්ෂිකව (හෝ නිතර) සිදුවන රැස්වීම් සංවර්ධන ආයතනයන්ගේ ඉදිරි අවශයතා හා අලුතින් මතුවන අවශ්‍යතාවයන් පිළිබඳව මෙන්ම ජාතික භෞතික සැලසුම සඳහා අවශ්‍ය වන්නා වූ අවශ්‍යතාවයන් හා කාලීන යාවත්කාලීන කිරීම පිළිබඳව එම ආයතනයන්ට අදහස් හුවමාරු කරගැනීම සඳහා අදහස් දැක්වීමට අත්‍යවශය වේ.

මෙම කමිටුව මගින් කාලයෙන් කාලයට ඉදිරිපත් කරනු ලබන නිර්දේශයන් පිළිබඳව තාක්‍ෂණික උපදේශන කමිටුව (උක්ත සඳහන් කරන ලද වසර 2000 පනතේ 5 සී කොටස මගින් ස්ථාපිත කර ඇත) විසින් අභ්‍යන්තරව විවරණය කළ යුතු අතර ජාතික භෞතික සැලසුම් සභාවේ අනුමැතිය සඳහා ද ඉදිරිපත් කල යුතුවේ.

**3.3.4 පළාත් සභාවන්හි හා පළාත් පාලන ආයතන වල ක්‍රියාත්මක කිරීමේ ඒකක වල ශක්‍යතාවය වර්ධනය කිරීම**

උක්ත සඳහන් කල පරිදි ජාතික භෞතික සැලසුම ක්‍රියාත්මක කිරීම විවිධ ආයතන විසින් සකස්කරනු ලබන ජාතික, කලාපීය හා ප්‍රාදේශීය මට්ටමේ සැලසුම් මගින් සිදු කලයුතු වේ. මේ කටයුතු සඳහා ආයතන අතරින් නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම පරිසර අධිකාරිය, හා මාර්ග සංවර්ධන අධිකාරිය වැනි ජාතික මට්ටමේ ආයතනයන්ට එවැනි ක්‍රියාත්මක කිරීම් සඳහා අවශ්‍ය තාක්‍ෂණික හා මූල්‍ය ශක්‍යතාවයන් ඇති නමුත් පලාත් පාලන ආයතන හා පලාත් සභා සඳහා එවැනි ක්‍රියාත්මක කිරීමක් සඳහා වර්තමානයේ දී ඇත්තේ අඩු හැකියාවක් හා අඩු ශක්‍යතාවයකි. පාරිසරික තිරසාරිත්වයට තර්ජනයක් එල්ලකරමින්, ආර්ථික ශක්‍යතාවයට ගැටළු ඇති කරමින් හා පුළුල් වූ සමාජ පිළිගැනීමටකට එරෙහිව යමින්, පලාත් පාලන ආයතන හා පලාත් සභා ආයතනයන්ගේ ආශිර්වාදයෙන් තොරව (එම ආයතන නොසලකා හැරීම නිසා) දිවයින පුරා සිදුකරගෙන යනු ලබන සම්බන්ධීකරණය නොවූ, සැලසුම් සහගත නොවූ අවිධිමත් සංවර්ධනය නිසාවෙන් මෙම තත්වය ඉතා ගැටළුකාරී බවට පත්ව ඇත.

ක්‍රියාත්මක කිරීම් පිටුපස ඇති මෙම නොගැලපීමට ප්‍රධාන හේතුව වනුයේ පළාත් පාලන අයතන තුල සැලසුම් පිළියෙල කිරීමට සුදුසු පරිසරයක් නොමැතිවීම, සැලසුම් හා ප්‍රතිපත්ති පිළිබඳව කථාකිරීම, ඒවා තේරුම් ගැනීම හා ඒ සඳහා ඒත්තුගැන්වීම් (පරිපාලනයට හා දේශපාලන අධිකාරියට) සිදුකල හැකි මට්ටම් වලට අවශ්‍ය තාක්‍ෂණික කාර්යය මණ්ඩලක් නොමැතිවීමයි.

මෙම තත්වය මැඩපවත්වා පළාත් සභා හා පළාත් පාලන ආයතන යන මට්ටම් දෙක ශක්තිමත් කිරීම සඳහා සුදුසුකම් ලත් 'නගර සැලසුම්කරවන්' එම ආයතන වෙත අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලබන අතර එමගින් ජාතික මට්ටමේ ප්‍රතිපත්ති ප්‍රාදේශීය මට්ටමේ ව්‍යාපෘති හා වැඩපිළිවෙලවල් බවට පරිවර්තනය කිරීම සේම ප්‍රදේශීය මට්ටමේ අවශ්‍යතාවයන් ජාතික මට්ටමේ සැලසුම් හා ප්‍රතිපත්ති තුලට අන්තර්ගත කිරීමත් අපේක්‍ෂා කෙරේ. පලාත් පාලන ආයතන හා පලාත් සභා අදාළ අමාත්‍යාංශයේ සහයෝගය ඇතිව තම ආයතන තුළ සැලසුම් පරිසරයක් ස්ථාපනය කිරීමට ඇති අවශ්‍යතාවයන් පිළිබඳව තක්සේරු කිරීම කලයුතුව ඇත.

**3.3.5 ස්ථිරසාරතාවය තහවුරු කිරීම සඳහා භාරකාර හා උනන්දුකරන කණ්ඩායම් පිහිටුවීම**

උක්ත සඳහන් විධිමත් පරිපාටික ක්‍රියාමාර්ගවලට අමතරව සැලසුම ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා දායකත්වය ලබාගැනීමේ අරමුණින් ජාතික භෞතික සැලසුම සඳහා භාරකාර මණ්ඩලයක් යෝජනා කරනු ලැබේ. මෙම මණ්ඩලය විධිමත් ආකාරයෙන් ස්ථාපිත කලහැකි නමුත් එහි ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන, ශිෂ්‍ය සංවිධාන, මාධ්‍ය සංවිධාන හා අනෙකුත් ස්වේච්ඡා සංවිධානයන් වැනි කැමැත්තක් දක්වන විවෘත අවිධිමත් සංවිධාන වශයෙන් සිදුකල හැකිය.

ජාතික භෞතික සැලසුම හා ප්‍රතිපත්තියේ ඇතිවන වෙනස්කම් හා වැඩිදියුණු කිරීම් පිළිබඳව සිදුකරන නිරීක්‍ෂණයන් හා විරෝධතායන් සම්බන්ධව භාරකාර මණ්ඩලයන්ට ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ සංවිධාන සමග නිරන්තර සංවාදයන් සිදුකල හැකිය. තවද මෙම මණ්ඩලය සැලසුමේ ප්‍රධාන වෙනස්කමක් හෝ ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සමග නොගැලපෙන කිසියම් හෝ සංවර්ධනයක් නිරීක්‍ෂණය වන ඕනෑම අවස්ථාවක දී ඒ පිළිබඳව හඬක් නැගීමට උනන්දුවන පිරිසකකින් ද යුක්ත වන සේ ශක්තිමත් කල යුතුවේ.

වගුව 01: නැගෙනහිර - යෝජිත සංවර්ධන ජාල තුළට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ

| | සංවර්ධන ජාලය/විසල් නාගරිකය/ ප්‍රධාන නගරය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | |
|---|---|---|---|
| | | ජාලයේ ආසන්නතම කළාපයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (10 කි.මී. ඇතුළත) | ජාලයේ පර්යන්ත කළාපයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (20 කි.මී. ඇතුළත) |
| | නැගෙනහිර - බටහිර ජාලය | | |
| 1 | කොළඹ විසල් නාගරිකය | කොළඹ, තිඹිරිගස්යාය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, දෙහිවල, මහරගම, කොළොන්නාව, කැළණිය, රත්මලාන, මොරටුව, කැස්බෑව, බියගම, මහර | හෝමාගම, වත්තල, ජා ඇල, කඩුවෙල |
| 2 | මීගමුව-කටුනායක විසල් නාගරිකය | කටාන, මීගමුව, වෙන්නප්පුව | |
| 3 | ගම්පහ විසල් නාගරිකය | ගම්පහ | මීනුවන්ගොඩ, දිවුලපිටිය, අත්තනගල්ල, දොම්පේ |
| 4 | මීරිගම-වරකාපොළ | මීරිගම, වරකාපොළ, නාරම්මල | රුවන්වැල්ල, ගලිගමුව, පන්නල |
| 5 | කුරුණෑගල විසල් නාගරිකය | කුරුණෑගල, මල්ලවපිටිය, මාවතගම, මාස්පොත, වීරඹුගෙදර, ඉබ්බාගමුව, රිදීගම | බමුණාකොටුව, ගනේවත්ත, පල්ලේපොල, යටවත්ත, මාතලේ |
| 6 | පොල්ගහවෙල- අලව්ව | පොල්ගහවෙල, අලව්ව | නාරම්මල, රඹුක්කන, කුලියාපිටිය නැගෙනහිර, කෑගල්ල |
| 7 | දඹුල්ල විසල් නාගරිකය | දඹුල්ල, ගලේවෙල, පලුගස්වැව | පොල්පිතිගම, කැකිරාව, පලාගල |
| 8 | | | Hingurakgoda,Medirigiriya |
| 9 | ත්‍රිකුණාමලය විසල් නාගරිකය | කන්තලේ, කින්නියා, තඹලගමුව, ත්‍රිකුණාමලය නගරය සහ කඩවත් | කුච්චවේලි, මොරවැව, මුතූර් |
| 10 | කළුතර - බේරුවල | කළුතර, බේරුවල | මතුගම, දොඩන්ගොඩ, මිල්ලනිය |
| 11 | පානදුර- හොරණ | පානදුර, බණ්ඩාරගම | හොරණ |
| | උතුරු ජාලය | | |
| 12 | යාපනය විසල් නාගරිකය කරවෙඩ්ඩි, කයිට්ස්, කෝප්පායි, වඩමා රච්චි වඩමාරච්චි උතුර | යාපනය, නල්ලූර්, තෙන්මරඩ්චි, පච්චිලෛපල්ලි බටහිර, දකුණු දිවයින, කරෛනගර්, | වලිකාමම් උතුර, වලිකාමම් දකුණ, වලිකාමම් බටහිර දකුණ, වලිකාමම් නැගෙනහිර, |
| 13 | පරන්තන් | කන්දවලායි | |
| 14 | කිලිනොච්චිය | කරච්චි | ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් |
| | | | |
| | දකුණු ජාලය | | |
| 15 | ගාල්ල විසල් නාගරිකය | අක්මීමන, ගාල්ල කඩවත් සතර, හබරාදූව, වැලිගම, ඉමදූව, බොපේ - පෝද්දල | හික්කඩුව, යක්කලමුල්ල |
| 16 | මාතර විසල් නාගරිකය | දෙවිනුවර, දික්වැල්ල, මාතර කඩවත් සතර, වැලිපිටිය, මාලිම්බඩ, තිහගොඩ | අකුරැස්ස කොටසක්, අතුරලිය, කඹුරුපිටිය, කිරින්ද පුල්වැල්ල |
| 17 | තංගල්ල - බෙලිඅත්ත | බෙලිඅත්ත, තංගල්ල | හක්මන, වීරකැටිය, ඔකේවෙල |
| 18 | ඇඹිලිපිටිය විසල් නාගරිකය | ඇඹිලිපිටිය | සෙවණගල |
| 19 | හම්බන්තොට විසල් නාගරිකය | අම්බලන්තොට, හම්බන්තොට, සූරියවැව | අඟුණකොළපැලැස්ස, ලුණුගම්වෙහෙර |

| | සංවර්ධන ජාලය/විසල් නාගරිකය/ ප්‍රධාන නගරය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ<br>ජාලයේ ආසන්නතම කළාපයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (10 කි.මී. ඇතුළත) | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ<br>ජාලයේ පර්යන්ත කළාපයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ (20 කි.මී. ඇතුළත) |
|---|---|---|---|
| 20 | තිස්සමහාරාමය- කතරගම | කතරගම සහ තිස්සමහාරාමයෙන් කොටසක් | |
| 22 | මඩකලපුව විසල් නාගරිකය | එරාවූර් නගරය, කාත්තාන්කුඩි, මන්මුනෙෙ උතුර, මන්මුනෙෙ දකුණ (අරිට්පට්ටෙෙ) | මන්මුනෙෙ බටහිර, එරාවූර් පත්තු |
| 23 | කල්මුනේ විසල් නාගරිකය | කල්මුනෙෙ මුස්ලිම්, කල්මුනෙෙ දෙමළ, කරෙෙතිවු, මන්මුනෙෙ දකුණ සහ එරුවිල් පත්තු, සයින්තමරතු | නවිතැන්වේලි, පොරටිවුපත්තු |
| 24 | අම්පාර විසල් නාගරිකය | අම්පාර | උහන (කොටසක්) |
| 25 | සමන්තුරේ | නයින්තවූර්, සමන්තුරෙෙ | |
| 26 | අක්කරේපත්තුව | අඩ්ඩලච්චේනෙෙ, අක්කරෙෙපත්තු | |
| 27 | වාලච්චේන | කෝරළෙෙපත්තු(වලාච්), කෝරළෙෙපත්තු බටහිර | කෝරළෙෙපත්තු මධ්‍යම, කෝරළෙෙපත්තු දකුණ |
| 28 | අනෙකුත් ප්‍රදේශ | එරාගම, මන්මුනෙෙ දකුණ | අලයාඩිවෙම්බු, තිරුක්කෝවිල් |
| | | | |
| | **විසල් නාගරික ප්‍රදේශ** | | |
| 29 | මහනුවර | මහනුවර, කුණ්ඩසාලේ, හාරිස්පත්තුව, පාතදුම්බර | උඩුනුවර, යටිනුවර, අකුරණ, පාතහේවාහැට (කොටසක්) |
| 30 | අනුරාධපුරය | නුවරගම්පළාත නැගෙනහිර, මිහින්තලේ සහ නුවරගම්පළාත මධ්‍යම(කොටසක්), නාච්චදූව | රඹේවැව, තලාව, තිරප්පනේ, මිහින්තලේ සහ නුවරගම්පළාත මධ්‍යම (කොටසක්) |
| | **ප්‍රධාන නගර** | | |
| 31 | මහියංගනය | මහියංගනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් සහ මීනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් | |
| 32 | මුලතිව් | වෙරළබඩ පත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | වැලිඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
| 33 | මන්නාරම | මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 34 | නුවරඑළිය | නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් (මහ නගර බල සීමා ප්‍රදේශය ඇතුළුව) | |
| 35 | පොළොන්නරුව | තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් | |
| 36 | පුත්තලම | පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 37 | රත්නපුරය | රත්නපුරය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් සහ ඇලපාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 38 | වව්නියාව | වව්නියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් සහ වව්නියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | |
| 39 | වැල්ලවාය | ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, වැල්ලවාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කොටසක් | |

වගුව 02: යෝජිත ජනගහන ඒකරාශීවීමේ රටාව - 2050

| ජාලය/විසල් නාගරිකය/කලාපය/නගරය | | දළ භූමි ප්‍රමාණය (ව.කි.මි) | වර්තමාන ජනගහනය (2012) | වර්තමාන වාර්ෂික වර්ධන වේගයේ අනුපාතය | අපේක්ෂිත ජනගහනය (2050) | අපේක්ෂිත වාර්ෂික වර්ධන වේගයේ අනුපාතය |
|---|---|---|---|---|---|---|
| | නැගෙනහිර -බටහිර ජාලය | | | | | |
| 1 | කොළඹ විසල් නාගරිකය | 740 | 3,039,917 | 0.5 | 3,500,000 | 0.4 |
| 2 | මීගමුව-කටුනායක විසල් නාගරිකය | 180 | 445,538 | 0.2 | 600,000 | 0.6 |
| 3 | ගම්පහ- වේයන්ගොඩ විසල් නාගරිකය | 230 | 375,998 | 1.7 | 600,000 | 2.0 |
| 4 | කුරුණෑගල විසල් නාගරිකය | 1,163 | 517,271 | 1.4 | 1,000,000 | 2.5 |
| 5 | දඹුල්ල විසල් නාගරිකය | 1,873 | 326,663 | 1.4 | 500,000 | 1.4 |
| 6 | ත්‍රිකුණාමලය විසල් නාගරිකය | 2,595 | 371,882 | 1.7 | 700,000 | 2.3 |
| 7 | කිරිතර- බේරුවල | 149 | 323,732 | 1.3 | 500,000 | 1.4 |
| 8 | පානදුර- හොරණ | 218 | 403,054 | 1.8 | 500,000 | 0.6 |
| 9 | මීරිගම-වරකාපොළ | 390 | 277,163 | 1.1 | 400,000 | 1.2 |
| 10 | පොල්ගහවෙල- අලව්ව | 231 | 128,823 | 1.0 | 200,000 | 1.5 |
| 11 | අනෙකුත් ප්‍රදේශ | 300 | 180,000 | 2.0 | 200,000 | 0.3 |
| | | | **6,390,041** | | **8,700,000** | |
| | උතුරු ජාලය | | | | | |
| 1 | යාපනය විසල් නාගරිකය | 1,152 | 619,000 | | 1,000,000 | 1.6 |
| 2 | පරන්තන් | 250 | 27,170 | | 50,000 | 2.2 |
| 3 | කිලිනොච්චිය | 523 | 71,359 | | 150,000 | 2.9 |
| | | | **717,529** | | **1,200,000** | |
| | දකුණු ජාලය | | | | | |
| 1 | ගාල්ල විසල් නාගරිකය | 141 | 241,305 | 0.6 | 300,000 | 0.6 |
| 2 | මාතර විසල් නාගරිකය | 261 | 282,501 | 0.7 | 400,000 | 1.1 |
| 3 | හම්බන්තොට විසල් නාගරිකය | 749 | 173,309 | 1.8 | 300,000 | 1.9 |
| 4 | ඇඹිලිපිටිය විසල් නාගරිකය | 383 | 133,600 | 1.3 | 200,000 | 1.3 |
| 5 | තංගල්ල- බෙලිඅත්ත | 258 | 128,499 | 1.2 | 200,000 | 1.5 |
| 6 | තිස්සමහාරාමය- කතරගම | 295 | 86,826 | 1.2 | 100,000 | 0.4 |
| 7 | අනෙකුත් ප්‍රදේශ | 134 | 167,264 | 1.3 | 200,000 | 0.5 |
| | | | 1,213,304 | | 1,700,000 | |
| | නැගෙනහිර විසල් නාගරිකය | | | | | |
| 1 | මඩකලපුව විසල් නාගරිකය | 977 | 261,244 | 0.9 | 300,000 | 0.4 |
| 2 | කල්මුනේ විසල් නාගරිකය | 320 | 236,422 | -1.7 | 250,000 | 0.2 |
| 3 | අම්පාර විසල් නාගරිකය | 497 | 75,000 | 0.7 | 150,000 | 2.6 |
| 4 | සමන්තුරේ | 138 | 76,135 | 0.0 | 100,000 | 0.8 |
| 5 | අක්කරේපත්තුව | 62 | 70,959 | 0.0 | 100,000 | 1.1 |
| 6 | වාලච්චේන | 453 | 78,634 | -4.9 | 100,000 | 0.3 |
| 7 | අනෙකුත් ප්‍රදේශ | 574 | 82,397 | -3.3 | 100,000 | 0.6 |
| | | **3021** | **880,791** | | **1,100,000** | |
| | විසල් නාගරික ප්‍රදේශ | | | | | |
| 1 | මහනුවර | 430 | 758,863 | 0.9 | 1,000,000 | 0.8 |
| 2 | අනුරාධපුරය | 1,670 | 311,798 | 1.4 | 500,000 | 1.6 |
| | **ප්‍රධාන නගර** | | | | | |
| 1 | මහියංගනය | 297 | 70,025 | 0.5 | 100,000 | 1.1 |
| 2 | මුලතිව් | 785 | 62,000 | | 100,000 | 1.6 |
| 3 | මන්නාරම | 220 | 68,184 | | 100,000 | 1.2 |
| 4 | නුවර එළිය | 163 | 92695 | 0.2 | 100,000 | 0.2 |
| 5 | පොළොන්නරුව | 229 | 80,448 | 0.6 | 100,000 | 0.6 |

| ජාලය/විසල් නාගරිකය/කලාපය/නගරය | | දළ භූමි ප්‍රමාණය (ව.කි.මී) | වර්තමාන ජනගහනය (2012) | වර්තමාන වාර්ෂික වර්ධන වේගයේ අනුපාතය | අපේක්ෂිත ජනගහනය (2050) | අපේක්ෂිත වාර්ෂික වර්ධන වේගයේ අනුපාතය |
|---|---|---|---|---|---|---|
| | නැගෙනහිර -බටහිර ජාලය | | | | | |
| 6 | පුත්තලම | 182 | 82,443 | 1.6 | 100,000 | 0.6 |
| 7 | රත්නපුරය | 131 | 106,861 | 0.8 | 100,000 | -0.2 |
| 8 | වව්නියාව | 300 | 75,000 | | 100,000 | 0.9 |
| 9 | වැල්ලවාය | 271 | 71,563 | 1.0 | 100,000 | 1.2 |
| | | | | | | |
| 10 | අනෙකුත් නගර | 5918 | 2540736 | 1.3 | 3,000,000 | 0.5 |
| | **එකතුව** | | | | **18,100,000** | **1.0** |

ඇමුණුම 1 ඃ මධ්‍යම අධි සංවේදී ප්‍රදේශ යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ලැයිස්තුව

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | භූමි ප්‍රමාණය(වර්ග කි.මී.) |
|---|---|---|---|---|
| 1 | ඌව | බදුල්ල | බදුල්ල | 49.29 |
| 2 | | | බණ්ඩාරවෙල | 70.06 |
| 3 | | | ඇල්ල | 109.37 |
| 4 | | | හල්දුම්මුල්ල | 415 |
| 5 | | | හාලි ඇල | 170.14 |
| 6 | | | හපුතලේ | 70.33 |
| 7 | | | කන්දකැටිය | 152.62 |
| 8 | | | ලුණුගල | 141.81 |
| 9 | | | මීගහකිවුල | 108.72 |
| 10 | | | පස්සර | 137.28 |
| 11 | | | රිදීමාලියද්ද | 135.92 |
| 12 | | | සොරණාතොට | 438.28 |
| 13 | | | ඌව පරණගම | 80.89 |
| 14 | | | වැලිමඩ | 193.9 |
| 15 | | මොණරාගල | බඩල්කුඹුර | 235.99 |
| 16 | | | බිබිලේ | 483.52 |
| 17 | | | මඩුල්ල | 722.52 |
| 18 | | | මැදගම | 241.14 |
| 19 | | | මොණරාගල | 292.54 |
| 20 | දකුණ | ගාල්ල | නෙළුව | 152.29 |
| 21 | | | තවලම | 174.15 |
| 22 | | මාතර | කොටපොල | 179.33 |
| 23 | | | පස්ගොඩ | 153.94 |
| 24 | | | පිටබැද්දර | 136.56 |
| 25 | බස්නාහිර | කළුතර | පාලින්ද නුවර | 283.23 |
| 26 | මධ්‍යම | මහනුවර | අකුරණ | 30.32 |
| 27 | | | දෙල්තොට | 51.17 |
| 28 | | | දොළුව | 100.17 |
| 29 | | | ගඟ ඉහළ කොරළේ | 88.92 |

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | භූමි ප්‍රමාණය(වර්ග කි.මී.) |
|---|---|---|---|---|
| 30 | | | මහනුවර සතර කඩවත සහගඟවට කෝරළේ | 50.07 |
| 31 | | | හාරිස්පත්තුව | 64.96 |
| 32 | | | හතරලියද්ද | 58.69 |
| 33 | | | කුණ්ඩසාලේ | 80.82 |
| 34 | | | මැදදුම්බර | 190.35 |
| 35 | | | මිණිපේ | 249.28 |
| 36 | | | පන්විල | 91.95 |
| 37 | | | පස්බාගේ කෝරළේ | 121.9 |
| 38 | | | පාතදුම්බර | 48.96 |
| 39 | | | පාතහේවාහැට | 83.5 |
| 40 | | | පූජාපිටිය | 58.34 |
| 41 | | | තුම්පනේ | 49.93 |
| 42 | | | උඩුදුම්බර | 90.6 |
| 43 | | | උඩපළාත | 277.07 |
| 44 | | මාතලේ | උඩුනුවර | 67.23 |
| 45 | | | යටිනුවර | 69.79 |
| 46 | | | අඹන්ගඟ කෝරළය | 55.38 |
| 47 | | | දඹුල්ල | 455.13 |
| 48 | | | ගලේවෙල | 198.6 |
| 49 | | | ලග්ගල - පල්ලේගම | 373.84 |
| 50 | | | මාතලේ | 72.9 |
| 51 | | | නා උල | 285.17 |
| 52 | | | පල්ලේපොල | 81.54 |
| 53 | | | රත්තොට | 105.23 |
| 54 | | | උකුවෙල | 77.91 |
| 55 | | | යටවත්ත | 65.62 |
| 56 | | නුවර එළිය | අඹගමුව | 487.91 |
| 57 | | | හඟුරන්කෙත | 228.62 |
| 58 | | | කොත්මලේ | 223.72 |
| 59 | | | නුවර එළිය | 483.57 |
| 60 | | | වලපනේ | 321.52 |
| 61 | සබරගමුව | කෑගල්ල | අරණායක | 124.42 |
| 62 | | | බුලත්කොහුපිටිය | 127.25 |
| 63 | | | දෙහිඕවිට | 193.24 |
| 64 | | | දැරණියගල | 222.08 |
| 65 | | | ගලිගමුව | 127.5 |
| 66 | | | කෑගල්ල | 109.06 |
| 67 | | | මාවනැල්ල | 114.9 |
| 68 | | | රඹුක්කන | 130.33 |
| 69 | | | යටියන්තොට | 178.07 |
| 70 | | රත්නපුර | අයගම | 157.69 |
| 71 | | | බලන්ගොඩ | 274.16 |
| 72 | | | ඇහැළියගොඩ | 141.93 |
| 73 | | | ඇලපාත | 86.85 |

| | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | භූමි ප්‍රමාණය(වර්ග කි.මී.) |
|---|---|---|---|---|
| 74 | | | ගොඩකවෙල | 155.75 |
| 75 | | | ඉඹුල්පේ | 255.26 |
| 76 | | | කහවත්ත | 102.68 |
| 77 | | | කලවාන | 384.75 |
| 78 | | | කිරිඇල්ල | 79.57 |
| 79 | | | කොළොන්න | 183.03 |
| 80 | | | කුරුවිට | 174.67 |
| 81 | | | නිවිතිගල | 157.91 |
| 82 | | | ඕපනායක | 75.88 |
| 86 | | | පැල්මඩුල්ල | 144.84 |
| 84 | | | රත්නපුර | 326.79 |
| 85 | | | වැලිගෙපොල | 203.53 |
| 86 | වයඹ | කුරුණෑගල | මාවතගම | 109.62 |
| 87 | | | රිදීගම | 222.54 |

ඇමුණුම 2 **:** වෙරළ සංරක්ෂණ කළාපයට අයත් වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සහ අනෙකුත් තොරතුරු ඇතුළත් ලැයිස්තුව

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගණන | ගොඩබිම දෙසට මීටර් 300ට අයත් වන ප්‍රදේශ(වර්ග කිලෝමීටර්) |
|---|---|---|---|
| කොළඹ | කොළඹ | 9 | 2.89 |
| | තිඹිරිගස්යාය | 6 | 2.01 |
| | දෙහිවල - ගල්කිස්ස | 2 | 0.45 |
| | මොරටුව | 15 | 3.18 |
| | රත්මලාන | 4 | 1.49 |
| ගම්පහ | මීගමුව | 27 | 11.03 |
| | වත්තල | 6 | 5.61 |
| | කටාන | 10 | 9.2 |
| කළුතර | පානදුර | 13 | 2.46 |
| | කළුතර | 12 | 3.83 |
| | බේරුවල | 18 | 4.08 |
| ගාල්ල | බෙන්තොට | 10 | 3.24 |
| | බලපිටිය | 13 | 3.99 |
| | හික්කඩුව | 43 | 7.45 |
| | ගාල්ල | 15 | 3.7 |
| | හබරාදූව | 24 | 6.04 |
| | අම්බලන්ගොඩ | 7 | 0.63 |
| මාතර | දෙවිනුවර | 16 | 2.98 |
| | දික්වැල්ල | 17 | 4.22 |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගණන | ගොඩබිම දෙසට මීටර් 300ට අයත් වන ප්‍රදේශ(වර්ග කිලෝමීටර්) |
|---|---|---|---|
| | වැලිගම | 19 | 5.84 |
| | මාතර | 10 | 2.87 |
| හම්බන්තොට | තිස්සමහාරාමය | 3 | 19.22 |
| | හම්බන්තොට | 10 | 10.31 |
| | අම්බලන්තොට | 8 | 3.46 |
| | තංගල්ල | 20 | 9.3 |
| මන්නාරම | මන්තෛ බටහිර | 11 | 11.95 |
| | මන්නාරම | 31 | 28.63 |
| | නනාද්දන් | 7 | 6.94 |
| | මුසලි | 6 | 8.98 |
| පුත්තලම | වනාතවිල්ලු | 9 | 20.75 |
| | කල්පිටිය | 32 | 45.86 |
| | පුත්තලම | 11 | 6.47 |
| | මුන්දල | 11 | 7.35 |
| | ආරච්චිකට්ටුව | 6 | 4.3 |
| | හලාවත | 8 | 2.92 |
| | මහවැව | 10 | 3.77 |
| | නාත්තණ්ඩිය | 6 | 1.75 |
| | වෙන්නප්පුව | 10 | 2.9 |
| යාපනය | පේදුරුතුඩුව | 17 | 6.16 |
| | කෝප්පායි | 11 | 11.07 |
| | තෙල්ලිප්පලයි | 7 | 3.95 |
| | චන්කනයි | 9 | 5.97 |
| | මරුතන්නර්නි | 16 | 33.85 |
| | චාවකච්චේරි | 22 | 23.72 |
| | නල්ලූර් | 15 | 6.17 |
| | කයිට්ස් | 20 | 16.88 |
| | වේලනයි | 38 | 35.18 |
| | සන්දිලිපෙ | 8 | 3.21 |
| | ඩෙල්ෆ්ට් | 6 | 33.21 |
| කිලිනොච්චි | පච්චිලෛපපලෛ | 3 | 14.53 |
| | පුනරින් | 7 | 45.35 |
| | කන්දවලෛ | 5 | 15.49 |
| මුලතිවු | මැරිටයිම් පත්තු | 5 | 29.88 |
| අම්පාර | කන්මුණෛ | 28 | 2.16 |
| | කරෛතිවු | 5 | 0.89 |
| | නෛනතිවු | 10 | 2.19 |
| | අට්ටලචේන | 9 | 2.01 |
| | අක්කරෛපත්තු | 6 | 1.09 |
| | අලයාඩිවෙම්බු | 1 | 0.67 |
| | තිරුක්කෝවිල් | 11 | 5.3 |
| | පොතුවිල් | 20 | 8.68 |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ | ග්‍රාම නිලධාරී කොට්ඨාශ ගණන | ගොඩබිම දෙසට මීටර් 300ට අයත් වන ප්‍රදේශ(වර්ග කිලෝමීටර්) |
|---|---|---|---|
| | ලාහුගල | 5 | 18.1 |
| | සයින්තමරුතු | 8 | 0.36 |
| මඩකළපුව | කෝරලෙ පත්තු උතුර | 18 | 31.18 |
| | කෝරලෙ පත්තු | 7 | 5.22 |
| | එරාවූර් පත්තු | 22 | 7.21 |
| | මන්මුනෙ උතුර | 25 | 13.63 |
| | කාත්තාන්කුඩි | 8 | 1.23 |
| | මන්මුනෙ පත්තු | 18 | 6.51 |
| | ඔන්මුනෙ දකුණ සහ එරවිල් | 49 | 14.91 |
| ත්‍රිකුණාමලය | ත්‍රිකුණාමලය නගරය සහග්‍රැවට්ස් | 22 | 22.33 |
| | තම්පලගමුව | 2 | 1.47 |
| | මුතූර් | 10 | 13.24 |
| | කින්නියා | 9 | 4.58 |
| | ත්වරුගල් එච්චලම් පත්තු | 3 | 8.35 |
| | කුච්චවේලි | 21 | 38.18 |

ශ්‍රී ලංකාවේ වෙරළ කළාපය, ගොඩබිම දෙසට මධ්‍ය උච්ච ජල රේඛාවේ සිට මීටර් 300 ක සීමාවකින් යුතු ප්‍රදේශය සහ මුහුදට ගලා යන ස්ථිර හෝ කලින්කල ගංගා, ඇලවල්, කලපු හෝ වෙනත් ජල මූලාශ්‍ර හෝ ස්ථිර හෝ කලින්කල ගොඩබිම් සීමාව කිලෝමීටර් 2ක සීමාවෙන් යුතුව විශාල කළ කොටස ලෙස වෙරළ සංරක්ෂණ පනත මගින් නිර්වචනය කොට ඇත.

ඇමුණුම 3 : වී වගාව සඳහා වඩාත් වැදගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මුළු භූමියෙන් ප්‍රතිශතයක් ලෙස

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වී භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| අම්පාර | අම්පාර | 20 |
| මැදවච්චිය | අනුරාධපුරය | 20 |
| වත්තල | ගම්පහ | 20 |
| මහර | ගම්පහ | 20 |
| කෝපායි | යාපනය | 20 |
| බේරුවල | කළුතර | 20 |
| මිනිපේ | මහනුවර | 20 |
| අඹන්පොල | කුරුණෑගල | 20 |
| ගනේවත්ත | කුරුණෑගල | 20 |
| වාරියපොල | කුරුණෑගල | 20 |
| ඍකාබෙයිගනේ | කුරුණෑගල | 20 |
| වීරඹුගෙදර | කුරුණෑගල | 20 |
| කැකිරාව | අනුරාධපුරය | 21 |
| අම්බලන්ගොඩ | ගාල්ල | 21 |
| කැළණිය | ගම්පහ | 21 |
| කටුපොත | කුරුණෑගල | 21 |
| ඕාරුටයිම් පත්තු | මුලතිවු | 21 |
| දෙහිඅත්තකණ්ඩිය | අම්පාර | 22 |
| කහටගස්දිගිලිය | අනුරාධපුරය | 22 |
| වැලිවිටිය - දිවිතුර | ගාල්ල | 22 |
| ජා ඇල | ගම්පහ | 22 |
| වේලනෙෙ | යාපනය | 22 |
| කරච්චි | කිලිනොච්චි | 22 |
| ගල්ගමුව | කුරුණෑගල | 22 |
| මාස්පොත | කුරුණෑගල | 22 |
| කඹුරුපිටිය | මාතර | 22 |
| කල්මුනෙෙ | අම්පාර | 23 |
| පලාගල | අනුරාධපුරය | 23 |
| ගිරිබාව | කුරුණෑගල | 23 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වී භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| පොල්පිතිගම | කුරුණෑගල | 23 |
| ඉබ්බාගමුව | කුරුණෑගල | 23 |
| පොල්ගහවෙල | කුරුණෑගල | 23 |
| මාතර | මාතර | 23 |
| හෝමාගම | කොළඹ | 24 |
| කයිට්ස් | යාපනය | 24 |
| චාවකච්චේරි | යාපනය | 24 |
| මතුගම | කළුතර | 24 |
| මහව | කුරුණෑගල | 24 |
| පඬුවස්නුවර | කුරුණෑගල | 24 |
| වැලිගම | මාතර | 24 |
| බද්දේගම | ගාල්ල | 27 |
| බෝපේ පෝද්දල | ගාල්ල | 27 |
| කරවෙඩ්ඩි | යාපනය | 27 |
| වේලනෙෙ | යාපනය | 27 |
| රඹෑව | අනුරාධපුරය | 28 |
| කයිට්ස් | යාපනය | 28 |
| මාඩම්බඩ | මාතර | 28 |
| එරාවූර්පත්තු | මඩකළපුව | 29 |
| ගම්පහ | ගම්පහ | 29 |
| කළුතර | කළුතර | 29 |
| නිකවැරටිය | කුරුණෑගල | 29 |
| කින්නියා | ත්‍රිකුණාමලය | 29 |
| චන්තනනෙෙ | යාපනය | 30 |
| කයිට්ස් | යාපනය | 30 |
| අම්බලන්තොට | හම්බන්තොට | 31 |
| මිල්ලනිය | කළුතර | 31 |
| වව්නියාව දකුණ | වව්නියාව | 31 |
| ගල්නෑව | අනුරාධපුරය | 32 |

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වී භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කෝරලෙෙ පත්තු බටහිර | මඩකළපුව | 32 |
| බෙන්තොට | ගාල්ල | 33 |
| වේලනෙ | යාපනය | 33 |
| මුත්තූර් | ත්‍රිකුණාමලය | 33 |
| නාච්චදූව | අනුරාධපුරය | 35 |
| නානද්දාන් | මන්නාරම | 35 |
| පදවි ශ්‍රීපුර | ත්‍රිකුණාමලය | 36 |
| අගුණකොළපැලැස්ස | හම්බන්තොට | 37 |
| මැරිටයිම් පත්තු | මුලතිවු | 37 |
| මැරිටයිම් පත්තු | මුලතිවු | 38 |
| තලාව | අනුරාධපුරය | 39 |
| මන්මුනෙෙ බටහිර | මඩකළපුව | 41 |
| කරවෙඩ්ඩි | යාපනය | 41 |
| රාජාංගනය | අනුරාධපුරය | 45 |
| අක්කරෛපත්තු | අම්පාර | 46 |
| මන්නාරම | මන්නාරම | 48 |
| තිහගොඩ | මාතර | 48 |
| කන්දවෙලායි | කිලිනොච්චි | 49 |
| මන්මුනෙෙ නිරිත | මඩකළපුව | 51 |
| අට්ටලචේන | අම්පාර | 54 |
| තඹුත්තේගම | අනුරාධපුරය | 54 |
| සමන්තුරෙෙ | අම්පාර | 64 |
| කැස්බෑව | කොළඹ | 25 |
| සන්දිල්ප්පායි | යාපනය | 25 |
| ඇහැටුවැව | කුරුණෑගල | 25 |
| තිරුක්කෝවිල් | අම්පාර | 26 |
| ගලෙන්බිදුණුවැව | අනුරාධපුරය | 26 |
| බණ්ඩාරවෙල | කළුතර | 26 |
| ලංකාපුර | පොළොන්නරුව | 26 |
| ඉපලෝගම | අනුරාධපුරය | 27 |
| කරෛතිවු | අම්පාර | 64 |
| අලයාදිවෙම්බු | අම්පාර | 66 |
| පොරතිවු පත්තු | මඩකළපුව | 69 |
| මැරිටයිම් පත්තු | මුලතිවු | 72 |
| නයිනතිවු | අම්පාර | 73 |
| මන්මුනෙෙ උතුර | මඩකළපුව | 78 |
| කරවෙඩ්ඩි | යාපනය | 96 |

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වී භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| යක්කලමුල්ල | ගාල්ල | 17 |
| යටවත්ත | මාතලේ | 17 |
| වැලිවිටිය - දිවිතුර | ගාල්ල | 18 |
| අරණායක | කෑගල්ල | 20 |
| බේරුවල | කළුතර | 22 |
| අඹන්ගිග | මාතලේ | 23 |
| අයගම | රත්නපුර | 24 |
| පැල්මඩුල්ල | රත්නපුර | 24 |
| නාගොඩ | ගාල්ල | 25 |
| මාතලේ | මාතලේ | 27 |
| ඇල්පිටිය | ගාල්ල | 28 |
| වලල්ලවිට | කළුතර | 28 |
| නිවිතිගල | රත්නපුර | 28 |
| මාවනැල්ල | කෑගල්ල | 29 |
| අගලවත්ත | කළුතර | 30 |
| තුම්පනේ | මහනුවර | 30 |
| හොරණ | කළුතර | 31 |
| කෑගල්ල | කෑගල්ල | 31 |
| වරකාපොළ | කෑගල්ල | 35 |
| බුලත්සිංහල | කළුතර | 37 |
| මදුරවෙල | කළුතර | 37 |
| ගලිගමුව | කෑගල්ල | 40 |
| බණ්ඩාරගම | කළුතර | 42 |
| ඇලපාත | රත්නපුර | 42 |
| යටියන්තොට | කෑගල්ල | 43 |
| කිරිඇල්ල | රත්නපුර | 43 |
| කුරුවිට | රත්නපුර | 44 |
| මතුගම | කළුතර | 45 |
| බුලත්කොහුපිටිය | කෑගල්ල | 45 |
| පාලින්ද නුවර | කළුතර | 46 |
| දැරණියගල | කෑගල්ල | 49 |
| දොඩංගොඩ | කළුතර | 54 |
| පාදුක්ක | කොළඹ | 55 |
| හංවැල්ල | කොළඹ | 56 |
| රුවන්වැල්ල | කෑගල්ල | 58 |
| ඇහැළියගොඩ | රත්නපුර | 60 |
| දෙහිඕවිට | කෑගල්ල | 72 |

ඇමුණුම 3 : රබර් වගාව සඳහා වඩාත් සුදුසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල භූමි ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | වී භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| මිල්ලනිය | කළුතර | 16 |
| මාවතගම | කුරුණෑගල | 16 |
| මාලිම්බඩ | මාතර | 16 |
| හෝමාගම | කොළඹ | 17 |

ඇමුණුම 3 : තේ වගාව සඳහා වඩාත් සුදුසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල භූමි ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | තේ භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| අක්මීමන | ගාල්ල | 10 |
| උඩදුම්බර | මහනුවර | 10 |
| අකුරණ | මහනුවර | 10 |
| ඉඹුල්පේ | රත්නපුර | 10 |
| ගොඩකවෙල | රත්නපුර | 11 |
| බුලත්කොහුපිටිය | කෑගල්ල | 12 |
| අතුරලිය | මාතර | 12 |
| බද්දේගම | ගාල්ල | 13 |
| පැල්මඩුල්ල | රත්නපුර | 13 |
| වැලිමඩ | බදුල්ල | 14 |
| පූජාපිටිය | මහනුවර | 14 |
| මුලටියන | මාතර | 16 |
| අඹන්ගඟ | මාතලේ | 18 |
| පස්ගොඩ | මාතර | 18 |
| හඟුරන්කෙත | නුවරඑළිය | 19 |
| තවලම | ගාල්ල | 20 |
| සොරණාතොට | බදුල්ල | 21 |
| පාතහේවාහැට | මහනුවර | 22 |
| උඩුනුවර | මහනුවර | 22 |
| ඌව පරණගම | බදුල්ල | 23 |
| මැදදුම්බර | මහනුවර | 23 |
| යටිනුවර | මහනුවර | 23 |
| වලපනේ | නුවරඑළිය | 23 |
| කහවත්ත | රත්නපුර | 23 |
| කොටපොල | මාතර | 25 |
| පස්සර | බදුල්ල | 27 |

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | තේ භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| උකුවෙල | මාතලේ | 29 |
| පිටබැද්දර | මාතලේ | 30 |
| රත්තොට | මාතලේ | 32 |
| ඇල්ල | බදුල්ල | 37 |
| බණ්ඩාරවෙල | බදුල්ල | 37 |
| නුවරඑළිය | නුවරඑළිය | 40 |
| පස්බාගේකෝරළය | මහනුවර | 41 |
| බදුල්ල | බදුල්ල | 43 |
| හාලිඇල | බදුල්ල | 44 |
| හපුතලේ | බදුල්ල | 45 |
| අඹගමුවකෝරළේ | නුවරඑළිය | 46 |
| ගඟඉහළ කෝරළේ | මහනුවර | 47 |
| කොත්මලේ | නුවරඑළිය | 48 |
| දොලුව | මහනුවර | 52 |
| උඩපලාත | මහනුවර | 54 |
| පන්විල | මහනුවර | 61 |
| දෙල්තොට | මහනුවර | 65 |

ඇමුණුම 3 ඃ පොල් වගාව සඳහා වඩාත් සුදුසු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල භූමි ප්‍රමාණයන් ප්‍රතිශතයක් ලෙස

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | දිස්ත්‍රික්කය | පොල් භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කැළණිය | ගම්පහ | 10 |
| පානදුර | කළුතර | 10 |
| වෙරගල්ව්ච්චලම් පත්තු | ත්‍රිකුණාමලය | 10 |
| මන්මුනෙ උතුර | මඩකලපුව | 11 |
| හෝමාගම | කොළඹ | 11 |
| කෑගල්ල | කෑගල්ල | 11 |
| නිකවැරටිය | කුරුණෑගල | 12 |
| ගොඩකවෙල | රත්නපුර | 12 |
| ජා ඇල | ගම්පහ | 13 |
| මහර | ගම්පහ | 14 |
| ගලිගමුව | කෑගල්ල | 14 |
| මාතර | මාතර | 14 |
| බෙන්තොට | ගාල්ල | 15 |
| මහව | කුරුණෑගල | 15 |
| වරකාපොළ | කෑගල්ල | 16 |
| හබරාදූව | ගාල්ල | 17 |
| මිනුවන්ගොඩ | ගම්පහ | 17 |
| වත්තල | ගම්පහ | 17 |
| කිරින්ද - පුහුල්වෙල් | මාතර | 17 |
| බෙපේ පෝද්දල | ගාල්ල | 18 |
| පල්ලේපොල | මාතලේ | 18 |
| රස්නායකපුර | කුරුණෑගල | 20 |
| දෙවිනුවර | මාතර | 20 |
| කාත්තාන්කුඩි | මඩකලපුව | 22 |
| හික්කඩුව | ගාල්ල | 22 |
| කටුවන | හම්බන්තොට | 22 |
| කළුතර | කළුතර | 22 |
| තංගල්ල | හම්බන්තොට | 23 |
| ගාල්ල | ගාල්ල | 26 |
| දොම්පේ | ගම්පහ | 26 |
| වැලිගම | මාතර | 26 |
| පච්චිලෙපලෙ | කිලිනොච්චි | 27 |
| අත්තනගල්ල | ගම්පහ | 28 |
| වීරකැටිය | හම්බන්තොට | 28 |
| බියගම | ගම්පහ | 29 |
| බේරුවල | කළුතර | 32 |
| කල්පිටිය | පුත්තලම | 33 |
| පුත්තලම | පුත්තලම | 33 |
| ඔකේවෙල | හම්බන්තොට | 34 |
| මීරිගම | ගම්පහ | 36 |

| ප්‍රාදේශීය ලේකම් | දිස්ත්‍රික්කය කොට්ඨාශය | පොල් භූමි ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| කල්පිටිය | පුත්තලම | 37 |
| මුන්දල | පුත්තලම | 37 |
| ඉබ්බාගමුව | කුරුණෑගල | 38 |
| පල්ලම | පුත්තලම | 39 |
| දික්වැල්ල | මාතර | 41 |
| රිදීගම | කුරුණෑගල | 42 |
| පොල්ගහවෙල | කුරුණෑගල | 43 |
| ගනේවත්ත | කුරුණෑගල | 47 |
| මාවතගම | කුරුණෑගල | 47 |
| රඹුක්කන | කෑගල්ල | 50 |
| කුරුණෑගල | කුරුණෑගල | 50 |
| ආරච්චිකට්ටුව | පුත්තලම | 50 |
| හලාවත | පුත්තලම | 50 |
| මීගමුව | ගම්පහ | 51 |
| කොබෙයිගනේ | කුරුණෑගල | 51 |
| වෙන්නප්පුව | පුත්තලම | 52 |
| මහවැව | පුත්තලම | 54 |
| අලව්ව | කුරුණෑගල | 55 |
| මාස්පොත | කුරුණෑගල | 58 |
| නාත්තණ්ඩිය | පුත්තලම | 59 |
| වාරියපොල | කුරුණෑගල | 60 |
| පිඩුවස්නුවර | කුරුණෑගල | 60 |
| පන්නල | කුරුණෑගල | 61 |
| දිවුලපිටිය | ගම්පහ | 62 |
| කටාන | ගම්පහ | 62 |
| කටුපොත | කුරුණෑගල | 62 |
| මල්ලවපිටිය | කුරුණෑගල | 63 |
| බෙලිඅත්ත | හම්බන්තොට | 65 |
| බිංගිරිය | කුරුණෑගල | 65 |
| නාරම්මල | කුරුණෑගල | 66 |
| දංකොටුව | පුත්තලම | 66 |
| මීගමුව | ගම්පහ | 67 |
| වීරඹුගෙදර | කුරුණෑගල | 67 |
| මුන්දල | පුත්තලම | 67 |
| කුලියාපිටිය නැගෙනහිර | කුරුණෑගල | 68 |
| මාදම්පේ | පුත්තලම | 68 |
| කුලියාපිටිය බටහිර | කුරුණෑගල | 69 |
| උඩුබද්දාව | කුරුණෑගල | 77 |
| කයිට්ස් | යාපනය | 88 |
| කොරලෙ පත්තු උතුර | මඩකළපුව | 92 |

**ඇමුණුම 4 : කෘෂි සංරක්ෂණ කලාපවලට අදාළ ප්‍රඥප්තීන්**

බීජ පනත 2003 හි අංක 22

පැළ ආරක්ෂණ පනත, 1999 හි අංක 35

පස සංරක්ෂණ පනත, 1951 හි අංක 25

බීජ පනත
පස සංරක්ෂණ පනත, 1996 හි අංක 24

කෘමිනාශක ද්‍රව්‍ය පාලනය කිරීමේ පනත (සංශෝධන) පනත, 1994 හි අංක. 6

**ඇමුණුම 5 : ජල සංරක්ෂණ කලාපය යටතේ පවතින දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ**

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව |
|---|---|
| අම්පාර | 12 |
| අනුරාධපුර | 22 |
| බදුල්ල | 14 |
| මඩකලපුව | 07 |
| කොළඹ | 07 |
| ගාල්ල | 17 |
| ගම්පහ | 13 |
| හම්බන්තොට | 11 |
| යාපනය | 04 |
| කළුතර | 12 |
| මහනුවර | 19 |
| කෑගල්ල | 11 |
| කිළිනොච්චිය | 04 |
| කුරුණෑගල | 29 |
| මන්නාරම | 06 |
| මාතලේ | 11 |
| මාතර | 14 |
| මොණරාගල | 11 |
| මුලතිවු | 07 |
| නුවරඑළිය | 05 |
| පොලොන්නරුව | 07 |
| පුත්තලම | 15 |
| රත්නපුර | 17 |
| ත්‍රිකුණාමලය | 11 |
| වවුනියාව | 07 |

**ඇමුණුම 6 : ජල සංරක්ෂණ කළාපවලට අදාළ ප්‍රඥප්තීන් රාජ්‍ය ඉඩම් ආඥා පනත**

ඉඩම් සංවර්ධන ආඥා පනත
වාරිමාර්ග ආඥා පනත
ගොවිජන සංවර්ධන පනත
ජල සම්පත් සංවර්ධන පනත
කැළෑ ආඥාපනත
වනජීවි සංරක්ෂණ පනත
ජාතික ජල සම්පාදන සහ ජලාපවාහන මණ්ඩල පනත
පස සංරත්ෂණ පනත
ආපදා කළමණාකරණ පනත
වෙරළ සංරක්ෂණ පනත
නාගරික සංවර්ධන අධිකාරී පනත
ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය
තේ/ රබර්/ පොල් වගාවන්ට අදාළ පනත්
මහවැලි අධිකාරී පනත

**ඇමුණුම 7 : ජෛව සංරක්ෂණ කලාපයට අදාළ ප්‍රතිපත්ති**

**වන**
ජාතික වන විද්‍යා පනත - 1995
**වන ජීවී**
වන ජීවී සංරක්ෂණ ජාතික ප්‍රතිපත්තිය - 2000
අලි ඇතුන් සංරක්ෂණ ජාතික ප්‍රතිපත්තිය - 2006
**ජෛව විවිධත්ව**
ජාතික ජෛව විවිධත්ව උපක්‍රමික ක්‍රියාමාර්ග සැලසුම 2016 - 2022
**ධීවර**
ජාතික ධීවර සහ ජලජ සම්පත් ප්‍රතිපත්තිය (2006)
වෙරළ කළාප සහ වෙරළ සම්පත් කළමණාකරන සැළසුම් - 2016
**වායු සම්පත්**
ජාතික වායු ගුණාත්මක කළමණාකරණ ප්‍රතිපත්තිය - 2000
**පාරිසරික**
ජාතික පාරිසරික ප්‍රතිපත්තිය - 2003
තෙත් බිම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය - 2005
**ඛනිජමය**
ඉදිකිරීම් කර්මාන්තයේ දී වැලි සම්පතක් ලෙස සැලකීමේ ජාතික ප්‍රතිපත්තිය - 2006
ඛනිජ සම්පත් පිළිබඳ දළ ජාතික ප්‍රතිපත්තිය - 2017

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.